
අපේ ජනකතා

# නගුල් මුන්නා

සහ තවත් කතා



ජ්. පී. ගුණරත්න

PDF E-Book design by
Hasitha Madhawa Gajadeeraarachchi
Email :hasithaga@yahoo.com
Website : http://hasitha.zapto.org

පළමුවැනි මුද්‍රණය 1950
දෙවැනි මුද්‍රණය 1963
තුන්වැනි මුද්‍රණය 1985

සියලුම හිමිකම් ඇවිරිණි.

මුද්‍රණය:
සමයවර්ධන
63, මාලිගාකන්ද පාර,
මරදාන - කොළඹ 10.

## සංඥාපනය

ඈත අතීතයක නොව අප කුඩා කාලයේ පවා අපේ ගෙවල කටන්දර කීමේ සිරිත පැවතිණ. රෑට බත් කා පැදුරට ගිය ළමයින් අම්මාගෙන් හෝ අනික් වැඩිහිටිය-කුගෙන් හෝ කටන්දරයක් නාහා නිදාගන්නා සිරිතක් ඒ කාලයේ නොවීය. එකල මේ කටන්දර කීමේ වඩා ප්‍රසිද්ධ ඇත්තෝ ද සිටියහ. හොඳ කටන්දර කීමට දන්නා අත්තම්මා කෙනකු හෝ නැන්ද කෙනකු හෝ එක රැය-කටවත් ගෙදර රඳවා ගන්ට ලැබුණොත් ළමයින්ට ඊට වඩා දෙයක් තවත් තිබුණේ නැත. කටන්දර ඇසීම ළමයින්ගේ සාහිත්‍ය දැනීම දියුණුවීමේ හා සිරිත් විරිත් පුරුදුව ලැබීමේ එක් මගක් ව තිබිණ. අපේ ජනකතා නමින් මා මේ ඉදිරිපත් කරන්නේ අපේ ඒ කටන්දර ය.

කටන්දර කීම දිනපතා ම වාගේ පැවතුණු සිරිතක් වුවද දවසේ වැඩපල පාළු වෙන සේ දවසේ කටන්දර කීමක් හෝ ගෙදර දොරේ වැඩට බාධාවන සේ පාන තියෙද්දී කටන්දර කීමක් හෝ කොතැනකවත් නොපැවතිණ. "දවල් කටන්දර ඇහුවාම නැන්දලා ගෙදර යන්ට පාර හොයාගන්ට බැරි වෙනවා" යනුවෙන් අපේ අත්තම්-මලා අපට කියා තිබිණ. මෙය පළල් අදහසක් ගැබ් වී තිබෙන කතාවකි.

සිනාකතා, විනෝදකතා, උපදේශකතා, උපහාසකතා, බණ කතා ආදී විවිධ කථාවන් ඇතුළත්වන අපේ මේ ජන-කතාවලත් අපේ සිරිත් විරිත්වල හා අපේ ඉතිහාසයෙත් දැඩි සම්බන්ධකමක් තිබේ. එසේම මේ ජනකතා අපේ වටිනා ජාතික පුරා වස්තුවකි.

ඒ එසේ වුවත් අපේ වර්තමාන ගැමි පැවතුම් අනුව සටන්දර කීමෙත් ඇසීමෙත් ඇබ්බැහිය දැන් බොහෝ දුරට අප අතරෙන් අත්හැරී ගොස් තිබේ. තව කලක් යන විට මේ ජීවිත වන්නි පළාත්වලින් පවා නැතිවී යන්ට ඉඩ තිබේ. එහෙයින් මේ කතා හැකි තරමින් එකතු කොට මුද්‍රණය කරවීමට මම අදහස් කොළෙමි. ගැමියාට අයිති ගැමි කතාවේ ගැමිනුරුවන් සටන්දර කීමේ ගැමි ආරත් රැකගෙන මේ කථා මෙසේ ලිවීමට මා අදහස් කෙළෙමි.

මේ කතා ලිවීමේදී එච්. පාකර් මහතාගේ ජනකතා පොත ආශ්‍රය කළ බව කෘතඥතා පූර්වක ව සඳහන් කරමි.

ඒ. පී. ගුණරත්න

## පටුන


| | | |
|---|---|---|
| ✓රජ වුණ එළඬේර කොලුවා | ... ... | 9 |
| වෙදරාළ | ... ... | 14 |
| කුමපලා ගහ | ... ... | 23 |
| සැත්කර හොරයා | ... ... | 27 |
| කුකුළන් දෙන්නා | ... ... | 34 |
| නාග කුමාරයා | ... ... | 39 |
| අකුරට නොගිය කුමාරයා | ... ... | 45 |
| පුළුන් ගෙරාද | ... ... | 52 |
| කුමාරයා සහ යකා | ... ... | 56 |
| එමල් මිගෙල් | ... ... | 68 |
| මානෙල් මල | ... ... | 74 |
| ලොකු අප්පු | ... ... | 84 |
| බ්‍රාහ්මණ කුමාරි | ... ... | 91 |
| සිංහපුරු දසාව | ... ... | 103 |
| කොබෙයි මස | ... ... | 107 |
| කුමාරියෝ හත් දෙනා | ... ... | 122 |
| රන් ගස, රිදී මල, රිදී කුකුළා | ... | 132 |
| අනුන් හගන්ට යන්නකොට තමන් ම හැපෙනවා | | 140 |
| දියුණුවට යන බෑණා | ... ... | 147 |
| මී පැටියන් | ... ... | 152 |
| නගුල් මුන්නා | ... ... | 156 |
| සිහිරිස් සිංඤෝ | ... ... | 162 |

# රජවුණ එඬේර කොලුවා

එකමත් එක රටක එක මිනිහෙක් වෙන රටකට ආවා. මේ මිනිහා මේ රටේ අගනුවර වීදියක් දිගේ ඇවිදගෙන යන කොට හමු වුණා ඒ රටේ තලකුනා මිනිහකු ඉතින් අර නොරටින් ආ මිනිහා මේ තලකුනා මිනිහාට කතා කර ඇහුවා "කොහොමද මේ රටේ රජ්ජුරුවො රාජ්ජෙ කරන්නෙ?" කියලා. එතකොට තලකුනා මිනිහ කීවා "නෑ ඉතින් එහෙමටම වරදක් කියන්ට, හොඳින් රාජ්ජෙ කරනවා" කියලා.

එකෙතදී අර නොරට මිනිහා ඇහුවා හොඳයි මේ රටේ රජ්ජුරුවො දන්නවා ද මෙන්න මේ කියන ප්‍රශ්න තුනකට උත්තර? මොනවාද, "මේ රටේ හරි මැද්ද තැන; මේ රටට පේන ආකාසෙ තියන තාරුකා ගණන; දිව්‍යලෝකෙ ඉන්න දිව්‍යරාජයා කරන්නෙ මොකක් ද කියන එක" මේ කතාව මෙහෙම කියල අර මිනිහා නුවර වීදි මැදින් ඇවිදගෙන යන්ට ගියා.

ඉතින් මේ ප්‍රශ්න තුනේ කතාව කටින් කට ගිහින් ඔන්න එක මිනිහෙක් ගිහින් රජ්ජුරුවන්ට මේ වග සැල කලා. "මෙන්න මෙහෙම නොරටක මිනිහෙක් ඇවිදින් මේ නුවර වීදිවලදී මිනිසුන්ගෙන් ඇහුවා රටේ රජ්ජුරුවො මේ ප්‍රශ්න තුනට උත්තර දන්නවා ද කියලා."

ඉතින් රජ්ජුරුවො ඇහුවා මොනවා ද ඒ ප්‍රශ්න තුන කියලා. ඒ පාර අර මිනිහා කීවා ප්‍රශ්න තුන.

ඊට පස්සෙ රජ්ජුරුවො ඉඳගෙන කල්පනා කළා කළා මේකට උත්තර. ඒත් කල්පනා කරගන්ට බැරි වුණා. ඉතින් ඒ පාර රජ්ජුරුවො මහ නිලමේලා වාසලට ගෙන්නලා ඇහුවා මේ ප්‍රශ්න තුනට උත්තර. මහ නිලමේලා කිව්වා මේ ප්‍රශ්නවලට උත්තර කියන්ට පුළුවන් කමක් නැ කියලා. ඒ ගමන රජ්ජුරුවො රාජාඥ කළා මේ ප්‍රශ්නවලට උත්තර දෙන්ට බැරි නිලමේලා තියාගෙන වැඩක් නැ, ඔක්කොම දෙනාගේ ම ඉස් ගහ දමන්ට ය කියලා. රාජාඥව වදකයො ඉෂ්ට කළා.

ඊට පස්සෙ මේ රජ්ජුරුවො ආඥ කළා ඔක්කොම අදිකාරම්ලාවත් වාසලට එන්ට කියා. ඒ ආවාමත් රජ්ජුරුවො ඒ ඇත්තන්ගෙනුත් අර ප්‍රශ්න තුන ඇහුවා. ඒ ඇත්තන්ටත් උත්තර කියාගන්ට බැරි උණාම රාජාඥ කළා ඉස ගහ දමන්ට ය කියලා. ඊළඟට රජ්ජුරුවො අණ කළා පුරෝහිත ඇමැත්තයන්ට වාසලට එන්ට කියලා. පුරෝහිත ඇමැත්තයන් ආවාමත් රජ්ජුරුවො මේ ප්‍රශ්න තුන ඇහුවා.

පුරෝහිත ඇමැත්තයා එන පාරට ම මෙන්න බැරි වැඩක් කියා හිතේ නැතුව රජ්ජුරුවන්ට කිව්වා "දේවයන් වහන්ස, මේක අමාරු ප්‍රශ්නයක් නිසා දවසකට කල් දෙනොත් මට කියන්නම්" කියලා. එහෙම කියා අවසර අරගෙන පුරෝහිත ඇමැත්තයා ගෙදර ගියා. ගිහින් කල්පනා කළා කළා මේකට උත්තරයක් හිතා ගන්ට බැහැ. ඉතින් පුරෝහිත ඇමැත්තයාත් බොහොම කනස්සල්ලෙන් කවුරුත් එක්කවත් කතාවක් බහක් නැතුව වැතිර ගෙන හිටියා.



ඔය පුරෝහිත ඇමැත්තයන්ට හිටියා එළ පැටිය බලාගන්න කොල්ලෙක්. මේ කොල්ලා කීපවරක් ම එහාට මෙහාට යන ගමන් බැලුවා පුරෝහිත ඇමැත්තය ඉන්නෙ බොහොම බර කල්පනාවකින්. ඉතින් කොල්ලා ගෙයින්- ඇඳේ ළංවෙලා ඇහුවා "හාමුදුරුවනේ, මෙච්චර ලොකු කල්පනාවකින් මොකද මේ?" කියලා.

එතකොට අමාත්‍යයො කොල්ලුවට කිව්වා "කොල්ලුවො වස වැඩක් වෙලා බොල; අපේ රජ්ජුරුවො මෙහෙම ප්‍රශ්න තුනක් අහලා උත්තර නොදුන්න නිසා මහ නිලමේලා අදිකාරම්ලා ඉස ගහ දැමුවා. දන් හෙට මගේ ඉස ගහ දමනවා. ඒකයි මං මේ කල්පනා කළේ" කියලා.

"ඉතින් මොනවද හාමුදුරුවනේ ඔය ප්‍රශ්න" කියලා කොල්ලුවා ඇමැත්තයන් අතින් ඇහුවා.

එතකොට ඇමැත්තයා කිව්වා "හෙට මම රජ්ජුරුවන්ට නොකීවොත් මේ රටේ හරි මැද තියන තැනක්, මේ අහසෙ පේන්ට තියන තාරුකාවන්ගෙ ගණනත්, දිව්‍යලෝකෙ දිව්‍ය රාජයා කරන්නෙ මොකද්ද කියන එකත්, කිසි ම පමාවක් නැතිව රජ්ජුරුවො රාජාඥ කරනවා මගේ ඉස ගහ දමන්ට" කියලා.

"අනේ, හාමුදුරුවනේ ඔකත් ඔච්චර කල්පනා කර කර ඉන්ට දෙයක් දැ? මං කියන්නම්කො ඔය ප්‍රශ්න තුනට ම හරි උත්තර, හෙට උදේ වාසලට යනකොට මා එක්කර ගෙන ගියාම ඉවරයි නේ" කියලා මේ කොල්ලුවා උත්තර දුන්නා.

ඉතින් පුරෝහිත ඇමැත්තයොත් උඹේ රජ වාසලට යන්ට සූදානම් වෙලා කොලුවටත් අඬ ගහලා එහෙ එක්ක ගියා. ගියාම රජ්ජුරුවෝ ඇහුවා ප්‍රශ්න තුනට උත්තර දැනගෙන ආව ද කියලා. පුරෝහිත ඇමැත්තයෙ ඒ ගමන කීවා "ඕක ආයෙ මං කියන්ටත් ඕනැ ද, මේ මගෙ එළුවන් බලාගන්න කොලුවා කියාවි නෙ" කියලා.

එතකොට රජ්ජුරුවෝ කොලුවාට කතාකරලා ඇහුවා 'උඹ දන්නවා ද මේ රටේ හරි මැද්ද කොතැන ද?" කියලා.

ඒ පාර කොලුවා අතේ තුබුණ කෝටුවත් අරගෙන ටිකක් එහාට මෙහාට ගිහින් එක තැනක කෝටුව ඔබ ඇනලා කීවා "මෙන්න මේකත යි දේවයන් වහන්ස මේ රටේ මැද්ද, එහෙම නැද්ද කියලා හතර පැත්තෙන් මැනලා බලලා වැරදිනම් මගෙ ඉස ගහ දමන්ට" කියලා. රජ්ජුරු-වන්ට මේකට කියන්ට දෙයක් නෑ ඒ පාර රජ්ජුරුවෝ කීවා හා හොඳයි, ඒක මං පිළිගන්නවා, එතකොට මේ පෙනෙන ආකාසෙ තාරකාවන් කොච්චර තියනවද කියන්ට පුළුවන් ද?" කියලා.

එතෙන්දි මේ එළුවන් බලන කොලුවා තමන්ගෙ ඉණේ දවටා ගෙන තුබුණ එළු හම ලිහලා බිමට දමලා කීවා "දේවයන් වහන්ස, මේ ආකාසෙ පෙනෙන තාරකා-වල ගණනත්, මේ එළු හමේ තියන මයිල් ගස්වල ගණනත් හරියට ම එක ගානයි. එහෙම නැද්ද කියලා ගන්නවල බලලා වැරදි නම් මගේ ඉස ගහ දමන්ට"ය කියලා. ඒක-ටත් රජ්ජුරුවෝ කීවා "හා හොඳයි ඒකත් මම පිළිගන්-නවා; එතකොට මේ තුන්වෙනි ප්‍රශ්නෙ "දිව්‍යලෝකෙ ඉන්න දිව්‍යරාජයා කරන්නෙ මොකද්ද? කියන්ට පුළුවන් ද?"



"ඒ ප්‍රශ්නයට නම් මෙහෙම උත්තර දෙන්ට බෑ දේවයන් වහන්ස, කියලා එතකොට කොලුවා කීවා.

"එහෙනම් කොහොමද උත්තර දෙන්ට පුළුවන්?" රජ්ජුරුවෝ ඇහුවා.

"මට රාජාභරණ අන්දවලා. ඔටුන්නත් පලන්දලා සිංහාසනේ නැංගෙව්වොත් විතරක් උත්තර දෙන්ට පුළුවනි" කියලා ඒ පාර මේ කොලුවා කීවා. ඉතින් රජ්ජුරුවොත් ප්‍රශ්නෙට උත්තර දැනගන්ට ඕනෑ කරන නිසා කොලුවාට රාජාභරණ අන්දවලා ඔටුන්නත් පලඳවලා සිංහාසනේ නැංගෙව්වා.

ඊට පස්සෙ මේ කොලුවා වදකයන්ට කතා කර කීව "බොලව්, මෙන්න මේ මිනිහා අකාරණේ මිනිසුන් ගාන-කගෙ ඉස් ගහ දම්මෙව්වා, අන්න ඒ වරදට දැන් මේ මිනිහා ඇදගෙන ගිහින් ඉස ගහලා කැලේට ඇද දමියව්! -ඔන්න ඕක තමයි දිව්‍ය ලෝකෙ දිව්‍යරාජයා කරන්නෙ" කියලා.

සිංහාසනේ අණ ඉෂ්ට කරන්ට ඕනෑ නිසා වදකයොත් අර රජ්ජුරුවන් ඇදගෙන ගිහින් ඉස ගහ දැමුවා.

ඊට පස්සෙ මේ එළුවන් බලාගෙන හිටිය නුවණැති කොලුවා අර පුරෝහිත ඇමැත්තයාගෙන් උදව් අහුව බොහොම හොඳින් ඒ රටේ රජකම් කරගෙන හිටියා.

# වෙද රාළ

ඉස්සර එක කාලෙක එක ගමක මිනිහෙක් හිටියා. මේ මිනිහා කන්ට බොන්ටවත් නැති දුප්පත් මිනිහෙක්. ඉතින් එක දවසක මේ මිනිහා හිතුවා වෙන රටකටවත් යන්ට ඕනෑ වෙනකවත් හරිහම්බ කර ගන්ට කියලා. ඕන්නා ඉතින් මේ මිනිහා ගමෙන් පිටවෙලා ගිහින් වෙන රටක වෙන ගමකට ගියා. ඒ ගමේ මිනිස්සු මේ මිනිහාගෙන් ඇහුවා "උඹගෙ මොනාම සැස්තරයක්වත් දන්නෙ නැද්ද?" කියා. ඉතින් මේ මිනිහා - ඒ මිනිහගෙ නම අප්පු - ඉතින් මේ අප්පු කිව්වා මං එක සැස්තරයක් දන්නවා. මට පොල් තෙලුයි කොහොල්ලෑයි දළුක් කිරිටි ටිකක් හොයලා දුන්නොත් ඒ සැස්තරේ පෙන්නන්ට පුළුවනිය කියල. ඉතින් ගමේ මිනිස්සු එහා මෙහා ගිහින් මේ අප්පුව අර කියාපු දේවල් හොයල ගෙනත් දුන්නා.

ඊට පස්සෙ අප්පු මේ කොහොල්ලැයි දළුක් කිරිටි පොල් තෙලුයි එකට අනලා අව්වෙ තියලා උකු පදමට හදගෙන ඉපල්වල ඒවා ගාලා කුරුල්ලන් අල්ලන ලැව හැදුවා. මේ ලැව ගෙන ගිහින් වැව අයිනෙ හිටවලා තිබ්බා. කුරුල්ලො ඇවිත් ඒවායෙ ලැග්ගාම උන් යන්ට බැරි ව ඇලී හිටියා. ඉතින් අප්පු මේ කුරුල්ලන් එකතු කරගෙන ගිහින් එක ගෙදරට දෙන්නා දෙන්නා බෙදගෙන ගියා. ඒ ගෙවල්වලින් අප්පුට බත් කන්ට හම්බ වුණා. හැමදාම මේ විදියට කුරුල්ලන් අල්ල අල්ලා ඉන්නකොට අප්පුට නම හැදුණා කුරුලු-අප්පු කියා.



ඉතින් කුරුලු අප්පු මෙහෙමට ජීවත්වෙන කාලෙ එක දවසක් ඒ ගමේ මිනිස්සු කත් බැඳගෙන පුත්තලම් යන්ට සූදානම් වුණා බඩු හුවමාරුවට. කුරුලු අප්පු කිව්වා 'මාත් යන්ට ඕනෑ පුත්තලම්' කියා. ඉතින් ගමේ මිනිස්සු ඇහුවා "උඹ මොනාවද කුරුලුඅප්පු අරන්න යන බඩු?" කියලා. "මටත් බඩු තියනවා" කියා කුරුලු අප්පු අඟයියාත් පොල් කලලින් කත් කොරවල් දෙකක් පුරවා ගෙන අනික් මිනිසුන්නුත් එක්ක යන්ට පිටත් වුණා.

මගදි අනික් මිනිස්සු ඇහුවාම "මොනාවද කුරුලු අප්පු උඹේ කතේ?" කියලා. කුරුලු අප්පු කිව්වා "මගේ කතේ තියෙන්නෙ බේත් අමුසද්"ය කියලා. එතන හිටපු පිරිසෙ අනික් උදවිය කුරුලු අප්පුට "වෙදරාළ" ය කියන්ට උණා.

මේ කාසේට මෙහෙම යනකොට එක තැනකදී කුරුලු අප්පු කිව්වා මට පොඩියකට එළියට යන්ට ඕනෑ කියලා කද පාරෙන් තියලා බැද්දට ගියා. කුරුලු අප්පු මේ බැද්දෙ ඉඳගෙන ඉන්නකොට දුටුවා ඒ අහල පඳුරක පටලැවිලා හිටිය එළුහරක් බානක්. ඒ පාර කුරුලු අප්පු හරක් බානට ළං වෙලා හංවඩුවත් බලාගෙන බැද්දෙන් එළියට ඇවිත් අනික් උදවියත් එක්ක පිටත් වෙලා ගියා.

බොහොම තව ටිකක් දුර යනකොට ගමක් හම්බ වුණා. දන් ඇදිරි වැටෙන්නටත් කිට්ටු නිසා මේ කාන්තෙ කතාකර ගත්තා මේ ගමේ රෑට නැවතිලා යන්ට. එහෙම කතාකර ගෙන කුරුලු අප්පුට කිව්වා "වෙදරාළේ, ගිහින් අර ගෙදරින් අපට නවාතැනක් අහලවරෙන්" කියලා.

කුරුලු අප්පුත් ගිහින් එක ගෙදරකට, ඒ ගෙදරින් ඉල්ලුවා "අපට අද රෑට නවාතැනක් දෙන්ට පුළුවන්ද?" කියලා.

ගෙදර මිනිස්සු කීවා "උඹලට මෙහෙ නවාතැන්, අපට මෙහෙ ඉඟ පත්තුවෙලා ඉන්නාව අපේ හරක් බාන නැතිවෙලා" කියලා.

ඉතින් කුරුලු අප්පු කීවා "ඒකට ඉතින් අපි මොනවා කරන්ට ද? අපට මේ රෑ මෙහෙ ඉඳලා යන්ට ඉඩ දෙන්ට" කියලා.

එහෙනං අන්න අර මඩුව තියනවා, හොඳ නම් ඉඳලා පලයල්ලා" කියල ගෙදර මිනිස්සු මඩුවක් පෙන්නුවා.

ඒ ගමන කුරුලු අප්පු ගිහින් කාණ්ඩෙට කීවා "මඩුවක් තියනවා හොඳනම් ඉඳිමු නැතිනම් තව බහෙයමු" කියලා පස්සෙ කාණ්ඩෙ එක්ක කතා කරගෙන හා එහෙනම් මෙහෙ ඉඳලා යමු ය කියලා මඩුවට ගිහින් උන්නා.

එහෙන්දි කාණ්ඩෙ ඇත්තො කුරුලු අප්පුට කතාකර කීවා "මොකද වෙදරාළෙ නිකං බලාගෙන ඉන්නෙ, ඇඳිරි වැටෙන්ට ඉස්සර දර වතුර ටිකක් ලංකරගන්නෙ නැද්ද?" කියලා.

මේ වෙලාවෙ මෙතන වෙදරාළෙ වෙදරාළෙ කියා කතා කරනවා ගෙදර මිනිස්සු අහගෙන හිටලා ඒ මිනිස්සු මඩුවට ඇවිල්ලා මේ කාණ්ඩෙගෙන් ඇහුවා "මේ වෙදරාළ කියන එක්කෙනා සැස්තර කියන්ටත් දන්නවා ද?" කියලා. ඉතින් කාණ්ඩෙ ඇත්තොත් ඔහෙ නිකමට කීවා "සැස්තර කියන්ටත් ටිකක් ටිකක් දන්නවා" කියලා. ඒ ගමන ගෙදර මිනිස්සු "අනේ එහෙනං මේ ඇත්තො ඇයි දර වතුර හොයන්ට නාලංගු වෙන්නෙ, ඒ ඕනෑ කරන කියන දෙයක් අපි ගෙනත් දෙන්නම්" කියා දරයි, වතුරයි, හාල් තුනපහයි, කරවල කුට්ටියකුයි, පුහුල් ගෙඩියකුයි මඩුවට ගෙනත් දුන්නා.



මේ කාණ්ඩෙත් බොහොම සන්තෝසෙන් වේ දේවල් උයා පිහාගෙන හොඳට කෑවා. කාලා කාණ්ඩෙ එක්කෙනෙක් අර ගෙදර මිනිස්සුන්ට කතා කර කීවා දැන් ඉතින් බුලත් හුරුල්ලක් ගෙනැවින් වෙදරාලට දීලා සැස්තරේ අහගන්ට කියලා. ඒ ගමන ඒ පිරිසත් ලගියෙ දුවලා ගිහින් බුලත් අතක් අරගෙන ඇවිත් වෙදරාළට දුන්නා.

'වෙදරාළ'ත් මිග බැරෑනියට බුලත් හුරුල්ල දිහා ටිකක් වෙලා බලා ඉඳලා දිෂ්ටියෙන් වගේ වෙවුලන්ට පටන් ගත්තා. ටිකක් වෙලා දිෂ්ටි වෙලා කීවා "මේ අහන්නෙ නැති වෙච්ච ගරක් බානක් ගැනයි" කියලා.

"අනේ, ඔව්, ඔව්," කියලා අර මිනිස්සුත් හුඟක් සතුටු වුණා.

ඒ ගමන වෙදරාළ ආයෙමත් කීවා අහවල් අහවල් පාට ලක්ෂන තියන අහවල් අහවල් ගංනිවරණ තියන "හරක් බානක් ගැනයි මේ අහන්නෙ" කියලා.

එතකොට ගෙදර මිනිස්සු බොහොමින් ම සන්තෝෂ වෙලා කියන්ට වුණා "අනේ! අපි දේවාල කියන සැස්තර ඇහුවද කාටවත්ම කියන්ට බැරි වුණා නේ, මේ කියන සැස්තරේ" කියලා.

ඊට පස්සෙ 'වෙදරාළ' ඇහුවා "අහාදයි හරක් බාන හොයලා දුන්නොත් දෙන්නෙ මොනවාද?" කියා.

ගෙදර මිනිස්සු පොරොන්දු උණා. "හරක් බාන නිච්චියට ම ඉන්න තැන කීවොත් බානෙම කොහොමි උනත් එක හරකකුගෙ වටිනාකමට රුපියල් විස්සක් දෙනවා" කියලා.

හොඳයි කියලා 'වෙදරාළ' ඒ මිනිසුන් ලවා එළිපුළු පත්තුකරවාගෙන දිස්ටියෙන් ම ගියා අර හරක් බාන පට-ලැවිලා හිටිය තැන බැද්දට. ගිහින් හරක් බාන පෙන්නුවා.

ගෙදර මිනිස්සු හරක් බාන අරගෙන ඇවිත් පහුවදා උදේ ම පොරොන්දුවෙ හැටියට 'වෙදරාළ' ට රුපියල් විස්සක් දුන්නා. ඊට පස්සෙ 'වෙදරාළ' අර කත් පෙරවිල් දෙකෙ තිබුණු දහයියාත් පොල් ලෙලිත් එහෙකට විසි කරල අනික් කාණ්ඩෙත් එක්ක ම මගට බැහැලා ගියා.

එදත් ඔහොම ගිහින් ගිහින් ඉර බැසගෙන එනකොට කවත් ගමකට ගියා. එතැනදීත් මේ කාණ්ඩෙ 'වෙදරාළ' ම පිටත් කරලා ගෙදරකින් නවාතැන් ඉල්ලා ගත්තා. එදත් අනික් කාණ්ඩෙ 'වෙදරාළ' ට කතා කර කීවා "මොකද වෙදරාළෙ ඉතින් බලාගෙන ඉන්නෙ දර වතුර ටිකක් ලෑස්ති කර ගන්නෙ නැද්ද?" කියා.

එතකොට ඒ ගෙදර මිනිස්සුත් මේ කාණ්ඩෙට කිට්ටු කරලා ඇහුවා "අනේ! අර වෙදරාළට සැස්තර හෙමත් කියන්ට පුළුවන්ද?" කියලා

ඒ පාර ඒ කාණ්ඩෙ මිනිස්සු කීවා "සැස්තර කියන්ට පුළුවන් ද කියලත් අහනවා, ඊයෙ රෑ නවාතැන් ගත්ත ගමේදී හරක් බානක් හොයාගන්ට සැස්තරේ කියලා රුපියල් විස්සක් තෑගිත් ලැබුණා" කියලා.

ඊට පස්සෙ මේ ගෙදර පිරිසත් කාණ්ඩෙට රෑට කෑමට වුවමනා කළමනා මික්කොම ගෙනත් දුන්නා. මේ කාණ්ඩෙත් හොඳහැටි උයා පිහාගෙන බඩපුරා කෑවා.

එතකොට ඒ ගෙදර මිනිස්සු බුලත් අතක් කාරිය ගෙනැවිත් වෙදරාළගෙන් ඇහුවා කොහොමද මේ සැස්තරේ කියලා. ඒ පාර වෙදරාළ ඒ මිනිස්සුන්ට ඒරු වුණා "සිහිබුද්ධි නැතුවට මොන සැස්තර කියමිනක් ද?" කියලා. එහෙම කීවම ඒ මිනිස්සු අහකට ගියා; 'වෙදරාළ'ත් නිදා ගන්ට ගියා.



මේ ගෙදරම හිටියා තව ගැහියක්, සිහි බුද්ධි කියලා. 'වෙදරාළ කියපු කතාව මේ ගැනි අහගෙන ඉඳලා රාත්ති-රියෙ ඇවිත් හින්සැරේ 'වෙදරාළ' කුද්දලා කීවා; "අනේ වෙදරාළෙ ඒ කිව් සිහි බුද්ධි මා තමා. ගමරාළගෙ වරාගම් පොදිය හොරකම් කළේ මා තමා. අනේ වෙදරාළෙ ඒ වගක් කියන්ට එපා. වරාගම් පොදිය මං දෙන්නම්" කියලා.

ඒ පාර 'වෙදරාළ' කීවා හෝ ඒ වරාගම් පොදිය ගනික ගෙන වරෙන් කියලා ඒක ගෙන්නාගෙන වරාගම් පොදිය කෙහෙල් ගහක් මුල හංගලා තියලා නිදගත්තා.

'වෙදරාළ' උදේ ම නැගිටලා ගෙදර මිනිසුන්ට කතා කර කීවා "හොඳයි දැන් ගෙනෙල්ලා බුලත් මං සැස්තරේ කියන්නම්" කියලා.

ඒ මිනිස්සු බුලත් ගෙනත් දුන්නාම වෙදරාළ ටිකක් වෙලා බලාගෙන හිටලා කීවා "මේ අහන්නෙ නැති වෙච්ච වරාගම් පොදියක් ගැනයි" කියලා.

එතකොට ගෙදර මිනිස්සු කීවා "හරියට ම හරි, මට ඒක හොයාගන්ට හරියට සැස්තරේ කිව්වොත් එයින් බාගයක් තෑග්ගට දෙනවා" කියලා.

හොඳයි කියලා 'වෙදරාළ' දිෂ්ටියෙන් ම කෙසෙල් පඳුර ළඟට ගිහින් වරාගන් පොදිය හංගලා තියන තැන පෙන්නුවා. මිනිහත් සතුටුවෙලා එයින් බාගයක් ම 'වෙද-රාළ'ට දුන්නා තෑග්ගට.

ඒකත් අරගෙන කාණ්ඩෙට එකතුවෙලා ඔහොම යන කොට ඔන්න රටේ රජ්ජුරුවන්ගෙ පාවුල් පෙට්ටිය හොරු අරගෙන රජ්ජුරුවෝ අඬබෙරයක් ප්‍රසිද්ධ කරනවා පාවුල් පෙට්ටිය හොයා දුන්නු කෙනෙකුට බොහොම කාන්න මාන්න දෙනව යි කියල.

ඒක අහගෙන හිටිය 'වෙදරාළ'ගෙ කාණ්ඩෙ මිනිස්සු රාජ පුරුෂයන්ට කිව්වා අපේ මේ වෙදරාළ මෙහෙම මෙහෙම කෙනෙක්. එයාට පුළුවන් වෙයි, පාමුල් පෙට්ටිය හොයා දෙන්ට කියලා. ඒ පාර රාජ පුරුෂයා 'වෙදරාළ' කැඳවු ගියා රජ්ජුරුවන් ළඟට. ගියාම රජ්ජුරුවෝ ඇහුවා මේ මිනිහට පුළුවන්ද පාමුල් පෙට්ටිය හොයා දෙන්ට කියලා කාණ්ඩෙ උදවිය කිව්වා "පුළුවනි දේවයන් වහන්ස" කියලා.

ඉතින් 'වෙදරාළ' හොඳට ම බයවෙලා හිතා ගත්තා අවසනින් නම් මට ගැලවිල්ලක් නම්බ වෙන්නෙ නෑ. මං ගෙල වැලක්වත් ලා ගෙන මැරෙන්ට ඕනෑ කියලා.

ඉතින් රජ්ජුරුවෝ ඇහුවා මොනවා ද උඹට ඕනෑ කරන්නෙ කියලා. 'වෙදරාළ' කිව්වා, දේවයන් වහන්ස, "උඩට උසි වියනක් බැඳපු කාමරේකුත් ඒ කාමරේට ඇඳ පුටුත්, මේසයකුත් කඹ කැල්ලකුත් ඕනෑ" යි කියලා. රජ්ජුරුවොත් ඒ ඉල්ලපු ඔක්කොම දේ සූදානම් කරවලා දුන්නා.

ඊට පස්සෙ ඇඳිරි වැටුණාම 'වෙදරාළ' මේ ගෙට ගිහින් රාජ පුරුෂයන්ට කිව්වා පිටතින් යතුරු දමලා දොර වහගෙන යන්ට කියලා. ඊට පස්සෙ හුඟක් වෙලා කල්පනා කර කර ඉඳලා ඉතින් දැන් වෙන පහයක් නෑ ගෙල වැල ලා ගන්ට ඕනෑ කියලා මේසෙ උඩට නැගලා බාල්කයට කඹේ දා ගන්ට බැලුවා. බාල්කය උසයි, කඹේ කොටයි. ඒ ගමන 'වෙදරාළ' කියන්ට වුණා, "මේකත් කොටයි ඒකත් උසයි ඉතින් කුමන්ද මං කරන්නෙ?" කියලා.



මේ කතාව අහගෙන ඔය ගේ අයිනට වෙලා මිනිහෙක් හිටියා. ඒ මිනිහගෙ නම 'කුමන්ද'. මේ කුමන්ද ම තමයි හොරා- ඔහු ආනාදි හොරෙක් වීනිගා මෙතෙන්ට වෙලා හිටියෙ මේ සැත්තරකාරයා මොනවා ද කරන්ට යන්නෙ කියලා බලාගන්ටයි. ඉතින් 'කුමන්ද' කියා වෙදරාළ කියනවා ඇහෙන කොට ම හොරාට බය හිතුණා, වෙදරාළ දැනගෙන තමයි කියලා. බය හිතිලා ඇවිදින් දොර ළඟට වෙලා හෙමින් කතා කර කිව්වා "අනේ වෙදරාළෙ මම තමයි ඔය කියන කුමන්ද. මං පාමුල් පෙට්ටිය හොරකම් කළ එක ඇත්ත. අනේ 'වෙදරාළෙ' මේ බව රජ්ජුරුවන්ට කියන්ට එපා. මං පාමුල් පෙට්ටිය යි ඔක්කොම බඩු යි ගෙනැවිත් දෙන්නම්" කියා.

එකකොට වෙදරාළ කතා කර කිව්වා "හා හොඳයි එහෙනං හනික ගෙනාපන්" කියලා. ඒ පාර හොරාත් හනික ගිහින් පාමුල් පෙට්ටිය යි ඔක්කොම බඩුයි වෙදරාළ අතට දුන්නා ජනේලෙන්.

"හා උඹ පලයන් ඉතින්" කියා වෙදරාළ ඒ ඔක්කොම බඩු අරගෙන තියලා හොඳ හැටි නිද ගත්තා.

පසුව ද උදේ රජ්ජුරුවො මිනිසුන් එව්වා බලන්ට හොරා අහුවුණාද කියලා. ඒ මිනිස්සු ඇවිදින් දොරට ගහලා වෙදරාළට කතා කළා. වෙදරාළ හිතුවා දැන් ම එළියට යන්ට හොඳ නෑ කියා. හිතලා ගෙයි ඉඳගෙන කෑ ගැහුවා, "කවුද මේ මට කරදර කරන්නෙ නිදාගන්ට ඉඩ නොදී" කියලා, ආයෙත් හොඳට ම නිද ගත්තා.

ඊට පස්සෙ රජ්ජුරුවො තමන් ම ආවා වෙදරාළ හොරා අල්ලුවාද බලන්ට. ඒ පාර වෙදරාළ එළියට ඇවිත් කිව්වා "අනේ දේවයන් වහන්ස, තව ටිකකට ඉවසුවා නම් හොරා අල්ලාගන්ට තිබුණා නේ, දැන් බඩු ටික විතර යි තවම අහුවුණේ" කියලා.

ඒ ගමන රජ්ජුරුවෝ කීවා "හා කමක් නෑ. බඩු ටික හම්බ වුණායින් පස්සෙ හොරා නැතත් කමක් නෑ" කියලා. රජ්ජුරුවෝ බොහොම සන්තෝෂ උණා. ඒත් රජ්ජුරුවන්ට හිතුනා මේ මිනිහා පරීක්ෂා කරල බලන්ට. එහෙම හිතලා මාලිගාවට ගිහින් මැදිරියක හිටිය පුංචි කුරුල්ලෙක් අල්ලලා මිටේ තියාගෙන කීවා සැස්තරේ හරි නම් මගෙ මිටේ තියෙන්නෙ මොකක් ද කියන්ට ඕනැ. නැත්නම් රාජාඥා කරවනවා කියලා.

'වෙදරාළ' ට ඒ ගමන හොඳට ම බය හිතිලා ඔළුවට ගහගෙන ගහගෙන ගිහින් කීවා "මෙද පොරෙට නම් කුරුල්ලූ අප්පුගෙ පිස්ස ගියා" කියලා.

ඒ පාර රජ්ජුරුවෝ කීවා, "බොල, තගෙ සැස්තරේ නම් හරියටම හරි. මගෙ මිටේ ඉන්නෙ කුරුල්ලෙක් තමයි" කියලා. ඊට පස්සෙ රජ්ජුරුවෝ වෙදරාළට හුඟක් සාන්න මාන්න දීලා නිලේකුත් දීලා ගේකුත් පවරලා දීලා ඒ රටේ ම ඉන්ට කියලා කීවා.

ඉතින් වෙදරාළ කල්පනා කළා මීට පස්සෙත් මිනිස්සු සැස්තර අහන්ට ආවොත් මා අමාරුවෙ වැටෙයි කියා එක දවසක රාත්තිරියේ ඔක්කොම බඩුත් එක්ක ම ගෙට ගින්දර තිබ්බා. ගින්දර තියලා එළියට වෙලා අඩ අඩා කීවා "වෙදරාළගෙ සැස්තර කීමත් අදින් ඉවරයි. ඔක්කොම සැස්තර පොත් ගිනි බත් උණා" කියලා. ඒ කතාව ප්‍රසිද්ධ වෙලා තියාට පස්සෙ කවුරුවත් ආවෙ නෑ වෙදරාළ ගෙන් සැස්තර අහන්ට. ඉතින් කුරුලු අප්පු ඒ රටේ ම බොහොම ගරුසාරෙට ජීවත් වුණා.



# තම්පලා ගහ

එකමත් එක ගමක හිටියා වත් පොහොසත් කම තියන ගමරාළ කෙනෙක් හිටිහාමි කියලා. ඔය ගමරාළට හිටියා වැඩිවිය පැමිණුණු ඇහැට කනට හොඳ දුවක්. ඇගෙ නම සුවදී.

හිටිහාමි තමන්ගෙ දුව දෙන්ට හොඳ බැණා කෙනෙකු හොයාගන්ට හිතාගෙන රටේ ප්‍රසිද්ධ කරල ඇරිය හොඳ බැණා කෙනෙක් ආවොත් දුව දෙනවා කියලා.

ගමරාළත් බොහොම ප්‍රසිද්ද යි. ඉතින් ගම දුව ගැන අහපු ගැටවරයො එන්ට පටන්ගත්තා ගමරාළට බැණා වෙන බලාපොරොත්තුවෙන්.

ඉතින් ඒ අදහසින් කවුරුහරි ගෙදරට ආවාම හිටිහාමි කෑම බීම දීලා සංග්‍රහකරල හෙමි කියනවා "ළමයා මගෙ දුව දෙන්ට නම් මා වෙනුවෙන් එක වැඩක් කරන්ට තියනවා" කියලා.

ඒ වැඩේ මොකක්ද කියලා ඇහුවාම ගමරාළ කියනවා "හේනට ගිහින් තම්පලා ගහක් තියනවා, ඒක කපාගෙන එන්ට ඕනැ" කියලා.

"ආ ඕකත් කාරියක්ද? මෙහෙ දෙන්ටකො ඔය කැත්-තක්" කියලා තරුණයා එකපාරට ම කැත්ත අරගෙන හේනට යන්ට පිටත් වෙනවා. එතකොට ගමරාළ කියනවා "ආ ඔය ඇති ඔය ළමයා මට පිරිමහින බැණා

කෙනෙක් වෙන්නෙ නෑ" කියලා එයා ආපහු යන්ට ඇරිනවා-ගිය කෙනෙක් ලැජ්ජාවට ආයෙ කෙනෙකු එක්ක කියන්නෙත් නෑ. ගමරාළගෙ දුව ගෙනයන්ට මෙතෙක් තරුණයො හුඟ දෙනෙක් ආවට මොකද කාටවත් හරි ගියෙත් නෑ.

ඔය අතරෙ, කැත්ත උදැල්ලෙ වැඩ හොඳට පුරුදු එක තරුණයෙක් ආවා-ගමරාළගෙ බෑණා වෙන්ට. එයාටත් ගමරාළ සංග්‍රහ ගෙම කරලා කීවා තම්පලා ගහ කපන්ට තියන කාරිය.

ඒ තරුණයා කලබල උණෙත් නැහැ. ඇඳුම් ගෙට උනාලා අමුඩය ගහගෙන වාන්ගම් දෙකත් බැඳගෙන කැත්ත ඉල්ලා ගෙන මුවන්කියලා ගෙම ඉවරවෙලා ඇවුවා "තම්පලා ගහ ඇත්තෙ කොහෙද ද" කීවලා.

මේ ඔක්කොම බලාගෙන හිටිය ගමරාළ එකකොට කීවා "ඕනැ නෑ ළමයො, උඹ හොඳයි මගෙ බෑණා වෙන්ට. මෙච්චර කල් මෙහාට සිරගන්ට ආ ගැටයන්ගෙන් උඹ විතරයි පිළිවෙළකට වැඩක් කරන්ට දන්න මිනිහෙක් ආවේ" කියලා. ඉතින් ගමරාළ කැමති උණා එයාට දුව දෙන්ට.

ඊත් මේ තරුණයත් එක පාරට ම කැමති උණේ නැහැ, ගමරාළගෙ දුව ගන්ට. ඒ ගමන තරුණයා ගමරාළට කතා කරලා කීවා "හොඳයි එහෙනං මටත් බලන්ට කාරියක් තියෙනවා. මං වැඩ ටිකක් කරන්නම් කෙතේ. පල්ලියන්දට කියන්ට ඇඹුල හදල ඇරගෙන එන්ට කියලා" කියාගෙන ගමරාළත් එක්ක ම කුඹුරට ගිහින් වැඩ කළා.



ගමරාළගෙ දුව, සුවඳි හනික හාල් ගරලා ලිප තියා, මාළු පිණිත් හොඳට හදලා ඉදුණාටින් පස්සෙ ලිඳට ගිහින් නාලා හොඳට ඇඳගෙන බතුත් මාළු පිණිත් පෙට්ටියකට ඇරගෙන පත්තොළත් පැනුත් ඇරගෙන, බුලත් විටකුත් හදගෙන මලයත් අඩගහගෙන බත් පෙට්ටිය ඉහ තියාගෙන කෙතට ගියා.

ගමරාළත් මේ තරුණයත් දෙන්න ම වැඩ නවතලා වෙලෙන් ගොඩවෙලා පිල්ලැවෙ තිබුණ තිඹිරි ගහ යට සෙවණට එන්ට ආවා. ඔය අතර ඒ ළඟ කුඹුරෙන් එක නයිඳෙ කෙනෙක් නියර තොට කොවා ගිටියා. ඉතින් මේ දෙන්නා ගොඩට එන අතරෙ තරුණයා කීවා "අර නයිඳෙත් තව ම බත් කාලා නෑ නෙවා" කියලා.

"බටි ඒ නයිඳෙටත් අඩගහමු" කියලා ගමරාළ ඒ අතින් ඇත්තාටත් කැන්දුවා බත් කන්ට. ගමරාළගෙ දුව තුන් දෙනාට ම අතකට හෝදගන්ට දිය දීලා පත් කොළ එළලා කෑම බෙදුවා. ඈ ඒ කාරිය හොඳ සිරුවට කළා. බත් කාලා ඉවර වෙන කොට අර තරුණයා බත් පහෙන් බාගයක් ඉතිරි වෙලා තියෙද්දී අතකට හෝද ගත්තා. ගමරාළගෙ දුවත් ඒ බත් පත අහක ලන්නෙ නැතුව අර ගෙන කියාගත්තා. අලුත්තෙකුත් කැවාට මොකද තවත්, එක්කෙනෙකුට කතත් පෙට්ටියෙ බත් ඉතිරි වෙලත් තුබුණා. බත් කාලා ඉවර උණායින් පස්සෙ ගමරාළගෙ දුව බුලතුත් දුන්නා. ඊට පස්සෙ කෑම බීම ඔක්කොම ඉවර වෙලා ඉතිරි බතුත් ඇරගෙන සුවඳි මලයත් එක්ක ගෙදර ගියා.

ගම්රාළගෙ දූ උයා තිබුණ හැටිත්, බත් ගෙනා හැටිත් බෙදූ හැටිත් ඔක්කොම හොඳින් බලා හිටිය අර තරුණයා සතුටු වුණා. "මෑ ගෙදර අඳෙර් කාරණ එන්ගෙන ගෑනියක් තමා" කියලා. ඊට පස්සෙ කැමති උණා ගම්රාළගෙ බෑණා වෙන්ට, ගම්රාළත් බොහොම සතුටු උණා හිතාහිටියාටත් විඩා හොඳ බෑණා කෙනකු ලැබුණා කියලා. ඊට පස්සෙ ඒ ඇත්තො එහෙ බොහොම හොඳින් හිටියා.



# සැත්තර කාරයා

එකමත් එක ගමක හිටියා එක මිනිහෙකුයි ගෑනියෙකුයි. මේ මිනිහා අත පය හොල්ලා වැඩක් පලක් කරන්නෙ නෑ, කම්මැලි යි. ගෙදර ඇත්තොත් හැම දා සරදර කරනවා. "ඇයි වඳ ඉතින් ඕහොම අත පය අකුළාගෙන ඉඳලත් හරියනව යැ. ගමේ වැඩක් කරන්නෙ නැත්නම් රට රාජ්ජේකවත් ගිහින් මොකුත් හොයා හද ගන්ට එපා ද" කියලා.

හැමදමින් ඕහොම ගෙදර ඇත්තන්ගෙන් අපවාද අහ අහා ඉඳලා මේ මිනිහා එක දවසක හිතාගත්තා හොඳයි මං රටේ ගොහින් වෙන මොකුත් කාරියක් කරලා මොකුත් හම්බකරගෙන එන්ට ඕනෑ කියලා.

ඕහොම හිතලා මිනිහා පහුවද ගෙදරටත් කියලා පිටත් වෙලා ගියා. ඕහොම ගිහින් ගිහින් ගම් බොහොමයක් පහුකළා. ඒත් කරන්ට පුළුවන් කාරියක්නම් ලැබුණෙ නැහැ. දවසෙ ම කෑමකුත් නෑ. අනේ මීටේ මොකුත් ඇත්තෙත් නෑ. දන් හැන්දෑ වෙන්ටත් ආවා. ඉතින් මිනිහ හිතා ගත්තා මීළඟ ගමේදී නම් කොයි කාරියක් හරි කරන්ට බාර ගන්නවා කියලා.

ඉතින් මීළඟ ගමට ගියා ම ගමේ මිනිසුන්ට මිනිහා කීවා මෙහෙම කාරණේකට යි ගමින් පිටවෙලා ආවෙ කියලා ආ ගිය විත්ති ඔක්කොම.

එතකොට ගමේ මිනිස්සු ඇහුවා "ඉතින් මොනක් ද ඉගෙනගෙන තියෙන සැත්තරේ? කියලා.

මිනිහා කීවා සැත්තර නම් දන්නෙ නෑ. වෙන ඉතින් පිරාබිරා වැඩ කරන්ට පුළුවනි කියලා.

එතකොට ගම්රාළ කීවා "හොඳයි උඹට හැකි නම් හැම දම මගෙ එළදෙනුන්ට තණකොළ ගෝනි හය ගානෙ කපා දෙන්ට මම දවසකට කුට්ටු හය ගානේ දෙනවා" කියලා.

මේ රාළත් එකට කැමතිවෙලා ගම්රාළගෙ ගෙදර නතර වුණා. ඒත් එක දවස යි මිනිහා තණකොළ කැපුවෙ. එද හැන්දෑවෙ ම කල්පනා කළා මේක නම් මහ අමාරු කාරියක්, කැත්තෙ උදැල්ලෙ වැඩ උණත් මෙහෙම නම් අමාරු වැඩ. "මම සැත්තර දන්නවා නම් මට මෙච්චර කරදරයක් නැතුව ජීවත් වෙන්ට පුළුවන් නෙවැ" කියලා. හිතා ගත්තා කොහේ හරි ගිහින් සැත්තර ඉගෙන ගන්ට කියලා.

මිනිහා කාටවත් නොකියා එකැත්තේ පිටවෙලා මගට බැහැලා යන්ට පටන් ගත්තා. ගිහින් ගිහින් මග තොට අහගෙන සැත්තර උගන්නන ආචාරි කෙනෙක් ගාවට ගියා. ගිහින් ආචාරීන්ට කීවා සැත්තර ඉගෙන ගන්ට කැමතියි. උගන්නාන්ට කියා.

හොඳයි එහෙම නම් නතර වෙන්ට කියලා ආචාරි උත්සාහ කළා මේ මිනිහාට සැත්තර උගන්වන්ට, මොන දෙයක් වත් උගන්වන්ට බෑ; මේ මිනිහා හරි ම මෝඩයා. කිසි දෙයක් මතක තියා ගන්ට බෑ. ඉතින් ආචාරීන්ට මේ මිනිහා ජීකම්මී ආපහු අරින්ට බැරුව එක දවසක් මගක් පෙන්නලා කීවා මෙන්න මේ මග දිගේ රෑ වෙනකල් ගමන් කරලා මගදි දුටු දෙයක් ඇවිත් කියන්ට කියලා.



මිනිහාත් හා හොඳයි කියලා ගිහින් ඒ මග දිගේ ම ගමන් කරන කොට දුටුවා එක කැලෑවක් අයිනෙ ඌරෙක් ඉඳගෙන හාරනවා. ඒ ගමන මේ මිනිහා මේක දැකලා කීවා "හාරන්නා හාරන්නා." කියලා මේ සද්දෙට ඌරා හැරිලා බැලුවා. එතකොට මිනිහා කීවා "බලන්නා බලන්නා." කියලා. එතකොට ම ඌරා මේ මිනිහා දැකලා දුවන්ට පටන් ගත්තා. ඌරා දුවනකොට මිනිහා කීවා "දුවන්නා දුවන්නා" කියලා.

ඔය සිද්ධිය මිනිහට මතක හිටියා. මිනිහා ඒ ගමන ඇවිත් මේ සිද්ධිය ආචාරීන්ට කීවා. ඒ ගමන ආචාරීන් කීවා "හරියන කෙනෙකුට ඔය සැත්තරේ හොඳටම ඇති ඕක මතක නැතිවෙන්ට නොදී නිතර නිතර කියවන්ට ඕනැ" කියලා.

ඉතින් මේ මිනිහාත් ගුරුවරයාගෙන් අවසර අරගෙන ගමට යන්ට පිටත් වෙලා ගියා. යනකොට යනකොට මගදී ම රෑ වුණා. ඉතින් මිනිහා රෑට නවාතැනක් ගන්ට තැනක් හොය හොයා යනකොට එක හෙට්ටිරාළ කෙනෙකුගෙ ගෙයක් හම්බ උණා. මිනිහා හෙට්ටිරාළගෙ ගෙදරට ගිහින් රෑට නවාතැනක් දෙන්ඩ පුළුවන් ද ඉල්ලුවාම හෙට්ටිරාළ කීවා "ඔය අතන මෙතන යන මිනිසුන්ට නවාතැන් දෙන්නෙ නැහැයි" කියලා.

ඒ ගමන මේ මිනිහා කීවා; "අනේ හෙට්ටිරාළ එහෙම කියන්ට එපා. මම ඔය අතන මෙතන යන මිනිහෙක් නොවෙයි; මම මේ ආචාරීන් ළඟට ගිහින් සැත්තර ඉගෙන ගෙන ගමට යන්ට යන කෙනෙක් ය" කියලා.

එහෙම කීවාම හෙට්ටිරාළ කීවා "හොඳයි එහෙනං ඔය ගොහාලෙන්[1] නිදා ගන්ට" කියලා.

---

1 ගෙට යාබද පලයක් හෝ කුඩා මඩුව

ඉතින් මිනිහත් ගොහාලෙට වෙලා නිදාගත්තා. දැහැපතේ මහන්සියට මිනිහට වීක වෙලාවක් නින්ද ගියාට මොකද රෑ දෙගොඩහරි ජාමේදී ඇහැරුණා.

මේ අතරෙ ගෙවල් බිඳින හොරු රැලක් නුවර ගෙවල් බිඳ ගෙන වස්තුව අරන් යන ගමන් හෙට්ටිරාළගෙ ගෙයත් බිඳ හොරකම් කරන්ට හිතාගෙන ගෙමින් සැරේ ගේ බිඳින්ට පටන්ගත්තා.

මේ වෙලාවෙ අර නවාතැන් අරගෙන හිටිය සැත්තර කාරයා අවදියෙන්. බඩගින්නත් නොහෙට්ටුවත් නිසා නින්ද යන්නෙත් නෑ. ඉගෙන ගත්ත සැත්තරේවත් පාඩම් කරන්ට ඕනෑ කියල "හාරන්නා! හාරන්නා!" කියා කියවන්ට පටන් ගත්තා.

ගේ හාරන හොරුන්ට මේ වචනෙ ඇහුණාම උන් බයවෙලා ගේ හෑරීම නවතලා වටපිට බැලුවා, මිනිස්සු එහෙම රැකගෙන ඉන්නව ද කියලා.

එනකොට ම සැත්තරකාරයා ආයෙමත් කියන්ට උණා "බලන්නා බලන්නා" කියා.

ඒ ගමන හොරු හොඳටම බයවෙලා ගෙනා බඩුත් දමා දාලා තැන තියෙද්දී දුවන්ට පටන් ගත්තා.

සැත්තර කාරයාත් එතකොට ම "දුවන්නා, දුවන්නා!" කියා කියන්ට උණා.

සැත්තර කාරයා දුවන්නා දුවන්නා කියනවාත් මිනිසුන් වගයක් දඩි බිඩි ගාලා දුවනවාත් අහගෙන හිටිය හෙට්ටිරාළ නැගිටලා බැලුවාම දුටුවා ගේ බිඳලා තියෙන හැටිත් ගෙනා වස්තුවත් දමලා හොරු දුවලා තියෙන හැටිත්.



ඉතින් හෙට්ටිරාළ සැත්තර කාරයාට කතා කරලා කිව්වා "අද උඹැගෙ නිසා මට හොරුන්ගෙන් බේරුණ එක ලොකු වාසනාවක් - මට මේ හොරු ගෙනා වස්තුවෙන් පලක් නෑ. උඹ ම ඒවා අරන් පලයන් ඕවා පටවාගෙන යන්ට මම මගෙන් ගොනෙක් දෙන්නම්" කියලා.

බොහොම හොඳයි කියලා සැත්තර කාරයත් සමන් ගෙ මුළු ජීවිතේට ම සෑහෙන තරමට තිබුණ ඒ වස්තුව පොදි බැඳලා ගොනා පිටේ පටවාගෙන ගමට ආවා.

ගමේ මිනිස්සුයි ගෑනුයි වට වෙලා කොහෙන් ද අප්පේ මෙච්චර මේ වස්තුව" කියල ඇහුවාම මිනිහා කිව්වා මම අසවල් රටේ අසවල් පාවාරින් ළඟ සැත්තර ඉගෙන ගෙනා, ඊට පස්සෙ ඒ සැත්තරෙන් හම්බකර ගත් වස්තුව තමා මේ ගෙනාවේ" කියලා.

මිනිහා සැත්තර කාරයා හැටියට ප්‍රසිද්ධ වෙලා බොහොම ඉන්න කාලෙදී ඒ රටේ රජ්ජුරුවන්ගෙ දේවිගෙ මුතු මාලෙ නැති වෙලා රජ්ජුරුවෝ අඩ බෙරයක් ප්‍රසිද්ධ කළා මාලෙ හොයා දුන් කෙනෙකුට මසුරන් දහක් දෙනවයි කියලා.

ඒත් මුතු මාලෙ හම්බ උණේ නැහැ. ඒ ගමේ මිනිස්සු ගිහින් රජ්ජුරුවන්ට කිව්වා මේ සැත්තර කාරයා ගැන. මේ වෙලාව වෙන කොට මුතු මාලෙ හොයා දෙනවා කියා සැත්තර කාරයෝ බොහොම දෙනා ඇවිත් මාලෙ හොයා දෙන්ට බැරිවෙලා රජ්ජුරුවන්ට කරඟ ගිහින් අණ කර තිබුණා සැත්තරේ හැටියට නොකියන සැත්තර කාරයන්ගෙ කණක් කපලා අරින්ට කියලා.

ඉතින් මේ මිනිහා බොහොම දක්ෂ සැත්තර කාරයෙක් කිව්වාම රජ්ජුරුවෝ මිනිහාට එන්ට පණිවිඩ ඇරියා. පණිවිඩේ ලැබුණාම මිනිහාට දෙයියන් සිහි උණා. දුන් අර

සැත්තරේ වත් මතක නෑ. රාජ පණිවිඩේට නො ගිහිනුත් බෑ. මිනිහා හිතා ගත්තා අද නම් ඉතින් කණක් නැතුව තමයි ආපසු එන්නෙ කියලා.

තමන්ගෙ කන ගැන ම හිත හිතා බොහොම යනකොට මාලිගාව ළඟ ම ගඟක් තිබුණා එගොඩ වෙලා යන්ට. මිනිහා ගඟේ බැහැලා ගිහින් වතුරෙන් ගොඩ වෙන්ට ඉස්සර දෝතට වතුර අරන් මූණ සේදුවා. මූණ හෝදන ගමන් කණත් සේදුවා. කණ ගැන මතක් උණාම මිනිහට ඇඬුමුත් ආවා. ඉතින් මිනිහා කණ හෝදන ගමන් කියන්ට උණා "අනේ! කණේ උඹ අද ඉවරයි. අනේ කණේ උඹ අද ඉවරයි" කියලා.

ගඟට නාන්ට ආ ගෑනියක් මේ කතාව අහගෙන ගොඩ ඉඳලා සැත්තර කාරයා ගොඩ නැගෙන කොට ම ඇහුවා "දේවීන්නාන්සෙගෙ මාලෙ ගැන ද ඔය කිව්වෙ" කියලා.

මිනිහත් කිව්වා "ඔව් ඒ සැත්තරේ කියන්ට තමයි මම යන්නෙ" කියලා.

"අනේ අප්පේ ඒක නම් කියන්ට එපා. කණේ කියන්නෙ මට තමා. මම මාලෙ දෙන්නම්; මගෙ නම නම් කියන්ට එපා. මා මරයි තමා" කියලා මේ ගෑනි වැඳ වැටුණා.

සැත්තර කාරයාට කාරණේ තේරිලා කිව්වා හා එහෙනම් ගෙනෙන් මාලෙ; මම උඹේ නම නොකියා ඉන්නම් කියලා.

ගෑනි දුවලා ගිහින් හංගලා තිබුණ තැනින් මාලෙ ගෙනත් දුන්නා. මේ ගෑනි මාලිගාවෙ ම ඉන්න ගෑනියක්.



ඊට පස්සෙ සැත්තරකාරයා මාලෙ අරගෙන ගඟේ ගලක් යට හංගා තියලා මාලිගාවට ගියා. රජ්ජුරුවෝ ඇහුවා "හරියට සැත්තරේ කියන්ට හැකි ද?" කියලා "හැබැයි බැරි උණොත් කණත් කපනවා" කියලත් කිවුවා.

"හොඳයි දේවයන් වහන්ස, මම හරියට ම සැත්තරේ කියන්නම් කියලා පේවෙලා ගෙම හරියට ම මුතු මාලෙ තියෙන තැන කිව්වා. රජ්ජුරුවෝ අමාත්‍යයෙකු ඇරලා බැලුවාම මුතු මාලෙ තිබුණා.

ඉතින් බොහොම සැත්තර කාරයන්ට බැරිවුන සැත්තරේ හරියට කිව්වා කියලා රජ්ජුරුවෝ මිනිහට දහට දෙදහක් මසුරන් දුන්නා. ඊට පස්සෙ මිනිහා කිසි දුකක් නැතුව ගෙදර ඇත්තන්ගෙන් බැණුමුත් නාහා හොඳින් ජීවත් උණා.

# කුකුළන් දෙන්නා

එකමත් එක නුවරක රජ කෙනෙකුයි බිසෝ කෙනෙකුයි හිටියා. එක දවසක් මේ බිසව ඉඳගෙන ඉන්නකොට දුටුවා වහලෙ කූඩුවක් හදගෙන හිටිය ගේ කුරුල්ලා වෙන ද කිරිල්ලිය නැති ව වෙන කිරිල්ලියක් එක්ක ඇවිත් ඉන්න විග. මීට දෙතුන් දවසකට පස්සෙ බිසවට දකින්ට ලැබුණා කූඩුවෙ හිටිය ගේ කුරුළු පැටවුන් දෙන්නා ම මැරී වැටී හිටින වගත්. ඒ ගමන බිසව ළං වෙලා බලු-වාම දුටුවා මේ පැටවුන් දෙන්නාගෙ ම උගුරෙ කටු ගෙඩක් හිරවෙලා තියෙන විග. එයින් බිසව හිතා ගත්තා මොකක් හරි හේතුවකින් කලින් හිටිය ගේ කිරිල්ලි මැරිල කුරුල්ල වෙන කිරිල්ලියක එක්කරගෙන ආවා, ඒ ආ කිරිල්ලී ඉස්සරවෙලා හිටිය කිරිල්ලිගෙ පැටවුන් දෙන්නා ම මරා දමූවා කියලා.

මේ බිසවගෙත් පුතෙක් හිටියා. ඉතින් මේ බිසවට හිතුණා "අනේ ඉතින් මා නැති දවට රජ්ජුරුවන් වෙන බිසෝ කෙනෙක් ගෙනාවොත් මගෙ පුතාට යන කල දසාව මොකද්ද" කියලා.

මෙහෙම හිතලා මේ කාරණේ රජ්ජුරුවන්ට කීවා. එතකොට රජ්ජුරුවො කීවා, එහෙම දෙයක් සිද්ද වෙන්නෙ නැහැ කියලා. ඒත් ඊට පස්සෙ බිසව මේ ගැන ම හිතන්ට



වෙලා එයින් රෝගයක් හැදිලා ඒ රෝගෙන් බිසව මළා.

බිසව මළාට පස්සෙ රජ්ජුරුවො වෙන බිසෝ කෙනෙකු කරකාර බැන්ද. ටික කලක් යනකොට අර කීවා වාගේ ම මේ දෙවෙනි බිසව ඉස්සර හිටපු බිසවගෙ පුතාට වෙනස් කම් කරන්ට පටන් ගත්තා.

කුමාරයාත් මේ වෙනස් කම් ගණන් නොගෙන සමාදානෙන් ඉන්ට උත්සාහ කළා. මේන හැටියකටවත් ඉන්ට බැ; එන්ට එන්ට ම නරකයි, ඉතින් කුමාරයා කල්පනා කළා මේවා පිය රජ්ජුරුවන්ට පැමිණිලි කරලා වැඩක් නැ; ඒකත් මොකට ද පිය රජ්ජුරුවන්ගෙ හිත නරක් කරන්නෙ කියලා; එක දවසක් කාටවත් නොකියා මාලිගාවෙන් පිටවෙලා ගියා. මෙහෙම ගිය කුමාරයා රට රාජ්ජවල් බලන්ට යන්ට ඕනෑ කියලා හැම රටවල ම තොරතුරු බල බලා කලක් තිස්සේ ඇවිද්ද.

ඔහොම යන අතරෙ එක දවසක් කුමාරයා ගඟකින් එගොඩ වෙන්ට යනකොට හදිසියෙ ම ආ ගං වතුරකට මේ කුමාරයා ගහ ගෙන යන්ට උණා. කුමාරයාත් හුඟක් මහන්සි ගත්තා ගොඩට පීනන්ට. අලුත් වතුර නිසා හැඩ-පාර බොහොම කදයි. ඒ ගමන කුමාරයා හිතුවා "මට කොහෙගේ ගියත් එකයි නේ; හොඳයි ගඟ පහළට ඔහෙ ගියාවෙ" කියලා පාවෙන ලීකොටයක් බදාගෙන ගඟ පහළට පාවෙවී ගියා.

ඔය ගඟ අයිනෙ පහළ හිටියා ඉස්සර පොහොසත් හිටපු පවුලක දුන් දුප්පත් වෙලා ඉන්න හිටපු කුමාරියක්. මේ කුමාරි නාන්ට ඇවිත් ගඟ ළඟ ඉන්න කොට දුටුවා මේ කුමාරයා ගඟේ පාවෙලා යනවා. දකලා හනික පීනා

ගිහින් කුමාරයා ගොඩට ගෙනාවා. ගොඩට ගෙනත් ගෙදර දුවලා ගිහින් සළුවක් හැරිය. ගෙනැවිත් අඳින්ට දීලා ගෙදර කැඳවූව ගියා.

ඊට පස්සෙ මේ කුමාරයා රටින් රට ඇවිදින්ට ගියේ නැහැ. මේ හිටපු කුමාරිත් එක්ක දුප්පත්පහට එහෙ ජීවත් උණා. මේ දෙන්නා එක්කෙනාට එක්කෙනා බොහෝම ආදරෙයි. ඒ වගෙ ම මේ දෙන්නා ම ගඟටත් ආදරෙයි. දෙන්නාට දෙන්න මුණ ගැස්සුවෙ ගඟ විතරය කියලයි. ගඟට නාන්ට යන එක මේ දෙන්නා හැම දම නොවරදවා කරන දෙයක්. මේ ගඟ ළඟ එක තාපසයෙක් හිටියා. මේ දෙන්නා හැම දම මේ තාපසයාට උපස්ථානත් කරනවා.

ඔහොම යනකොට එක දවසක් මේ කුමාරියයි කුමාරයයි දෙන්නා නාන කොට ගඟේ පාවෙලා ආවා බත් මුලක්. කුමාරයා මේ බත් මුල ඇරගෙන බැලුවාම එකෙ තිබුණෙ කුකුළු මසුයි බතුයි.

"කාගෙ බතක් ද දන්නෙ නැතුව මේක කන්ට හොඳ ද?" කියලා කුමාරයා කීවාම කුමාරි කීවා "මේ ගඟෙන් අපට නරකක් එන්නෙ නැ. මේ ගඟේ එන්නෙ අපේ වාසනාව තමා" කියලා.

ඒ ගමන දෙන්න එක්ක ම කතා කරගෙන තාපසයාන්ටත් මෙයින් කොටසක් පිළිගන්වන්ට ගියා ඒ තාපසයා ඉන්න පන්සලට.

මේ තපසයා දිව්‍ය ඇස තියන තාපසයෙක්. ඉතින් මේ බත කොයින් ද කියලා දිවසින් බලලා හිනාවෙලා කීවා "හොඳයි එහෙම නම් මට ඔය ඇට තියන මස්වලින්



ටිකක් දෙන්ට" කියලා. ඊට පස්සෙ තාපසයා කුමාරයට කන්ට කීවා හොඳ ම මස, ඊළඟ මස කුමාරිට කන්ට කියා කීවා.

නැම කාලා ඉවර උණායින් පස්සෙ තාපසයා කීවා "වෙන්ට තියන දෙයක් වළක්වන්ටත් බැහැ. වෙන්ට බැරි දෙයක් සිද්ද කරන්ටත් බැහැ. දන් ඉතින් බලන්ට අහවල් රටේ අහවල් නුවර අහවල් දේවාලය ළඟ ගහක කුකුළො දෙන්නෙක් හිටියා.

එක දවසක් රාත්තිරියෙ මේ එක කුකුළෙක් පහළ අත්තෙ හිටිය උඩින් කුකුළගෙ ඇඟට පැහැරුවා. එතකොට යට හිටිය කුකුළා කීවා "උඹ මගේ ඇඟට පහරන්නෙ ඇයි?" කියලා. එතකොට අනික් කුකුළා කීවා "වැරදීමකින් දන්නෙ නැතුව එහෙම උණා" කියලා. කියන ගමන් ආයෙත් වරක් පැහැරුවා.

ඒ ගමන යට හිටිය කුකුළාට තරහ ගිහින් කීවා "උඹ ඉස්සරවෙලා නොදැන පැහැරුවා. දන් දැනගෙන පැහැරුවා. උඹ දන්නෙ නැහැ මං නොයි තරම් වටින කෙනෙක් ද කියලා. යම් කෙනෙක් මගේ මස් කෑවොත් එදට මිසුරන් දහක් ලබන්ට වාසනාව තිබෙනවා" කියලා.

එතකොට ඉහළ අත්තෙ හිටිය කුකුළා කියනවා "ඔකත් මහ හාටියක්ද, යම් කෙනෙක් මගෙ මස් කෑවොත් එයා තුන් දවසකින් රටේ රජකම ලබනවා— ගෑනියක් ඒ මස් කෑවොත් අග බිසෝ කෙනෙක් වෙනවා. යම් කෙනෙක් මගෙ ඇටත් එක්ක තියන මස කෑවොත් රාජ කුළුපග වෙනවා" කියලා.

ඒ ගහ යට තියෙන දේවාලේ ඉඳගෙන මේ කතාව අහගෙන හිටිය මිනිහා දර කපා විකුණලා ජීවත්වෙන එක දුප්පත් මිනිහෙක්. මේ මිනිහා රටේ රජකම ගන්ට ඇත්නම් කොච්චර දෙයක් ද කියලා අර ගහට නැගල උඩ අත්තෙ හිටිය කුකුළා අල්ලා ගෙදර ගෙන ගියා.

ගෙදර ගිහින් අඹුවටත් කියලා කුකුළා කපලා උයලා ඉවරවෙලා "මේක මහ උතුම් කෑමක් නිසා හොඳා කන්ට නරකයි, අපි දිය නාලා මේක කමුයි" කියලා දෙන්නා දෙමල්ලෝ බතුත් කුකුළු මසුත් මුල බැඳගෙන ගිහින් බත්මුල ගඟේ වැල්ලෙ තියලා නාන්ට පටන් ගත්තා. මේ මේ අතර හදිසියේ ගං වතුරක් ඇවිත් මේ බත්මුල වතුරට ගහගෙන ගඟේ පාවෙලා ආවා. මේ දෙන්නා මේ ගෙනත් මටත් දීලා කැවේ ඒ කුකුළාගෙ මස යි. ඉතින් මේ කුමාරයා තව තුන් දවසකින් මේ රටේ රජකම ලබනවා මේ කුමරි අග බිසෝ වෙනවා" කියලා.

කුමාරි යි කුමාරය යි බොහෝම සන්තෝස වෙලා තාපසයන්ට වැඳලා ගෙදර ගියා. අර කීවා වාගෙ ම තුන්වෙනි දවසෙ ඒ රටේ රජ්ජුරුවෝ මැරිල පුතෙකුත් නැ කියලා මඟුල් ඇතා ඇවිත් මේ කුමාරයාට දණ ගැහුවා. ඉතින් කුමාරයාත් කුමාරිත් ගිහින් ඒ රටේ රජ්ජුරුවොත් බිසවත් උණා.



# නාග කුමාරයා

එකමත් එක රටක සිටාණ කෙනෙකුයි සිටු දේවියකුයි හිටියා. මේ දෙන්නට ඇති තරම් වස්තුව තිබුණට එක දරුවෙක්වත් හිටියෙ නැ. ඉතින් මේ සිටුදේවිය වෙන රටේ දරුවන් ඇති අම්මාලා දකිනකොට තමන්ට දරුවන් නැති ශෝකෙට අඬන්ට පටන් ගන්නවා. දරුවෙකු ලබා දෙන්නෙ නැ කියලා සිටාණන්ටත් වසපල කියන්ට පටන් ගන්නවා.

මේ කාරණය ගැන සිටාණන්ටත් හිතට දුකයි. ඉතින් සිටාණෝ සාස්තරකාරයෙක්ගෙන් ඇහුවා දරුවෙකු ලබන්ට තමන්ට වාසනාවක් නැද්ද කියලා. ඒ ගමන සාස්තර කාරයා කීවා, දෙවියන්ට පුද පූජා පවත්වලා බාරහාර උණොත් දරුවෙකු ලබන්ට පුළුවනි කියලා.

ඊට පස්සෙ සිටාණෝයි සිටු දේවියයි දෙන්න ම දේවාලෙට ගිහින් හැමදම කෙම්මුර දට පූජා පවත්තලා දෙවියන්ට කන්නලව් කරනවා පුතෙකු ලැබෙන්ට කියලා. මාස ගණනක් තිස්සෙ මෙහෙම පුදපූජා පවත්වාගෙන යන කොට එක දවසක් දෙවියා පෙනී ඉඳලා මේ දෙන්නට කතා කර කීවා "තොපට හොඳ රූපවත්ත, ගුණවත්ත, බලවත්ත පුතෙකු ලැබෙයි" කියලා.

සිටාණෝයි සිටු දේවිය යි මේ ,ගැන බොහොම සන්තෝස වෙලා හිටියා. මෙහොම ඉන්නකොට ඔන්න සිටු දේවියත් ගැබ්බර උණා. සිටාණෝත් ගැබ්බර දේවිට

කරන්ට කියන වතාවත් ඔක්කොමත් කළා. නව මාසයක් ගියායින් පසුගෙ හිටු දේවිට දරුවා ලැබෙන්ට දවසත් ළං වුණා. හිටාණෝත් බොහොම ආඩම්බර වෙලා හිටියා.

ඔන්න ඉතින් නියම දවස පැමිණුනාම හිටු දේවිය වැදුවා - හැබැයි උපන්නේ කුමාරයෙක් නෙමෙයි නයි පැටියෙක්.

ඉතින් වින්නඹු අම්මත් අනිත් ගෑනුත් බයවෙලා මේ නයි පැටියා මරලා කැලේට විසි කරන්ට හැදුවා. ඒත් හිටු දේවි එහෙම කරන්ට ඉඩ දුන්නෙ නෑ. "මගෙ දරුවා නයි පැටියා උණත් මට හොඳයි" කියලා, ඒ නයි පැටියා නාවලා වඩාගෙන කිරි පෙව්වා. පුතෙකුට වගේම හොඳට සාත්තු සප්පායම් කරලා මේ නයි පැටියා හදාගනකොට ඌත් ලොකුවෙලා තරුණ වයසටත් පැමිණුණා.

ඒත් හිටාණෝ මේ නයි පැටියා ගැන කැමතිමක් කළේ නැහැ. හිටාණෝ හිටියෙ මේ ගැන බොහොම හිත හතස්සල්ලෙන්. ඒ කියා හිටාණෝ හිටු දේවි එක්කවත් වැඩි මනාපයක් තිබුණෙ නෑ නයි පැටියා උපන් ද ඉඳලාම.

එක දවසක් අහල ගෙදරක මඟුල් කටයුත්තක් ඇති වෙලා බෙර ගහනවා රබන් ගහනවා එක මඟුලයි. එතකොට හිටු දේවියටත් කාරණයක් මතක් වෙලා ගිහින් හිටාණන්ට කතා කරලා කීවා.

"උඹලා මා ගැනවත් මගෙ පුතා ගැනවත් කිසි සැලකිල්ලක් කරන්නෙ නෑ. ඉන්නව ද නැද්ද කියලාවත් හෙවිල්ලක් නෑ" කියලා.



එතකොට හිටාණෝ කීවා, "මොකද්ද දේවිය මට කරන්ට කියන්නෙ. මං මොන කාරියද නොකර හිටියෙ" කියලා.

හිටු දේවි කීවා; "දැන් මගෙ පුතා වයස සම්පූර්ණ වුණු තරුණයෙක් නේ. එයාට ගැලපෙන කුමාරියක් හොයලා ගෙනත් දෙන්ට එපා ද" කියලා.

හිටාණෝ කීවා, "කරන්ට පුළුවන් දෙයක් එපා ද දේවි කියන්ට. නයෙකුට කවුද සතයක් දෙන මිනිහා. මොකද මේ පොළොව පළාගෙන නාග ලෝකෙට ගිහින් නා රජ්ජුරුවන්ගෙ දුවක් කතා කරගෙන එන්ට ද" කියලා.

හිටු දේවි කීවා. "මගෙ පුතා නාග කුමාරයෙක් නෙමෙයි හිටු කුමාරයෙක්. මේ රටේ වෙන ගෙදරවලට කුමාරිකාවුන් කැටුව එන සිරිතට මොකද කුමාරියක් කැටුව එන්ට බැරි වුවමනාකම තියෙනවානම්" කියලා.

මේ කාලෙ කුමාරයෙකුට කුමාරියක් ගෙනෙන කොට ඒ කුමාරයා පෙනෙන්ට යන්නෙ නෑ. පස්සෙවට තමයි ගිහින් කුමාරි අඬගහගෙන එන්නෙ.

ඉතින් හිටාණන්ට මේක මහ අමාරු කාරියක්. නාගයෙකුට කුමාරියක් ගෙනත් දීලා අපවාද අහන්ටත් බෑ. දේවිගෙ හිත නරක් කරන්ටත් බෑ. ඒ පාර හිටාණෝ හිතාගත්තා "ළඟ පාතකින් නම් අමාරුයි හොරටකවත් ගිහින් කුමාරියක් හොයාගෙන එන්ට ඕනැ" කියලා දුර ගමනකට යන්ට කලමනා සූදානම් කරගෙන එක දවසක පිටත්වෙලා ගියා.

හිටාණෝත් දවස් ගණනක් නිස්සෙ රටවල් කීපෙකම ඇවිදලා ඇවිදලා සාර්ථකයක් නැතුව අන්තිමට ගියා තමන්ගෙ යාළු හිටාණ කෙනෙක් ඉන්න නව රටකට.

ඒ රටේ දී යාළු සිටාණෝ මේ යාළුවා දකලා ගෙදරට අඬගහගෙන ගිහින් නාවලා, අලුත් සළු ඇන්දවලා කවලා පොවලා සැතපෙන්ට ගෙම දීලා ඊට පස්සෙ ඇහුවා "මේ බොහොම වෙහෙස අරගෙන මෙච්චර මේ දුර කොහෙ ද මේ කඩියම් යන්නෙ" කියලා.

එසකොට සිටාණෝ කීවා "මගෙ පුතෙක් ඉන්නවා වියස සම්පූර්ණ වෙලා. ඉතින් පුතාට සරණයක් කර දෙන්ට සුදුසු කුමාරියක් හොයා හොයා රටින් රට ගියා" කියලා.

මේ කතාව අහපු යාළු සිටාණෝ කීවා "එහෙනම් යාළුවෙ ඔය කාරණේට ඔච්චර දුර යන්ට ඕනෑ නෑ. මගෙ ඉන්නවා වයස සම්පූර්ණ වෙච්ච දුවක්. රාජ කුමාරයෙකුට වුණත් ගැළපෙනවා. එහෙම නම් මගෙ දුව කැටුව යන්ට" කියලා.

මේ සිටාණෝත් එහෙම නම් හොඳ යි කියා යෝජනාවට කැමති උණාම යාළු සිටාණෝ දූ කුමාරි සරසලා පිරිවර ගැනුත් එක්ක කැටුව යන්ට යාළු සිටාණන්ට බාර දුන්නා.

ඉතින් මේ කුමාරි නාග කුමාරයාට කරකාර බැඳලා දෙන්ට මේ නුවර සිටාණන්ගෙ ගෙදරට කැටුව ආවයින් පස්සෙ අහල පහල ගැනු එකතුවෙල අසම්පාල වෙන්ට පටන් ගත්තා:

"අනේ! මේ මැණික් කැටයක් වගේ, මුතු ඇටයක් වගේ, රන් රූපයක් වගේ මෙච්චර මේ අපූරු කුමාරියක් මේ නයි පැටියකුට දෙන්ට ගෙනාවෙ මොන විකාරෙකින් ද" කියලා.



මේ කතාවට කුමාරිගෙ පිරිවර ගැනු බයවෙලා "අනේ! අපි දන්නෙ නෑ නේ, මේ නයි පැටියෙකුට කරකාර බැඳ දෙන්ට කැටුව ආ වගක්. අපි මේ හිතා හිටියෙ සිටු කුමාරයෙකු කරකාර බඳින්ට එනවා කියල නේ. අනේ එහෙනම් අපි අපේ කුමාරි ආපහු කැටුව යනවා" කියා කීව.

මේ කතාව අහගෙන හිටිය අර සිටු කුමාරි එකපාරට ම කීවා "ඒ ගැන උඹලා කාටවත් කතාවක් නැ. මම ආපහු යන්නෙ නෑ. එක කුමාරියකට සරණ යනවා කියලා යන්ට පුළුවන් එකම එක වාරය යි. ඒ වාරය තමා මම මේ ආවෙ. මගෙ ලැබීමේ හැටියට මට ලැබුණ ස්වාමියා කවුරු උනත් මම භාරගන්ට ඕනෑ" කියලා.

ඊට පස්සෙ මේ සිටු කුමාරිත් අර නාගයත් සමග සරණ මංගල්ලෙ සිද්ද කළා. කුමාරිත් කිසි අමුත්තක් නැතුව ස්වාමි පුරුෂයාට කරන සාත්තර ඔක්කොම ඒ නයාට කළා. කුමාරිගෙ ගෙයිම හොඳ යහනාවක මේ නයි කුමාරයාත් නිදගත්තා.

එක දවසක් රාත්තිරියේ කවුදෝ අපූරු රූව ඇති කුමාරයෙක් මේ කුමාරිගෙ යහනාවට නැගලා ඉඳ ගන්න කොට කුමාරි අවදිවෙලා "කවුද? කවුද?" කියලා කෑ ගහගෙන පැනලා දොර ඇරගෙන පිටවෙලා දුවන්ට හැදුවා.

එතකොට අර කුමාරයා කීවා "බය වෙන්ට එපා, මම තමා ඔබේ ස්වාමියා" කියලා.

ඒත් කුමාරි කීවා "එක මම විශ්වාස කරන්නෙ නෑ. අණ ඇත්නම් දැන් මෙතනින් පිටවෙලා යන්ට" කියලා.

ඒ ගමන කුමාරයා කීවා "මා කීවට විශ්වාස නැත්නම් බලන්ට ඔය යහාව උඩ තියෙන නයි හැව" කියලා. ඒත් විශ්වාස නැතුව කුමාරි බලා ඉන්න කොට කුමාරයා හෙමින් හැරී නැගිටලා ගිහින් නයි හැව ඇඟලට පිංගලා නයි රූපෙ පෙන්නලා ආයින් නයි හැවෙන් පිටවෙලා හිටියා.

ඊට පස්සෙ කුමාරි කාරණේ විශ්වාස කරලා බොහො ම සන්තෝෂ වෙලා කුමාරයා වැළඳ ගත්තා.

මේ විත්තිය ඇහුව හිටාගෙන පසුවද හොරෙන් ම ඇවිත් අර නයි හැව පුච්චලා දැම්මා. හිටු කුමාරයාට ආයෙත් නාග වේශෙ ගන්ට බැරුව ගියා. ඊට පස්සෙ හතර දෙනාම බොහො ම සන්තෝසෙන්, එහෙ හිටියා.



# අකුරට නොගිය කුමාරයා

එකමත් එක රජ්ජුරු කෙනෙකුට හිටියා බාල පුත්තු දෙන්නෙක්. මේ දෙන්නාගෙන් බාලම එක්කෙනා අකුරට යන්ට හැම දම මාලිගාවෙන් පිටත්වෙලා යනවා. ඒත් වැඩිමලා ඉගෙන ගන්ට යන්නෙ නෑ. ගඟට බැහැලා සෙල්ලම් කර කර ඉඳලා බාල මල්ලි ඉගෙන ගෙන ඉවර වෙලා ආපහු එන වෙලාවට එකතුවෙලා මාලිගාවට යනවා.

ඕහොම කලක් ගියාට පස්සෙ එක දවසක් රජ්ජුරු-වො මේ දෙන්නා අඬගහලා පාඩම් බැලුවා. බාල පුතා හොඳට ඉගෙනගෙන තිබුණා. ඒත් වැඩිමලා මොකවත් ඉගෙනගෙන තිබුණෙ නෑ.

කාරණේ මොකද කියලා රජ්ජුරුවො බාල පුතාගෙන් ඇහුවාම බාලයා කීවා "අයියා මග නතරවෙලා සෙල්ලම් කර කර ඉන්නවා මිස අකුරට යන්නෙ නෑ කියලා.

රජ්ජුරුවො මේ කාරණේ අහලා ඉගෙන නොගන්න මෝඩ පුතෙකුගෙන් මට ඇති වැඩක් නෑ කියලා වැඩිමල් ම ලොකු කුමාරයාට කතා කරලා කීවා මේ කුමාරයාගෙ ඉස ගහ දමන්ට කියලා.

ඒ ගමන වැඩිමල් ම කුමාරයා මේ මල්ලි එක්කලා හේනකට ගිහින් මලයා හංගලා තියලා කවුස්සකු මරලා කඩුවෙ ලේ ගාගෙන ඇවිත් රජ්ජුරුවන්ට පෙන්නුවා.

මලයගෙ හිය ගඟ දැමුවයි කියලා. පස්සෙ කුමාරයාගෙ මව් බිසව රාත්තිරියෙ කුමාරයා ළඟට කැඳවාගෙන බත් මුලකුත් දීලා කිව්වා තොගේ හරි වෙන රටකට යන්ට කියලා.

මේ කුමාරයා රටින් පිටවෙලා තනියම මඟ බැහැලා යනකොට එක තැනකදී දුටුවා කල්ගස් පොල්ගස් ගළවා ගෙන වැටක් බඳින්ට යන මිනිහෙකු. කුමාරයා මේ මිනිහාට කතා කර ඇහුවා "මාත් එක්ක යන්ට එන්ට කැමතිද?" කීයා.

ඒ මිනිහත් "හා හොඳයි" කියා කැමති උණාම දෙන්නා එක්ක බත් මුල බෙදාගෙන කාලා පිටත්වෙලා ගියා. ඕහොම ගිහින් ගිහින් රෑ වෙගෙන එනකොට නතර වෙන්ට තැනක් බැලුවා. එතකොට හම්බ උණා එක රාක්ෂසියකගෙ ගෙදරක්. කුමාරයා, එක්ක ගිය යෝදයට කතා කර කීවා "අර ගෙදරට ගිහින්, අපට උයා පිහා ගන්ට කළමනා ටිකක් දෙන්ට හැකි ද අහන්ට" කියලා.

යෝදයා ඒ ගෙදරට යනකොට රාක්ෂසී ලිඳ ළඟ දිය ඇද ඇද හිටියා. මේ යෝදයා ගිහින් "අපට උයා පිහා ගන්ට කළමනා ටිකක් දෙන්ට හැකි ද" කියා ඇහුවාම රාක්ෂසී කීවා "අනේ මන්ද බැරි, අර කුස්සිය තියෙන්නෙ ඕනෑ කරන දෙයක් ගිහින් ගන්ට" කියලා.

යෝදයා කුස්සිය ඇතුළට ගියාම රාක්ෂසී ගිහින් යෝදයට එළියට එන්ට බැරි වෙන්ට දොර වහලා දැමුවා. මෙහෙම ඇවිදින් අල්ලා ගන්න මිනිසුන් පස්සෙ මේ රාක්ෂසී මරාගෙන කනවා.

නුහුඟක් වෙලා බලාගෙන හිටියා; යෝදයා එන පාටක් නැ; ඒ ගමන කුමාරයා ගියා බලන්ට. ඒ යනකොටත්



රාක්ෂසී දිය වක්කර වක්කර හිටියා. ඉතින් කුමාරයා ඇහුවා "මෙහාට එක මිනිහෙක් ආවෙ නැද්ද උයන පිහන කළමනා ඉල්ලන්ට" කියලා.

රාක්ෂසී කිවුවා "අනේ නැ, මෙහාට කවුරුවත් ආවෙ නැ." කියලා.

ඉතින් කුමාරයා කීවා; "හොඳයි එහෙනං කාරියක් නැ. අපට රෑට උයා පිහාගෙන කන්ට කළමනා ටිකක් දෙන්ට බැරිද?" කියලා. එතකොට රාක්ෂසී කීවා "අනේ මන්ද බැරි, අර තියෙන්නෙ කුස්සිය ගිහින් වුවමනා දෙයක් ගන්ට" කියලා.

මේ කතාවෙන් කුමාරයාට හැක හිතුනා. මේ නම් රාක්ෂසියක්. මා එව්වු යෝදයා අල්ලා හංගලා තියන්ට ඇති කියලා. එහෙම හිතලා කුමාරයා කුස්සියට නොගොසින් රාක්ෂසී ළඟට ගිහින් ඇඟේ කෙහෙ වැල්ලෙන් අල්ලාගෙන කඩුව උරුක්කර කීවා "නී රාක්ෂසී, මගෙ යෝදයා අල්ලා ගත්තෙ නී තමා. මම දැන් නී මරා දමනවා" කියලා.

එතකොට රාක්ෂසී වැඳවැටිල කීවා "අනේ මා මරන්න එපා. මම යෝදයත් දෙන්නම් වෙන ඕනෑ උදව්වකුත් කරන්නම්" කියලා.

කුමාරයා රාක්ෂසී නොමරා ඉතිරි කළා. ඒ ගමන රාක්ෂසී අර යෝදයවත් දීලා දෙන්නාට කන්ට බොන්ටත් දුන්නා.

ඊට පස්සෙ කුමාරයාත් යෝදයාත් දෙන්නා ම පිටත් වෙලා ගියා. ඕහොම ගිහිං ගිහිං වෙන රටකට ගියාම ඒ රටේ

මිනිස්සු නෑ යක්ෂයකුට බයේ පැන ගිහින්. මේ දෙන්නා රටේ ඇවිදගෙන යනකොට එක මාලිගාවක කුමාරියක් විතරක් හිටියා. ඉතින් කුමාරයා ගිහින් රට නවාතැන් දෙන්ට පුළුවන් ද කියලා ඇහුවාම කුමාරි කීවා "අනේ මොකට මෙහෙකට ආව ද මේ රටට? මේකට යක්ෂයෙක් ඇවිත් මිනිසුන් මරාගෙන කනවා. ඒ නිසා රටේ උන්න මිනිස්සු ටිකත් රට ඇරලා ගිහින්. අද මගෙ වාරෙයි යක්ෂයා අද මා අල්ලාගෙන යන්ට මේ ගෙදරට එනවා" කියලා.

කුමාරයා ඇහුවා, "එහෙනං ඇයි අනිත් මිනිස්සුන් එක්ක රට ඇරලා නොගිහින් කුමාරි විතරක් තනියම ඉන්නෙ යකාට බිලි වෙන්ට" කියලා.

කුමාරි කීවා "මගෙ යාළු කුමාරයෙක් ඉන්නවා. එයා මේ යකා මරලා මා බේරගන්ට එනවා; ඒ නිසා බය නැතුව ඉන්නවා" කියලා.

"හා එහෙනං අපටත් බලන්ට බැරියැ, අපිත් මෙහෙන් ඉන්නං" කියා කුමාරයාත් යෝදයාත් එතනා ම නතර උණා.

ඔන්න ඉතින් ඒ වෙලා යකා එන වෙලාවත් ළං උණා. ඒත් අර එනවා කිව යාළු කුමාරයා නං ආවෙ නෑ. එතකොට කුමාරි අඬන්ට පටන් ගත්තා. ඉතින් මේ කුමාරයා ඇහුවා "ඔය යකා එන්නෙ කොයි වේලාවට ද?" කියලා.

කුමාරි කීවා "රෑ උණම යකා එනවා. ඒ එන්ට කලින් දොළොස් ගව්වක් තියෙද්දි යකා එක හූවක් කියනවා. ආයෙ අට ගව්වක් තියෙද්දි තව හූවක් කියනවා. අනිත් හූව කියන්නෙ දොරකඩට ඇවිදිනුයි කියලා.



"හා එහෙනං හූ දෙකක් කිවුවායින් පස්සෙ මට කතා කරන්ට" කියා කුමාරයා නිදා ගත්තා. ඔන්න රාත්තිරියෙ පළමුවෙනි හූව ඇහෙන කොට ම කුමාරිගෙ ඇස්වලින් කඳුළු වැටෙන්ට උණා. ඒ ගමන කුමාරි අර කුමාරයට කතා කළා. එතකොට අනිත් හූවත් ඇහුණා. කුමාරයා කඩුවත් අතට අරගෙන සූදානම් වෙලා හිටියා. එතකොටම යකා තුන්වෙනි හූවත් කියාගෙන කඩුල්ල ළඟට ආවා. යකා එතකොට ම කුමාරයා ඉස්සරහට පැනලා යකාට කෙටුවා— නමුත් යකා මළේ නැහැ. කොච්චර හයියෙන් කඩුවෙන් කෙටුවත් මේ යකා මරන්ට බැහැ. කුමාරයාත් එහාට මෙහාට පැන පැන කෙටුවා කෙටුවා යකා මරන්ට. ඒ ගමන කුමාරයා හිතුවා "අනේ මම අර නිදහස් කරපු රාක්ෂසියත් ඇවිදින් මට මේ යකා මරලා දෙනවනං" කියා හිතනකොට ම රාක්ෂසි ඇවිදින් ඉස්සරහට පැනලා යකාගෙ ඉස්මුදුනෙ කඩුවක් ඇන්නා. එතකොට යකා මළා.

ඊට පස්සෙ කුමාරි ඒ කුමාරයාත් එක්ක ඒ මාලිගාවෙ ම හිටියා. ඔහොම ඉන්න කොට එක දවසක් එක මැලි ගැනියක් ඇවිත් "යන්ට එන්ට තැනක් නෑ කියලා තියන වැඩක් පලක් කරගෙන මාලිගාවෙ ඉන්ට ද" කියා ඇහුවා. මේ කුමාරයාත් හා කියලා ඇයට ඉන්ට දුන්නා.

ටික දවසක් ගියාට පස්සෙ මේ මැලි ගැනි කුමාරිගෙ ඉස නිය අතින ගමන් කුමාරිට කීවා "කුමාරයා කුමාරිට ආදරේ නම් එයාගෙ පණ තියෙන්නෙ කොහෙ ද කියන්ට එපා ද— ඒක අහල බලන්ට" කියලා.

කුමාරිත් කුමාරයාගෙන් ඇහුවා පණ තියෙන්නෙ කොහෙද'' කියලා. කුමාරයා කිව්වා තමන්ගෙ පණ තියෙන්නෙ බෙල්ලෙයි කියලා.

මේ විත්තිය මැලි අම්මාට කිව්වම ඈ කිව්වා "ඒ බොරු, කුමාරයාගෙ පණ තියෙන්නෙ බෙල්ලෙ නෙමෙයි" කියලා.

ඊට පස්සෙ කුමාරි දෙවෙනිවත් ඇහුවා කුමාරයාගෙන් "පණ තියෙන්නෙ කොහෙද කියන්ට" කියලා.

කුමාරයා ඒ ගමන කිව්වා "මගෙ පණ තියෙන්නෙ මගෙ පපුවෙ" කියලා.

ඒ ගමනත් මැලි අම්මා කිව්වා "ඒත් කියන්නෙ බොරු, කුමාරයාගෙ පණ තියෙන්නෙ පපුවෙත් නෙමෙයි" කියලා.

ඊට පස්සෙ කුමාරි තුන් වෙනුවත් ඇහුවා කුමාරයාගෙන් "පණ තියෙන්නෙ කොහෙද කියන්ට" කියලා.

ඒ ගමන කුමාරයා කිව්වා "මගෙ පණ තියෙන්නෙ මගෙ මේ කඩුවෙ" කියලා. කුමාරි මේ කතාව මැලි අම්මට කිව්වා.

ඕකත් හිතේ තියාගෙන ඔහොම ඉන්නකොට එක දවසක් කුමාරයා නින්දට ගිය වෙලේ මැලි අම්මා හොරෙන් ම කුමාරයාගෙ කඩුව ඇරගෙන ගිහින් ලිපට දැම්මා— කඩුව පිච්චිලා ඔපේ යනකොට කුමාරයා මළා.

කුමාරයා මළාට පස්සෙ මැලි අම්මා කුමාරිත් ඇරගෙන මාලිගාවෙන් පිටවෙලා ගියා. කුමාරයාගෙ යාළු



යෝදයා පස්සෙ ඇවිත් බැලින්නම් කුමාරයා මැරිලා — කුමාරයාගෙ පණ තියෙන්නෙ කඩුවෙ බව යෝදයා දැනගෙන හිටියා. ඉතින් යෝදයා හොයාගෙන හොයාගෙන යනකොට දකින්ට ලැබුණා කඩුව ලිපේ දාලා පිච්චිලා ඔපේ ගිහින් තියන වග.

ඒ ගමන යෝදයා මේ කඩුව ඇරගෙන ගිහින් දෙහි උලී උලා මැදගෙන යනකොට කඩුව ආයෙත් ඔප වැටුණා. එතකොට ඒ කුමාරයත් නැගිටලා හිටියා.

කුමාරයා නැගිටලා බැලින්නම් කුමාරි නෑ. මැලි අම්මත් කැටුව ගිහින්. ඒ ගමන කුමාරයා කඩුවයි ඇරගෙන යෝදයත් කැටුව ගියා කුමාරි බලන්ට.

හොයාගෙන හොයාගෙන යන කොට කුමාරයාට දැනගන්නට ලැබුණා කුමාරි රටේ රජ්ජුරුවො ඇරන් ඉන්න වග— කුමාරයා ගිහින් රජ්ජුරුවන්ගෙන් ඇහුවා "මෙහෙම මැලි අම්මා කෙනෙකුයි කුමාරියකුයි ආව ද" කියලා.

රජ්ජුරුවො කිව්වා "නෑ එහෙම කවුරුවත් ආවෙ නෑ" කියලා. ඒත් කුමාරි හිටියා රජ මාලිගාවේ. ඒ ගමන කුමාරයා රජ්ජුරුවන්ට කඩුවෙන් කොටලා රටේ රජකමත් ඇරගෙන කුමාරිත් එක්ක සතුටින් හිටියා, යෝදයාට ඇමතිකම් දුන්නා.

# පුළුන් රොද

ඉස්සලින් එක නුවරක අක්කා නංගී දෙන්නෙක් හිටියා. මේ දෙන්නාට ම ගැනු දරුවො දෙන්නෙකුත් හිටියා. එක දවසක් මේ නංගා එළියෙ ඉඳගෙන කපු කැට කැට ඉන්නකොට ඇගේ පොඩි දුවත් එතෙන්ට ඇවිත් පුළුන් සුද්ද කරන්ට පටන්ගත්තා. මේ ළමයා පුළුන් සුද්ද කර කර ඉන්නකොට ලොකු හුළඟක් ඇවිදින් ළමයා අතේ තිබුණ ලොකු කපු පුළුන් රොදක් ඈළඟට ගහගෙන ගියා. ඉතින් ඒ වෙලේදිට ළමයාගේ අම්මා ළමයාට කලලා කීවා ගිහින් තියෙන තැනකින් පුළුන් ටික හොයාගෙන මිස නැත්නම් ගෙදර එන්ට එපා කියලා. අනේ, මේ ළමයාත් අඬ අඬා කපු පුළුන් ටික හුළඟෙ ගිය අතට යන්ට ගියා.

ඒ යනකොට ළිඳක් ළඟ හොඳට ම මැලි ගැනියක් හිටිලා මේ ළමයට කතා කර කීවා "අනේ දුවේ දෙතුන් දවසකින් නාගන්ට බැරි වුණා. මට මෙකෙත් දිය ගන්ට බැහැ. දිය ටිකක් ඇදලා වක්කරලා පලයන්" කියලා.

ළමයාත් නැවතිලා ඒ මැලි ගැනි නාවලා යන්ට ගියා. යනකොට මැලි ගැනි කීවා "අනේ උඹට හොඳක් ම වෙයි දුවේ" කියලා.

ඉතින් මේ ළමයා ටිකහාම යනකොට කඳ අව්ව තියෙන තැනක බැඳලා උන්න එළදෙනක් ළමයට කතා කර කීවා "අනේ දුවේ මාව පර සෙවණෙන් බැඳලා පලයන්" කියලා.



ළමයා නැවතිලා එළදෙන සෙවණෙන් බැඳලා යන්ට ගියා, යනකොට එළදෙන කීවා "අනේ උඹට හොඳක් ම වෙයි දුවේ" කියලා.

ඒ කාරියත් කරලා ළමයා ආයෙත් යනකොට දුටුවා පුළුන් රොද රේ රුකක පැටලිලා ඉහළ තියෙනවා. ඉතින් ඒක ගන්ට කොක්කක් බදිනකොට රජ්ජුරුවො එතනින් යන්ට ආවා. රජ්ජුරුවො ළමයා දැකලා මොකද කරන්නෙ කියලා අහලා ළමයාට කීවා "හොඳයි මම මය පුළුන් ටික අරගෙන එන්නම්. උඹ මගෙ මාලිගාවට ගිහින් බත් ටික උයා දෙනවා නම්" කියලා.

ඉතින් මේ ළමයාත් බැ නොකියා ගිහින් බත් උයන්ට පටන් ගත්තා. ගෙදර දොරේ වැඩ කරලා පුරුදු ඇති ළමයා නිසා බතුත් මාළුත් හොඳට ඉව්වා.

ඊට පස්සෙ රජ්ජුරුවො පුළුන් ටික අරගෙන මාලිගාවට ගිහින් හොඳයි එහෙනං අපි බත් කමු කියලා රජ්ජුරුවො බත් කාලා ළමයාටත් කන්ට දීලා ළමයා මාලිගාව ඇතුළට අඬගහගෙන ගිහින් ලොකු පුංචි පෙට්ටි ගොඩක් පෙන්නා කීවා මෙන්න මේ පෙට්ටි වලින් කැමති පෙට්ටියක් තෝරලා අරගෙන යන්ට කියලා.

ඉතින් ළමයත් පෙට්ටි දිහා ටිකක් වෙලා බලාගෙන ඉඳලා හඳුන් ලීයෙන් හදපු කුඩා පෙට්ටියක් තෝරලා අතට ගත්තා ඒ ගමන රජ්ජුරුවො කීවා "බොහොම හොඳා උඹටත් උඹෙ අම්මා අප්පාටත් මේ ජීවිතේට ඇති තරම් දේ මය පෙට්ටියෙ තියෙනවා. හොඳයි අරගෙන ගෙදර පලයන්" කියලා.

ළමයා පුළුන් ටිකත් පුංචි හඳුන් පෙට්ටියත් අරගෙන ගෙදර ගිහින් සිද්ද වෙච්ච ඔක්කොම දේ අම්මාටත් තාත්තාටත් කියලා පෙට්ටිය ඇරියා බලන්ට. පෙට්ටියෙ තිබුණා වටිනා මැණික් ගල් සීයයක්.

මේ කතාව දැනගන්ට ලැබිලා අන්තයි අක්කගෙ දුවයි දෙන්නත් ඇවිදින් විගතුග ඇහුවා. එතකොට නංගිගෙ දුව අතින් පුළුන් රොද හුළඟට ගිය තැන හිටන් ඔක්කොම විස්තරේ කීවා.

ඊට පස්සෙ අක්කාටත් මේ වගේ වස්තුවක් ලබාගන්ට ආසාවෙන්, පාව ද එයත් දුවගෙ අතින් පුළුන් ටිකක් හුළඟෙ ඇරියා. මේ පුළුන් රොදත් අර වගේ ම හුළඟට ගහගෙන ගියා. ඒ ගමන අක්කා ඒ ගැන බැණ වැදිලා දුවව තළලා ඈ පිටත් කළා. පුළුන් රොද අරගෙනම මිස ගෙදර හරියට එන්ට එපා කියලා.

ඒ ළමයාත් අර විදේශී අඩ අඩා යනකොට ළිඳක් ළඟ නැලි අම්මා කෙනෙක් ඉඳලා කීවා "අනේ දුවේ මට දිය ටිකක් ඇදලා වක්කරලා පලයන්කො" කියලා. එහෙම කියාපුවම මේ ළමයාට තරහ ගිහින් "ඉඳකින් උන්දැගෙ හැටි" කියලා යන්ට ගියා. ඒ යනකොට එක අඹවෙ බැඳපු එළදෙනක් හිටියා. එනකොට එළදෙන ළමයට කතා කර කීවා "අනේ දුවේ මා අර ගෙවත්තෙන් බැඳලා පලයන්කො" කියලා.

ඉතින් මේ ළමයා "මට බෑ" කියලා එතනින් යන්ට ගියා. ඔහොම යනකොට ඕන්න එක තැනකදී දුටුවා අර පුළුන් රොද මේ ඊනක පැටලිලා තියෙන විග. ඒ ළමයා ඒක ගන්ට කෙක්කක් බිඳින කොට ඕතනින් යන්ට ආවා රජ්ජුරුවො.



"උඹ ඔය මොකද කරන්නෙ" කියලා අහලා රජ්ජුරුවො කීවා "හොඳයි මම පුළුන් ටික අරගෙන එන්නම් උඹ අර මාලිගාවට ගිහින් මගෙ බත් ටික උයා දීයන්" කියලා.

මේ ළමයාත් ගිහින් බතුත් මාලුත් ඉව්වා. රජ්ජුරුවො ඇවිත් හා එහෙනං බත් කමු කියලා කන්ට ගියාට කෑම කිසි රහකට උයලා තිබුණෙ නෑ දිය රහයි. ඊට පස්සෙ රජ්ජුරුවො ඈ මාලිගාව ඇතුළට අඬගහගෙන ගිහින් පෙට්ටි තුනක් පෙන්නා කීවා "මෙන්න මේ පෙට්ටිවලින් කැමති පෙට්ටියක් තෝරලා අරගෙන යන්ට" කියලා.

ළමයත් පෙට්ටි දිහා බලලා හොඳ ලොකු ඒවයින් පෙට්ටියක් තෝරාගත්තා - රජ්ජුරුවො කීවා හොඳයි එහෙනම් අරගෙන පලයන්. එළියක පහළියකදී හෙම පෙට්ටිය අරින්ට එපා කියලා.

ළමයා පුළුන් ටිකත් අත ඇරලා පෙට්ටිය විතරක් කර ගහගෙන ගෙදර ආවා. ගෙදර ඇවිත් ගේ ඇතුළට ම අරගෙන ඔක්කොම එක්ක වටවෙලා පෙට්ටිය ඇරලා බැලින්නම් ඒකෙ තිබ්බෙ ඔක්කොම සර්පයි - නයි පොළොංගු ඒ සාර ඔක්කොම කෑ ගාගෙන දුවන්ට උණා. සර්පයො ගේ පුරා ගිහින් ගෙයි තැන් තැන්වල හැංගුණා. අන්තිමට සර්පයින් නිසා උන්න ගේත් අත්ඇරලා යන්ට සිද්ද උණා.

# කුමාරයා සහ යකා

එකමත් එක රටක එක රජ කෙනෙකුට එක ම පුතෙක් හිටියා. මේ කාලෙ ම ඒ රටට එක යකෙක් ඇවිදින් මිනිසුන් මරා ගෙන කකා නුවර විනාශ කරන්ට පටන් ගත්තා. මිනිස්සු බොහොම දෙනා නුවර ඇර යන්න පැනලා ආවා. මේ අතරෙ රජ්ජුරුවොයි අමාත්‍යයොයි දන්න තරම් උත්සාහ කරලා මේ යකා අල්ලලා යකඩ කූඩුවක් හදලා යකා ඒකට දාලා දොර වහලා හිටියා.

ඉතින් මෙහෙම ඉන්නකොට එක දවසක් මේ රජ්ජුරුවන්ට යුද්දෙකට යන්ට උණා. රජ්ජුරුවො යුද්දෙට ගියායින් පස්සෙ එක දවසක් රජ්ජුරුවන්ගෙ පුත් කුමාරයා ගිහින් අර මිනී කන යකා බලන්ට ඕනෑයි කියලා යකා හිර කරලා හිටිය ගෙයි දොර ඇරියා. කුමාරයන් දුටුවාම මේ අසරණවෙලා හිටිය යකා මූණින් තලාවෙලා කුමාරයන්ට වැඳ වැටිලා තමන් විඳින දුක - කිය කියා අඬන්ට පටන් ගත්තා. ඒ පාර කුමාරයාට දුක හිතිලා කීවා "උඹ මේ රටේ වත් නොහිට යන්ට යනවා නම් මං උඹ නිදහස් කරනවා" කියලා. යකා පොරොන්දු උණා රටේවත් නොහිට යනවා කියා. ඉතින් කුමාරයා යකඩ කූඩුවේ දොර ඇරලා යකා නිදහස් කළා. යකා කුමාරයන්ට පිං දීලා කිවුවා කවද හරි මටත් හැකි වුණොත් මාත් මේ වෙනුවෙන් උදව්වක් කරනවා කියා- යකා යන්ට ගියා. කුමාරයත් මාලිගාවට ගියා.



ඊට පස්සෙ ඉතින් රජ්ජුරුවොත් යුද්දෙන් දිනලා මාලිගාවට ආවා. ඇවිත් යකා හිටිය ගෙයි දොර ඇරලා බැලුවාම යකා කූඩුවේ හිටියෙ නෑ. යකා ඇරියෙ කවුද කියලා සියලුන්ගෙන් ඇහුවාම කුමාරයාගෙ මව් බිසව කීවා කුමාරයා යකා නිදහස් කර ඇරිය විත්තිය. රජ්ජුරුවන්ට මේ ගැන තරහ ගිහින් කීවා "ඔය නොකීකරු පුතා මං හෙට ඉහ ගහ දමනවා" කීයා.

ඉතින් මේ කතාව ඇහුවාම මව් බිසවුන්ට පුතා ගැන දුක හිතිලා පුතාට කතා කරලා බත් මුලකුත් බැඳ දීලා අස්සයෙකුත්, කඩුවකුත්, මසුරන් පොදියකුත් දීලා කිවුවා "යකා නිදහස් කර ඇරිය එක ගැන පිය රජ්ජුරුවන්ට තරහ ගිහින්. හෙට පුතාගෙ ඉහ ගහ දානවා කීවා. ඒක නිසා දැන් ඈ හොරෙන් ම වෙන රටකට යන්ට" කියලා.

ඊට පස්සෙ කුමාරයත් අර බත් මුල යි කඩුව යි මසුරන් පොදිය යි අරගෙන අස්සයා පිට නැගලා යන්ට ගියා. ගිහින් ගිහින් කුමාරයා වෙන රටකට ඇතුළු උණා. ඉතින් දැන් කුමාරයට බොහොම වෙහෙසයි. හැන්දෑ වෙගෙනත් ආවා. ඒක නිසා කුමාරයා මග අහල තියන ගමක හලක නැවතුණා. අස්සයත් කනුවක බැඳලා අර තමන් ගෙන ගිය බත්මුල පැත්තකින් තියා ඇළ වුණා.

එකකොට මේ කුමාරයා දුටුවා මග යන කොලුවෙකු. දකලා කතා කරලා ඇහුවා "කොලුවෝ උඹ යන්නෙ කොහෙද?" කියලා.

ඒ පාර ඒ කොලුවා කීවා "මා යනවා කන්ට අඳින්ට දෙන රටකට යන්ට" කියලා.

එතකොට කුමාරයා කීවා "හොඳයි මං ළඟට කන්ට අඳින්ට දෙන්නම්. මගෙ අස්සයා බලාගන්ට එන්ට හැකිද?" කියලා.

ඒ කොලුවත් "හා හොඳයි" කියලා කුමාරයා ළඟ නැවතුණා.

ඒ පාර කුමාරයා කීවා කොලුවාට "මේ රටේ මග තොට මම දන්නෙ නැ. ඒ නිසා නුවරට යන මග උඹ මට පෙන්නා දෙන්ට ඕනෑ" කියලා.

එතකොට කොලුවා කීවා මෙතනින් ගියාම ගඟක් තියනවා. ඒ ගඟින් එතර තමා නුවර තියෙන්නෙ. මෙ ගඟෙන් එතර වෙලා යන්ට අමාරුයි. තව උඩහට ගියොත් නැව් පාලමක් තියෙනවා එයින් එගොඩ වෙලා යන්ට පුළුවනි කියලා.

ඊට පස්සෙ කුමාරයා "හා එහෙනං අපි යමු" කියල අස්සයා පිට උඩ නැඟලා ගියා ගඟ ළඟට. මේ කුමාරයා ගඟ ළඟට යනකොට ගඟේ එගොඩහ ගොඩේ හිටියා රජ්ජුරුවන්ගෙ දූ කුමාරිකාවො තුන් දෙනා නාන්ට ඇවිත්. ඒ පාර මේ කුමාරයින්ටත් හිතුණා ගඟට බැහැලා නාගෙන යන්ට ඕනෑ කියලා. කුමාරයා ඇඳුම් ගලවලා ගොඩින් තියලා දියකඩක් ඇඳගෙන දියට බැස්සා නා ගන්ට. එත-කොට අර එගොඩහ ගොඩේ හිටිය කුමාරිකාවො තුන් දෙනා දැක්කා මේ කුමාරයාගෙ අපූරු රූපෙ.

මේ අතරෙ අර ගොඩ හිටිය අස්සයා බලාගන්න කොලුවා කළේ මොකද කුමාරයා ලිහා තැබුව කුමාර ඇඳුමුත් ඇඳගෙන කඩුවත් මසුරනුත් අරගෙන අස්සයා පිට නැඟලා යන්ට ගියා. මේ සිද්දිය එගොඩහ හිටිය බාල කුමාරි බලාගෙන හිටියා.



කුමාරයා දියෙන් ගොඩ ඇවිත් බැලින්නම් ඇඳුමුත් නැ අස්සයාත් නැ කඩුවත් නැ; කොලුවා අරගෙන ගිහින්. ඉතින් කුමාරයා අර ඉනේ තුබුණ දිය කඩ පිටින් ම එළවා ගෙන ගියා කොලුවා ගිය පාරෙ. එළවලා එළවලා ඔන්න අස්සයා හිටවූ කර ගත්තා.

ඒ පාර අස්සයා පිට උඩ හිටිය කොලුවා කීවා "එන්ට එපා මා ළඟට, ආවොත් කඩුවෙන් කොටලා මරනවා. නැබැයි උඹ කැමති නම් මගෙ අස්සයා බලාගන්ට. ඔය අස්සයගෙ වලිගය අල්ලාගෙන වරෙන්"ය කියලා.

"ඉතින් කොහොම හරි නුවරට යා ගන්ටත් එපායැ" කියලා කුමාරයත් එහෙනං හොඳා කියලා අස්සයගෙ වලිගය අල්ලාගෙන ගියා. දෙන්නා ඔහොම ගිහින් නුවරට ඇතුළු වුණා.

මේ රටේ රජ්ජුරුවන්ගෙ සිරිතක් තියනවා; නුවර හතර වාසල මුරට ඉන්න භේවායො, රටට අලුතෙන් ඇතුළුවුණ හැම දෙනකුගෙම නම් ලියලා රජ්ජුරුවන්ට ගිහින් කියන්ට ඕනෑ. ඉතින් මේ දෙන්නා ගියාමත් මුර භේවායා ඇහුවා මේ දෙන්නාගෙ නම් කොහොමද කියල. එතකොට අස්සයා පිට උඩ උන්න කොලුවා කීවා "මගෙ නම මාණික්ක සෙට්ටි, මගෙ අස්සයා බලා ගන්නා කොලුවා ඇර වෙන කවුරුවත් මා එක්ක ආවෙ නැහැ" කියලා.

මුර භේවායො හනික ගිහින් රජ්ජුරුවන්ට දැන්නුවා "දෙවියන් වහන්ස, මාණික්ක සෙට්ටි කියලා කෙනෙක් අස්සයා බලාගන්න කොලුවෙකුත් එක්ක නුවරට ආවා" කියලා.

එතකොට රජ්ජුරුවෝ හිතුවා ඒ ඇත්තා ,මාණික්ක සෙට්ටි නම් මාණික්‍ය ගැන හොඳට දන්නවා ඇති. රටක් ගානෙ ගිහිල්ලත් මිට මිල කරවා ගන්ට බැරි ව තියෙන මගෙ මාණික්‍යය මිල කරවා ගන්ට හැකි වෙයි කියා හිතුවා.

රජ්ජුරුවෝ මාණික්ක සෙට්ටි මාලිගාවට ගෙන්නලා කන්ට බොන්ට හොඳට දීලා මැණික පෙන්නුවා. පෙන්නලා කීවා මගෙ මේ මැණික බලා මිල කර දෙන්ට පුළුවන් ද කියලා.

එතකොට මාණික්ක සෙට්ටි කීවා "ඔය මැණික මගෙ අස්සයා බලාගන්න කොලුවා මිල කරයි" කියලා.

"අස්සයා බලා ගන්න කොලුවා මැණික මිල කරයි" කීවාම රජ්ජුරුවන්ට තරහ ගියා. රජ්ජුරුවෝ අණ කළා වහා ම ඒ කොලුවා එක්ක එන්ට කියා. ආවාම මැණික මිල කරන්ට හැකිද කියලා ඇහුවා. ඒ පාර කුමාරයා කීවා "උත්සාහ ගත්තොත් පුළුවන් වෙයි" කියලා. රජ්ජුරුවෝ මැණික දුන්නා කුමාරයින් අතට.

කුමාරයාත් මැණික අතට අරගෙන හොඳට බලන කොට තේරුණා මැණික ඇතුළෙ වැලි තියන බව. තේරිලා කීවා "මේක දැන් මට පෙනෙන හැටියට නම් සල්ලි හතරකට වැඩිය වටින්නෙ නැහැයි"යි කියලා.

රජ්ජුරුවන්ට තරහ ගිහින් ඇහුවා "උඹ කොහොම ද දන්නෙ?" කියලා.

"මේ මැණික ඇතුළෙ වැලි තියනවා" කියලා කුමාරයා කීවා.

"හොඳයි මැණික කපලා මට වැලි පෙන්නන්ට හැකිද?" කියා ඒ පාර රජ්ජුරුවෝ ඇහුවා.



"මාණික්ක සෙට්ටි ළඟ තියන කඩුව ලැබුණොත් කපා පෙන්නන්ට පුළුවන" කියලා කුමාරයා කීවා.

ඒ පාර රජ්ජුරුවෝ මාණික්ක සෙට්ටි අතින් කඩුව අරගෙන දුන්නාම කුමාරයා කඩුව අරගෙන පිය රජ්ජුරුවන්ගෙ නම සිහි කරලා "දෙවියන්ගෙ පිහිටෙන් මට මේ රටේ රජකම ලැබෙනවා නම් මේ මැණික් ගල කැකිරි ගෙඩියක් වගේ කැපිලා යන්ට ඕනෑ" කියලා හිතාගෙන මැණික මේසෙ උඩ තියලා කඩුවෙන් කැපුවා. එතකොට මැණික ඇතුළෙ තුබුණ වැලි සර සර ගාලා වැටුණා.

ඊට පස්සෙ රජ්ජුරුවෝ හිතුවා මාණික්ක සෙට්ටිගෙ අස්සයා බලන කොලුවා මෙච්චර දන්නවා නම් මාණික්ක සෙට්ටි කොච්චර දන්නවා ඇතිද කියලා. දෙන්නට ම හොඳට කන්ට බොන්ට දීලා වෙනත් සැලකිලි කරලා ටික කලකට ඉන්ටත් දුන්නා.

"අස්සයා බලන කොලුවාට මාණික්ක සෙට්ටි තරමට සලකන හැටි දැකපු රජ්ජුරුවන්ගෙ බාල ම කුමාරිට බොහොම කනගාටු හිතුණා. ඉතින් කුමාරි අරක්කැමියාට කීවා "අර සෙට්ටිරාළගෙ අස්සයා බලා ගන්න කොලුවාට මට මෙවඩන බොජුන් වගේ රස බොජුන් දෙන්ට ඕනෑ, නිදා ගන්ට හොඳ යහනක් දෙන්ට ඕනෑ. ඒ කොලුවාට ටිකක් උදව් කරන්ට ඕනෑ" කියලා.

ඊට පස්සෙ අරක්කැමියත් අනික් රාජ පුරුෂයොත් මේ කුමාරයට සලකන්ට උණා හොඳට. ඒත් කුමාරයා ඒවා බාර ගන්ට කැමති නැ. "අනේ මං මේ අස්සයා බලන කොල්ලා. මට ඇයි මේ සැලකිලි" කියනවා.

ඉතින් බාල කුමාරි හිතුවා මේ අස්සයා බලන කොල්ලුවා මෙහෙට්ටි රාළගෙන් ඈත් කරන්ට ඕනෑය කියලා. එහෙම හිතලා එක දවසක් අඬ අඬා ගිහින් රජ්ජුරුවන්ට කීවා "අනේ පියාණන් වහන්ස, මගෙ එළුවන් පට්ටිය බලන කොල්ලුවාගෙ නොසැලකිල්ල නිසා දන් මගෙ එළු පට්ටිය විදවෙන්න යනවා. ඒක හින්ද ඒ කොල්ලුවා මෙහෙට්ටි රාළ ගාවට ඇරලා අර අස්සයා බලාගන්න කොල්ලුවාට මගෙ එළු පට්ටිය බාර දෙන්ට" කියලා.

රජ්ජුරුවො කීවා "හොඳයි මාණික්ක සෙට්ටි එක්ක කතා කරලා එහෙම කරන්ට බලන්නම් කියලා." ඊට පස්සෙ රජ්ජුරුවො මාණික්ක සෙට්ටිගෙන් ඇහුවාම කිව්වා "හා හොඳයි" කියලා. ඉතින් රජ්ජුරුවො මේ කුමාරයා බාල කුමාරිගෙ එළු පට්ටිය බලාගන්ට ඇරියා. කුමාරයා එළු පට්ටියට ගිය ද පටන් එළු පට්ටිය ගිය ගාණෙන් වැඩි වෙන්ට පටන් ගත්තා.

ඉතින් ඔහොම යන අතරෙ එක දවසක් රජ්ජුරුවො වනේ දඩ කෙළියෙ ගිහින් යකුන් තුන් දෙනෙකුට අහුවුණා. රජ්ජුරුවො යකාට කිල්ලට අහුවෙලා බේරිලා එන්ට හැටියක් නැතුව. තමන්ගෙ දූ කුමාරිකාවො තුන්දෙනා ම යකුන්ට දෙනවා කියා පොරොන්දු වෙලා යකුන්ගෙන් බේරිලා ආවා.

ඊට පස්සෙ පහුව දූ රජ්ජුරුවො රටේ අඬ බෙරයක් ප්‍රසිද්ධ කළා "මා ඊයෙ කැලේදී යකුන්ට අහුවෙලා බේරිලා ආවා මගෙ දූ කුමාරිකාවො තුන් දෙනා තුන් දවසකට යකුන් තුන් දෙනකුට දෙනවා කියා. කාට හරි පුළුවන් නම් මේ යකුන් තුන් දෙනා ම මරාලා කුමාරිකාවුන් තුන්



දෙනා නිදහස් කර දෙන්ට. ඒ අයන්නාට රටෙන් බාගෙකුත් දීලා කුමාරිකාවන් තුන් දෙනාමත් පාවා දෙනවා" කියා.

එතකොට මාණික්ක සෙට්ටි කීවා මට පුළුවනි යකුන් තුන් දෙනා මරන්ට කියලා.

එද එළුවන් බලන්ට ගිය කුමාරයා එළුවන් බලාගෙන ඉන්න කොට මිනිහෙක් කැලෙන් ඇවිදින් එළුවකු උස්සා ගෙන කැලයට දිව්වා- කුමාරයාත් ඒ මිනිහා පස්සෙන්ම එළෙව්වා.- එතකොට මිනිහා පොළොවෙ තිබුණ ගුහාවකට රිංගුවා - කුමාරයත් නවතින්නෙ නැතුව මිනිහා ගිය පස්සෙන් ම ගියා. ටිකක් දුර යනකොට ගුහාවෙ මහා අන්ධකාරයි. එත් කුමාරයා නවතින්නෙ නැතුව ඉස්සරහටම ගියා. ඔහොම යනකොට දුරින් ලොකු එළියක් දුටුවා. එතකොට කුමාරයා ඒ එළිය තියන තැනට ගිහින් එට පිට බලනකොට මිනිහෙක් එතන නිදාගෙන හිටියා සළු කීපයක් පොරවාගෙන.

ඉතින් කුමාරයා එතන ටිකක් වෙලා හිටගෙන කල්පනා කළා මේ මිනිහාට කතා කරම්දෝ නොකරම්දෝ, මෙතනින් එහාට යම්දෝ නොයම් දෝ කියලා. මේ නිද ගෙන හිටියෙ අර යකඩ කූඩුවෙ දමා හිටලා කුමාරයා නිදහස් කර ඇරිය යකාමයි. එතකොටමත් යකා නින්දෙන් දුටුවා තමා නිදහස් කර එවූ කුමාරයා තමන් ළඟට ඇවිත් ඉන්නා විග. ඒ එක්ක ම යකා ඇහැරලා බැලින්නම් තමන්ට උදවු කරපු කුමාරයා ඉස්සරහ හිටගෙන ඉන්නාවා- යකා නැගිට්ට හැටියෙ ඇවිත් කුමාරයා බද ගත්තා- කුමාරයාට බය හිතුණා. එතකොට යකා කතා කර කීවා "කුමාරයන් වහන්ස බය වෙන්ට එපා. ඔබ තුමා උදව් කළ යකා මම යි" කියලා ඇහැව්වා "කුමාරයා දන් මේ යන්නෙ කොහෙද" කියා.

එතකොට කුමාරයා කීවා "අද උඹ නිදහස්කරළුවාය කියා පිය රජ්ජුරුවො මගෙ ඉහ ගහ දමන්ට නියම කළා" කියලා පටන් අරගෙන ඔක්කොම සුල මුල කිව්වා.

එතකොට යකා, අර හොරා ගෙන ගිය එළුවා ගෙනත් දීලා ඇහුවා වෙන මොනවද ඕනැයි කියලා.

කුමාරයා කීවා "මට තව උදව්වක් කරන්ට ඕනෑ. අපේ රජ්ජුරුවන්ගෙ දූලා තුන් දෙනා බිලිගන්ට යකුන් තුන් දෙනෙක් එනවා. මට උන් මරාගන්ට ගුරුකමකුත් කියන්ට ඕනැ. පළමු වෙනි යකා එන්නෙ අද යි" කියලා.

එතකොට යකා කීවා "හා ඒක මං කරන්නම්" කියලා කුමාරයට කීවා "දැන් ගිහින් රෑට බත් කාලා මෙතෙන්ට එන්ට" කියලා කුමාරයා යන්ට ඇරියා.

කුමාරයත් එළු පැටියත් අරගෙන ගිහින් රෑට බතුත් කාලා අර යකා කී තැනට ආවා. ඒ පාර යකා කුමාරයාට හොඳ ඇඳුමකු යි කඩුවකු යි අස්සයකු යි දීලා කීවා "ඒ කුමාරි ගෙනිහින් බිල්ලට දෙන ගහ යටට යන්ට. හෙළින් ම යකා හූ තුනක් කියා ගෙන පැන ගෙන ඇවිත් කුමාරයන් දැකලා මූණ බලා ගෙන හිටිවි. අන්න එතකොට මේ කඩුවෙන් යකා පොලු ගහන්ට" කියලා කීවා.

හා හොඳයි කියා කුමාරයත් අර ඇඳුමත් ඇඳගෙන අස්සයා පිට නැගිලා ගියා කඩුවත් අරගෙන. මේ කුමාරයා ගහ මුලට යන කොට වැඩිමල් කුමාරි ගහ මුල බැඳලා හිටියා. මාණික්ක පෙට්ටි බයේ ගහ උඩට නැඟ ගෙන හිටියා. මේ කුමාරයා යනවා දැකලා එතනෙ යකා වෙන්ට ඇති කියා බය වෙච්චි ගමන මාණික්ක පෙට්ටිට සිහිත් නැතුව ගියා.



ඔන්න නියම වෙලාවට යකා හූවකුත් කියාගෙන ඇවිත් කුමාරි ඉන්න තැනට පැන්නා. ඒ ගමන කුමාරයා එක පාරට ම පොලුවා යකාට; යකා මැරිලා වැටුණා. කුමාරයා යකාගෙ දිව ඇදලා කපා ගෙන කුමාරිගෙ අතේ තිබුණ මැණික් මුද්දත් ඉල්ලාගෙන ගියා යාළු යකාගෙ මඩුවට. ගිහින් ඇඳුමත් කඩුවත් අස්සයාත් තියලා එළුවත් බලන්ට ගියා.

මාණික්ක පෙට්ටිට සිහිවෙලා බලන කොට යකා මරා දාලා. ඒ පාර මිනිහා ගහෙන් බැහැලා අර මළ කඳට කඩුවෙන් කොටලා කඩුවෙ ලේ තවරාගෙන හිටියා. රජ්ජුරුවො උදේ ම ගිහින් බලලා කුමාරි ඉන්නවා දැකලා සතුටුවෙලා යකාගෙ ඉහත් අරගෙන මේ දෙන්නත් කැඳුව මාලිගාවට ආවා.

දෙවෙනි දවසෙ දෙවෙනි කුමාරිකාව යකාට බිල්ලට අරගෙන ගියා. එදත් මාණික්ක පෙට්ටි ගහට නැගගෙන හිටියා. කුමාරයා ඉස්සර දවසෙ වගේ ගිහින් යකා මරලා දිව කපාගෙන කුමාරිගෙ මුද්දත් ඉල්ලාගෙන ගියා. රජ්ජුරුවො උදේ ඇවිත් අර දෙන්නා කැඳුව මාලිගාවට ගියා.

තුන්වෙනි දවසෙ බාල ම කුමාරි අරගෙන ගියා බිල්ලට. එදත් මාණික්ක පෙට්ටි ගහේ ඉන්දැදී කුමාරයා යකා මරලා යකාගෙ දිවත් කුමාරිගෙ මුද්දත් අරගෙන යන්ට ගියා. රජ්ජුරුවො උදේ ඇවිත් අර දෙන්නා මාලිගාවට කැඳුව ගියා.

ඉතින් ඊට පස්සෙ රජ්ජුරුවො පොරොන්දුවේ හැටියට දූ කුමාරිකාවරු සරණ පාවා දෙන්ට ලොකු මඟුලක් සූදානම් කළා. වෙන රටවල රජ ඇමතිවරුන්ටත් එන්ට පණිවිඩ ඇරියා. ඉතින් ඒ ඔක්කොම ඇවිදින් මඟුල ගන්ට තියන වෙලාවක් ළං උණා.

ඒ අතරෙ අර කුමාරයා යාචි යකාගෙ බඩගෙ ඉඳලා යකා දුන්න රන් පළ් ඇඳගෙන, රන් ආබරණ පැළඳගෙන, රන් සිවුරුත්තක් දමාගෙන සුදු අශ්වයෙකු පිටේ නැගලා රජ මාලිගාවට ආවා. එතකොට රජ්ජුරුවන්ගෙ අමාත්‍යයා මේ කුමාරයත් දකල භයවෙලා, වැඳ වැටිලා ඇහුවා ඔබ වහන්සෙ මේ කොහාට ද යනපත් වෙන්නෙ?'' කියලා.

ඉතින් කුමාරයා කීවා ''යකුන් තුන් දෙනකු මැරූ වීරයකුට මේ රටේ රජ්ජුරුවන්ගෙ කුමාරිකාවරු තුන්දෙනා දෙන මඟුල බලන්ට ආවා'' කියලා.

ඒක බොහොම හොඳයි කියලා ඒ අමාත්‍යවරු මේ කුමාරයාට පෙන්නුවා යකුන් තුන් දෙනාගෙ ම ඉස් ගෙඩි.

එතකොට කුමාරයා ඒවා දිහා බලාලා ඇහුවා- ''පණ තියන හොයි සතකුට උණත් දිවක් තියෙන්ට ඕනෑ නේද?'' කියලා.

එතකොට සැවොරුත් කීවා ''ඔව් ඔව්'' කියලා.

ඉතින් කුමාරයා ඇහුවා ''එහෙනම් මොකද මේ යකුන් තුන් දෙනාට ඒතරක් දිවවල් නැත්තෙ'' කියලා.

ඒ ගමන හැම එක්කෙනා ම මාණික්ක සෙට්ටිගෙන් අහන්ට උණා ''කෝ මේ යකුන්ගෙ දිව්'' කියලා.

මාණික්ක සෙට්ටි බයේ සතාවක් බහක් නැතුව තරබාගෙන හිටියා.

එතකොට කුමාරයා වැඩිමල් කුමාරිකාවුන් දෙන්නා ගෙන් ඇහුවාම ඒ දෙන්නා කීවා ''අපි දන්නෙ නෑ'' කියලා.



බාල කුමාරිගෙන් ඇහුව හැටියෙම ඒ කුමාරි මේ කුමාරයගෙ අතින් අල්ලා ගත්තා. අල්ලාගෙන කීවුවා ''මාණික්ක සෙට්ටි නෙමෙයි මෙන්න මේ කුමාරය යි යකා මැරුවෙ. මරලා යකාගෙ දිව කපාගෙන මගෙ මුදුවත් ඉල්ලාගෙන ගියා'' කියලා.

ඊට පස්සෙ කුමාරයා යකුන්ගෙ දිව තුනත් කුමාරිකාවුන්ගෙ මුදු තුනත් පෙන්නලා තමන් ගැනත් මාණික්ක සෙට්ටියා ගැනත් ඔක්කොම විග තුග කීවා.

ඒ පාර රජ්ජුරුවො මාණික්ක සෙට්ටිගෙ ඉස ගහ දම්මවලා මේ රාජ කුමාරයාට ද කුමාරිකාවන් තුන් දෙනා ම කසාද බැඳ දීලා රටේ රජකමත් දුන්නා. ඊට පස්සෙ කුමාරයා බොහොම හොඳින් රාජ්ජෙ කරගෙන එහෙ හිටියා.

# එමල් බිසෝ

එකමත් එක රටක හිටියා ගමරාළ කෙනෙකුයි ගම මායියා කෙනෙකුයි. එක දවසක් ගමරාළ දවල් බත් කාලා නිදි ඉන්න අතරෙ ගම මායියා තවත් ගෑනියකුත් කැටුව ගියා කැකිරි කඩන්ට.

කැකිරි කඩලා මල්ලක් පුරවලා බැන්දයින් පස්සෙ ගම මායියා කැකිරි ගාලෙම දුවක වැදුවා. ඒ ගමන ගම මායියා අනික් ගෑනියට කතා කර කීවා "මට මේ දරුවා ගෙදරට ගෙන ගිහින් දියන්" ය කියලා. එතකොට අනික් ගෑනි මට බැහැ කියලා කැකිරි මල්ල අතේ තියා ගෙන ගෙදර ගියා. ගම මායියා ළමයා කැකිරි ගාලෙ ම වහලා තියලා ගෙදර ගියා.

මේ අතරෙ මෙතැනින් යන්ට ගිය රාජකොකෙකුයි කෙකිණියකුයි දුටුවා මේ කැකිරි ගාලෙ හිටිය ගෑනු දරුවා දකලා උන් අර ගෙන ගියා උන්ගෙ කූඩුවට. "අපට මැණිකක් හම්බ උණා" කියලා උන් බොහෝම සතුටු වෙලා මේ ළමයා වඩන්ට පටන් ගත්තා. එමල් බිසෝ කියා නමකුත් තියලා.

බොහොම කාලයක් යනකොට මේ ළමයා වැඩිවිය පැමිණිලා හොඳ ලක්ෂණ කුමාරිකාවක් වගේ උණා. එක දවසක් මේ කොකයි කෙකිණියි එමල් බිසෝට කතා කරලා කීවා "දැන් අපි උඹට දෑතට රන් වළලු යි, දෙපතට රන් තෝඩු යි, මාලෙට මුතු පබළු යි ඇරගෙන එන්ට යනවා — මේ ගෙදර ඉන්න ගිරවාට යි බළලාට යි බල්ලාට යි කෑම කොටිඟ අඩු නොකර දෙන්ට ඕනෑ; අපි එන තෙක් ම ලිපේ ගින්දර නිවා නොහැරිය පරෙස්සම් කර ගන්ට ඕනෑ. ගෙයින් පිට කොහෙවත් යන්ට හෙම එපා" කියලා.

මෙහෙම කියා කොකා යි කෙකිණි යි ගියා වළලු හෙම අරගෙන එන්ට.

ඉතින් එමල් බිසෝ කෙකිණි කියාපු හැටියට බල්ලා-ට යි ගිරවාට යි කෑම කොටිඟ අඩු නොකර දෙතුන් දවසක් හරියට දුන්නා. ඒත් එක දවසක් බළලාගෙ කෑම කොටිඟ අඩු කළා. එද ඒ බළලා ලිප පහුරු ගාලා ගින්දර නිවුවා, බල්ලා අළු ගොඩේ නිදා ගත්තා.

පහුව ද උදේ එමල් බිසෝ ගිනි පුගාන්ට[2] ලිප ළඟට ගිහින් බැලින්නම් ලිපේ ගිනි අඟුරක්වත් නෑ.

ඒ පාර එමල් බිසෝ ගිරවාට කතා කරල කීවා "ගිරවෝ, ඊයෙ මං බළලාට කෑම කොටිඟ අඩු කළා; ඒක නිසා බළලා ලිපේ ගින්දර නිවා දැමුවා. අපට උයා ගන්ට හැටියක් නෑ. උඹ ගිහින් දුම් ගහන තැනක් බලාගෙන වරෙන්" කියලා.

හොඳයි කියලා ගිරවා අහසට ඉගිලිලා ගිහින් බලලා-බලලා කොහෙතනකින්වත් දුමක් පිටවෙනවා දකින්ට නැතැ. රාක්ෂ ගෙදරින් විතරක් දුම් ගහනවා දකලා ඇවිත් කීවා "අක්කෙ, මේ අහලක කොහෙවත් ම දුම් ගහන තැනක් නෑ, අර රාක්ෂ ගෙදර විතරක් දුම් ගහනවා" කියලා.

2 ගිනි අවුලවන්ට

"එහෙනං මලේ උඹ ගෙදර හිටපන් මං ගිහින් ගින්-දර ඩිංගක් ඇරගෙන එන්නම්" කියලා ඈ ගින්දර ගේන්ට ගියා.

එවෙලෙ රාස්සයා හිටියෙ නෑ ගෙදර. රාස්සිගෙන් ගින්දර ටිකක් ඉල්ලුවාම රාස්සි කිව්වා ගින්දර ටිකක් දෙන්නම් මෙන්න මේ වී ටික පැහැලා දීලා පලයන් කියලා වී අටුණු දෙකක් දුන්න එමිල් බිසෝ වී කොටන්ට ගන්නම ඒවා නිකම්ම පැහිලා ගියා, ඒ ගමන රාස්සි ඇවිත් ආයෙත් හිල් කළගෙඩි හතක් දීලා කිව්වා "අනේ දුවේ ළිඳට වතුරත් පුරෝල ගෙනත් දීලා පලයන්" කියලා.

එමිල් බිසෝ ඒ ගමන ළිඳ ළඟට ගිහින් අර හිල් කළවලට දිය පිරෙව්වා ම ඒවා පිරිලා තිබියා. ඉතින් ඊට පස්සෙ රාස්සි හිල් පොල් කටුවකට අළු දමලා ඊට උඩින් ගිනි අඟුරක් තියලා එමිල් බිසෝ අතට දුන්නා. එමිල් බිසෝ ගෙදර යනකොට පොල් කටුවෙ අර හිලෙන් මග දිගට ම අළු වැටි වැටී ගියා.

ඔන්න ඉතින් රාස්සයා ගෙදර ආවම රාස්සි කිව්වා රාස්සයට "එමිල් බිසෝ කියලා අපූරු කෙල්ලක් දැන් මෙතෙනෙ ආවා. උඹලා එනකල් පමා කරන්ඩ කියලා මං ඇට දීලා වී දෙපැලක් පැස්සෙව්වා. හිල් කළ හතට ම දිය ඇද්දෙව්වා. කෝ උඹලා ආවයැ"? කියලා.

ඉතින් රාස්සයා ඇහුවා "ඈ දැන් කොහෙද ගියෙ" කියලා. රාස්සි කිව්වා "ඈ ගියා ගෙදර, මං හිල් පොල් කටුවකට අළු දාලා ගිනි අඟුරක් තියා ඇරගෙන යන්ට කියලා දුන්නා. ඈ ගිය මග දිගේ අළු වැටී ඇති කියලා.

ඒ ගමන රාස්සයා අර අළු පාර දිගේ ම ගියා එමිල් බිසෝගෙ ගෙදරට. රාස්සයා දුර එනකොට ම ගිරවා දැකලා



කිව්වා "අක්කෙ අන්න රාස්සයා එනවා ගෙට වෙලා දොර බැඳ ගනින්" ය කියලා.

එනකොට එමිල් බිසෝ ගෙට වෙලා දොර තද කර ගත්තා. ඒ පාර රාස්සයා එළියෙ ඉඳගෙන කියනවා "දැතට රන් වළලු අරන්, දෙකනට රන් තෝඩු අරන්, මාලෙට මුතු පබළු අරන්, අම්මත් ආවා අප්පත් ආවා දොර ඇරපන් එමිල් බිසෝ" කියලා.

එනකොට ගිරවා කිව්වා "දැතට රන් වළලුත් නෑ, දෙකනට රන් තෝඩුත් නෑ, මාලෙට මුතු පබළුත් නෑ, අම්මා අප්පා ආවෙත් නෑ දොර නාරින් අක්කේ" කියලා.

ඒ පාර රාස්සයා ගිරවා පාරෙ එළෙව්වා ලෑ මරා දමන්ට. ඒත් ගිරවා ඉගිලිලා කැලේට ගියා.

ඉතින් රාස්සයා ආයෙත් ඇවිත් අර වගේ ම කිව්වා "දැතට රන් වළලු අරන්, දෙකනට රන් තෝඩු අරන්, මාලෙට මුතු පබළු අරන්, අම්මත් ආවා අප්පත් ආවා දොර ඇරපන් එමිල් බිසෝ" කියලා.

එනකොට බල්ලා කිව්වා "දැතට රන් වළලුත් නෑ, දෙකනට රන් තෝඩුත් නෑ, මාලෙට මුතු පබළුත් නෑ, අම්මා අප්පා ආවෙත් නෑ දොර නාරින් අක්කේ" කියලා.

ඒ පාර රාස්සයා බල්ලා පාරෙ එළවලා ලෑ අල්ලා මැරුවා. මරලා ආයෙත් ඇවිදින් අර විදියට ම "..... දොර ඇරපන් එමිල් බිසෝ" කිව්වා.

එනකොට බළලා ඉඳලා බල්ලා කීවා වගේ ම "..... දොර නාරින් අක්කේ" කියා කීවා.

ඒ පාර රාස්සයා එළවාගෙන ගිහින් මළලන් අල්ලලා මරා දැමුවා. ඊට පස්සෙ ආයෙත් ඇවිදින් "......දොර ඇරපන් එමල් බිසෝ" කියා කීවා.

එතකොට දොරකඩ තිබුණ කතුරු මුරුංගා ගහ කතා කරලා අර වගේ ම කීවා "......දොර නාරින් අක්කේ" කියලා.

එතකොට රාස්සයාට තේන්ති ගිහින් කතුරු මුරුංගා ගහ කැලි කැලිවලට කපා දැමුවා. කපා දමලා ආයෙත් ඇවිදින් දොරට ගහලා කලින් වගේ ම "......දොර ඇරපන් එමල් බිසෝ" කියලා කීවා.

ඒ ගමන අර කපා දාපු කතුරු මුරුංගා කොට කැලි කතා කරල කලින් වගේම කීවා "......දොර නාරින් අක්කේ කියලා." ආයෙත් රාස්සයට තේන්ති ගිහින් රාස්සයා අර කතුරු මුරුංගා කොට කැලි එකතු කරලා පිලිස්සුවා. පුළුස්සලා දලා තව පාරක් ඇවිත් දොරට ගහලා "......දොර ඇරපන් එමල් බිසෝ" කියා කීවා.

එතකොට අර කතුරු මුරුංගා කොට පුළුස්සාපු අළු කතා කරලා කීවා "......දොර නාරින් අක්කේ" කියලා.

ඒ ගමන රාස්සයා අර අළු ගොඩ එකතු කරගෙන ගිහින් ගඟට දැමුවා. දමා ඇවිත් ආයෙත් දොරට ගහලා කතා කළා. "දැතට රන් වළලු අරන්, දෙකනට රන් තෝඩු අරන්, මාලෙට මුතු පබළු අරන් අම්මාත් ආවා අප්පාත් ආවා .....දොරඇරපන් එමල් බිසෝ" කියලා.

එතකොට අර අළු ගිහින් දාපු ගඟේ වතුර කතා කර කීවා "දැතට රන් වළලුත් නෑ, දෙකනට රන් තෝඩුත් නෑ, මාලෙට මුතු පබළුත් නෑ, අම්මා අප්පා ආවෙත් නෑ දොර නාරින් අක්කේ" කියලා.



ඒ ගමන රාස්සයාට හොඳ ට තේන්ති ගිහින් ගඟේ වතුර බිගෙන බිගෙන ගියා. ගිහින් හුස්ම හේට බැරුව රාස්සයා එතන ම මළා.

ඊට පස්සෙ ඊළඟ මහනොකොකයි පොතිනියි ගෙදර ආවා. එතකොට ම ගිරවත් ආවා. ඉතින් ඒ පාර කෙනිති කතා කරල කීවා "දැතට රන් වළලු අරන්, දෙකනට රන් තෝඩු අරන්, මාලෙට මුතු පබළු අරන් අම්මාත් ආවා අප්පාත් ආවා දොර ඇරපන් එමල් බිසෝ" කියලා.

එතකොට ගිරවාත් එළියෙ ඉඳලා ඒක ම කීවා. ඉතින් ඊට පස්සෙ එමල් බිසෝ දොර ඇරියා. කොහො ම හරි ගෙනිහි ම ගෙනත් තුබුණු රන් වළලු යි, රන් තෝඩු යි, මුතු පබළු යි එමල් බිසෝට ලැබුණා.

# මානෙල් මල

ඔන්න, එකමත් එක රටක හිටියා අක්කා නගෝ දෙන්නෙක්. පවුලේ වෙන කවුරුවත් හිටියෙ නෑ. ඒ නිසා මේ අක්කා නගෝ දෙන්නා එක දවසක කතා කර ගත්තා "අම්මාත් අප්පාත් නෑ අපට, නෑදෑ මාමාත් නෑ අපට, ඒක හින්ද අපි දෙන්නා යමු වෙන කොහෙ හරි රටකට" කියලා.

මෙහෙම කතා කරගෙන දෙන්නා එක්ක මගට බැහැලා ගිහින් ගිහින් එක වෙල් එළියකට වැටුණා. වෙල් එළියෙදි හමු වුණා එළ ගොනුන් දෙන්නෙක්. එතකොට මේ එළ ගොන්නු දෙන්නා ඇහුවා.

"ගෙතිය කියලා රෙද්ද ඇඳලා, හට්ට කියලා කොණ්ඩෙ බැඳලා පෙට්ටිපොඩිය ඉහ තියන අක්කලා නංගලා මේ බැරක්ද යන්නෙ?" කියලා.

"අපි යනවා, අපට කන්ට අඳින්ට දෙන රටකට" කියලා අක්කා නගෝ උත්තර දුන්නා.

"ඇයි ඉතින් අපේ ගෙදර එන්ට නරක ද?" කියලා එතකොට එළ ගොන්නු ඇහුවා.

"උඹලා මොනවාද කන්නෙ?" කියලා අක්කා නගෝ ආයෙත් ඇහුවා.



"අපි කනවා හේනෙ ඇල් විධි වගේ පලා කොළ" කියලා එළ ගොන්නු කීවා; එතකොට:

"අංපොලු කංපොලු කියන උන් අපට එපා, උඹලා යවි" කියලා මේ දෙන්නා එතන පහු කරගෙන ගියා දෙනිපතක් උඩින් යන්ට. එතනදි මේ දෙන්නාට හමු වුණා නරි බල්ලන් දෙන්නෙක්. එතකොට නරි බල්ලා ඇහුවා.

"ගෙතිය කියලා රෙද්ද ඇඳලා හට්ට කියලා කොණ්ඩෙ බැඳලා පෙට්ටිපොඩිය ඉහ තියන අක්කලා නංගලා මේ බැරක් ද යන්නෙ?" කියලා.

"අපි යනවා අපිට කන්ට අඳින්ට දෙන රටකට" කියලා අක්කා නගෝ උත්තර දුන්නා.

"ඇයි ඉතින් අපේ ගෙදරට එන්ට නරක ද?" කියලා නරි බල්ලො ඇහුවා.

"උඹලා මොනවා ද කන්නෙ?" කියලා අක්කා නගෝ ආයෙත් ඇහුවා.

"අපි කනවා වෙලේ ඉන්න කක්කුට්ටන්යි කැලේ තියන ගමාගෙඩි යි" කියලා නරි බල්ලො කීවා, එතකොට

"කක්කුට්ටන් කනවුන් ගොක්කි කියන උන් අපට එපා; උඹලා නරි බල්ලො" කියලා මේ දෙන්නා එතනත් පහු කරගෙන ගිහින් එක තියරේ දිගේ යනකොට හමු වුණා ගියක් ම හා උන්න අයියා මල්ලෝ දෙන්නෙක්. එතකොට මේ අයියා මල්ලෝ දෙන්නා ඇහුවා,

"නොරිය තියලා සේලෙ ඇඳලා හවිරි තියලා කොණ්ඩෙ බැඳලා පෙට්ටිපොඩිය ඉහ තියාන අක්කලා නාගාලා දෙපී බැරක් ද කියලා.

"උපි යනවා අපට කන්ට අඳින්ට දෙනා රටකට" කියලා අක්කා නාගෝ උත්තර දුන්නා.

"ඇයි ඉතින් අපේ ගෙදර එන්ට නාරාද?" කියලා අයියා මලෝ ඇහුවාම

"උඹලා මොනවා ද කන්නෙ?" අක්කා නාගේ නායයන් ඇහුවා

"අපි කනවා කරවල බැදලා" කියලා අයියා මලෝ උත්තර දුන්නා.

"එහෙනං හොඳයි අපි සප්පෙත් කරවල බැදලා කවා-නං, එහෙනම් හොඳයි" කියලා කීව්වා.

"හා එහෙම නම් හොඳා, එහෙනං උඹලා පලයල්ලා අපේ ගෙවලට කියලා අයියා මලෝ දෙන්නා යතුරු දෙක දුන්නා ගෙයි උයන පිහන දේවල් තෙම තියන තැනුත් කියලා "අපි එනකොට උයාපල්ලා" කියා පිටත් කළා.

මේ අක්ක නාගෝ දෙන්නාත් යතුරු දෙක ඇරගෙන ගිහින් අක්කා ඇරියා අයියාගෙ ගෙයි දොර, නගා ඇරියා මල්ලීගෙ ගෙයි දොර. ඇරලා ඉවුම් පිහුම් කළා-හැන්දෑ වෙනකොට අයියා මලෝ දෙන්නත් ගෙදර ආවා. ඊට පස්සෙ මේ අක්කා නාගෝ දෙන්නා ඒ ගෙවල් දෙකේ ම රජ්ජාවෙන්ට උණා.



ඔහොම කලක් යන කොට මේ අක්ක නාගේ දෙන්නට ම දූ වරුන් දෙන්නෙනකුත් ලැබුණා. දූවරුනුත් ටිකෙකත් ටික ලොකු වුණා.

ඉතින් මේ දෙන්නාගෙන් නංගීගෙ ගෙදර බඩු මුට්ටු, ධන ධෛර්‍ය වැඩියෙන් තිබුණා අයියාගෙ ගෙදර එහෙමත් තිබුණේ නැ. මේ ගැන අක්කාට ඉරිසියා ඇතිවෙලා එවසර කියාගත්තා නගා මරා දමන්ට.

ඔන්න ඉතින් මේ දෙන්නාම අයියා මලෝ වැඩ කරන ලේලට බත් අරගෙන යනවා. එක දවසක බත් අරගෙන යනකොට නගා ඉස්සරහින් යනවා. අක්කා පස්සෙන් යනවා. ඔහොම යද්දී අක්කා කතා කර කීවා "ඇයි ද නගෝ උඹ කිප දෙකකින් ම නාගෙන නැතු නෙ. ඉන්න පිටෙන් ඔක්කොම කුණු බැදිලා. අපි දෙන්නා මේ ඔයෙන් නාගෙන යමු ය" කියා.

"හොඳයි එහෙනම් නාගෙන යමු" කියලා නගා එකඟ උණාම "ඔය ඇට වැල යි හැට්ටෙ යි ගලවා තියල මේ ඔයට බහපන්" කියලා දෙන්න ම කරේ තිබුණු ඇට වැලුත් ගලවා තියලා දියට බැස්සා. බැහැලා නාන අතරෙ "වතුරන් නාගේ උඹේ පිටේ කුණු උලන්ට" කියලා අක්කා නාගාට කතා කළා. නගා ළඟට ආවාම පිට උල උලා ඉන්න ගමන් එක පාරට ම අක්කා නාගාව ඔයේ මැදහට තල්ලු කර දැම්මා. ඉතින් නගා දියේ ගිලී මළා.

ඊට පස්සෙ අක්කා ඔයෙන් ගොඩ නැගලා නගාගෙ මාලෙත් හෙම අරගෙන බත් පෙට්ටි දෙකමින් ඇරගෙන ගියා කුඹුරට.

ඒ පාර මලයා ඇහුවා "ඇයි අපේ ගෙදරින් අද ආවේ නැත්තෙ මන්ද?" කියලා එතකොට අක්කා කීවා.

"එන්නෙ නැතෑ ඔය ගෙදරට වෙලා තොප්පයාඩම් නට නටා ඉන්නෙ" කියලා බස් දීලා ඈ ආයනු ගෙදර ආවා. ගෙදර ආවාම නගාගෙ දූ ලොකු අම්මා තනියෙන් එනවා දකලා ඇහුවා.

"ඇයි ලොකු අම්මෙ, තනියෙන්; කෝ අපෙ අම්මා?" කියලා.

"එන්නෙ නැතෑ ඔය කුඹුරට වෙලා හිටියෙ මං එනකොටත්" කියලා? ලොකු අම්මා කීවා.

හැන්දෑවෙ අයියා මලෝ දෙන්නා කුඹුරෙ ඉඳලා ගෙදර ආවයින් පස්සෙ මලයා දූවගෙන් ඇහුවා

"කෝ දූවේ අම්මා කියලා."

"අම්මා ලොකු අම්මාත් එක්ක බත් අරගෙන කුඹුරට ගියා. ලොකු අම්මා තනියම ආයනු ආවා. අපෙ අම්මා ආවේ නෑ. මං ලොකු අම්මාගෙන් ඇහුවා මයියා අම්මා නෑව කුඹුරෙයි කියල" දූව උත්තර දුන්නා.

"අම්මා ගියෙ නෑ අද කුඹුරට" කියලා ඒ පාර මලයා කීවා. කොහොමටත් එදායින් පස්සෙ සවුදියත් නගා ගෙදර ආවෙ නෑ.

ඊට පස්සෙ අක්කා මලයාවත් ඒ ගෙදරට අඬ ගහගෙන මලයාගෙ ගෙදර තිබුණ දේවලුත් ඔක්කොම තමන්ගෙ තනි සම්බුද්දියට අයිති කර ගත්තා.



ඔන්න, ඊට පස්සෙ එක දවසක් ගෙදර බත් උයලා ළමයින් දෙන්නා අතේ කුඹුරට පිටත් කළා. ළමයින් ඔය ළඟට ගියාම දුටුවා මහාද අපූරු කිරි ඉබ්බෙක් ඔයේ අයිනෙ ඉන්නවා. අක්කගෙ දූව ඌ අල්ලන්ට ගියාම ඌ ඔයේ ඈතට ඈතට ගියා. නගාගෙ දූව ඉබ්බා අල්ලන්ට ගියාම ඌ ළඟට ඇවිත් ළමයගෙ අතේ එජි ඉන්නවා. මේක දකපු අක්කගෙ දූව ගෙදර ඇවිත් ඔය සිද්දිය අම්මා එක්ක කීවා. එතකොට අම්මා හිතුවා මේ නම් අපෙ නගාම වෙන්ට ඕනෑ: ඒක නිසා මං මේ කිරි ඉබ්බා මරන්ට ඕනෑ කියලා හොර ලෙඩ අරගෙන නිඳ ගත්තා.

මේ කතාව අහගෙන හිටිය නගාගෙ දූව හනික ඔය ළඟට ගිහින් කිරි ඉබ්බට කීවා "අම්මෙ අම්මෙ ලොකු අම්මා කීවා උඹ මරන්ට ඕනෑ කියා.' ඒ පාරකොට 'කිරි ඉබ්බී කතා කරලා කීවා.

"හොඳයි දූවේ මගෙ මරාපුදෙන්. මං ගෙනිහින් හොදී හදල උඹටත් දෙයි එදින් වීගෙබුයි එක ඇට කෑල්ල-කුයි. උඹ ඒ ඇට කෑල්ල අරගෙන ගව් ගාලට ගිහින් "මේ අපේ අම්මා විග සත්හ නම් මේ ඇට කෑල්ලෙන් ඔබ ගසක් මැවෙන්ට ඕනෑ කියලා ඒක හිටවපන්" කියලා. හා හොඳයි කියලා දූව ගෙදර ගියා.

ඊට පස්සෙ හැන්දෑවෙ මිනිස්සු දෙන්නා ගෙදර ආවාම ඈ ලෙඩින් ඉන්නවා දකලා ඇහුවා "මොකද අපායු ගායෙ" කියලා.

එතකොට ඈ කීවා "අර ඔයේ ඉන්න කිරි ඉබ්බා අල්ලලා හොදී හදලා කන්ට ආසයි" කියලා.

ඉතින් මිනිස්සු දෙන්නා වැවට ගිහින් අර කිරි ඉබ්බී අල්ලාගෙන ආවා. ගෙන ඇවිත් හොදී හැදුවා. ඒ පාර ඈ නැගිටලා ඒවා කෑවා.

ඈ නාකාගෙ දුවටත් එයින් හොදි ඇතිත්තකුයි ඇට කෑල්ලකුයි බෙදුවා. ළමයා හොදි ටික බීලා ඇට කෑල්ල අරගෙන ගව ගාලට ගිහින් "මේ ඉන්නෙ අපෙ අම්මා මිය සත්ත නම් මේ ඇට කෑල්ලෙන් අඹ ගහක් මැවෙන්ට ඕනැ." කියලා ඇට කෑල්ල බිම දැමුවා.

එතකොට එතනින් අඹ ගහක් හැදිලා එක දවසින් ම ඒක ලොකු වෙලා පලත් ගත්තා. ළමයි දෙන්නාගෙන් නාකාගෙ දුව අඹ ගහ ළඟට යනකොට ගහ ඉඳුණු අඹ ටිකින් අතු බරවෙලා බිමට පාත් වෙනවා. ඒ ළමයා ඇති තරම් අඹ කඩාගෙන කනවා. අක්කාගෙ දුව අඹ ගහ ළඟට යන කොට අඹ අතු ඔක්කොම උඩ යනවා. ගෙඩි අල්ලා ගන්ට බැහැ. ඒ පාර ඒ ළමයා ඇවිදින් අම්මා දක්කදී අඹ ගහේ විත්තිය කීවා.

"හා හොඳයි මං ඔය අඹ ගහ කපලා ගිනි තපිනවා" කියලා ඈ හොර ලෙඩ ගත්තා.

එතකොට නාකාගෙ දුව දුවලා ගිහින් අඹ ගහට කීවා "අම්මෙ, අම්මෙ, ලොකු අම්මා කීවා අඹ ගහ කපලා ගිනි තපිනවා" යි කියලා. එතකොට අඹ ගහ කතා කරලා කීවා "හා හොඳයි ඒකට කමක් නෑ. අඹ ගහ කැපුවාම මෙතන එක පතුරු කෑල්ලක් වැටිලා තියෙයි. උඹ අරන් ඒක අරගෙන ගිහින් ගෙයි පිලිකන්නෙ දාපන් "අපෙ අම්මා සත්ත නම් මේකෙන් කැකිරි වැලක් අටගන්ට ඕනැ" කියලා. හා හොඳයි කියලා ළමයාත් ගෙදර ගියා



ඊට පස්සෙ මිනිස්සු දෙන්නා ගෙදර ඇවිත් ඈ වැතිරිලා ඉන්නවා දැකලා ඇහුවා "මොකද ගාය" කියලා.

"ගව ගාලෙ තියෙන අඹ ගහ කපාගෙන ඇවිත් ඒ දරෙන් ගිනි තපින්ට ආසයි" කියලා ඈ කීවා. ඉතින් මිනිස්සු දෙන්නා ගිහින් අඹ ගහ කපාගෙන ඇවිත් ගිනි ගොඩක් ගැහුවා. ඒ පාර ඈ නැගිටලා ගිහින් ගිනි තැප්පා.

ඊට පස්සෙ නාකාගෙ දුව අඹ ගහ තිබුණු තැනට ගිහින් එතන තිබුණු පතුරු කෑල්ල අරගෙන ඇවිත් ගෙයි පිළිකන්නේ ලෑවා "අපෙ අම්මා සත්ත නම් මේ පතුරෙන් කැකිරි වැලක් අටගන්ට ඕනැයි" කියලා.

ඒ පාර එතන කැකිරි වැලක් හැදිලා පල ගත්තා. නාකාගෙ ළමයා ගිහින් ඇති තරමක් කැකිරි කඩා ගෙන කනවා, අක්කාගෙ ළමයා කැකිරි කඩන්ට යන කොට වැල හරියෙ එක ගෙඩියක් නෑ.

ඒ පාර අක්කාගෙ ළමයා දුවලා ගිහින් මේ සිද්ධිය කීවා අම්මා දක්කදී. එතකොට අම්මා කීවා "හා හොඳයි මං ඔය කැකිරි වැල උදුරලා මැල්ලුමක් හදනවා" කියලා. මේ කතාව අහගෙන හිටිය නාකාගෙ ළමයා ගිහින් කැකිරි වැලට කීවා "අම්මෙ, අම්මෙ, ලොකු අම්මා කීවා කැකිරි වැල උගුල්ලා මැල්ලුමක් හදනවා" කියලා. එතකොට කැකිරි වැල කීවා "හා හොඳයි ඒකට කමක් නෑ කැකිරි වැල උගුල්ලුවාම එතන එක මුල් කෑල්ලක් ඉතුරු වෙයි. උඹ අරන් ඒ මුල් කෑල්ල අරගෙන ගිහින් වැවට දමාපන් "අපෙ අම්මා සත්ත නම් මේ මුල් කෑල්ලෙන් මානෙල් මලක් අටගන්ටය" කියලා. හා හොඳයි කියලා ළමයාත් ගෙදර ගියා.

ඊට පස්සෙ අක්කා ගිහින් කැකිරි වැල උදුරලා මැල්ලුමක් හැදුවා, එකත් කුණුණු මුල් කෑල්ල නංගාගෙ දුව ඇරගෙන ගිහින් "අපොයි අම්මා සත්ත නම් මේ මුල් කෑල්ලෙන් මානෙල් මලක් ඇටිගන්ට එපා" කියලා ඒක වලේ දැම්මා.

ඒ පාර අපූරු මානෙල් මලක් ඔයේ අටි ගත්තා. නංගාගෙ දුව ගිහින් දෝත පෑවාම මානෙල් මල ඇගේ දෝතට ඇවිත් හොඳට පිපිලා තියෙනවා. අක්කාගෙ දුව මල ළඟට යනකොට මල ඔයේ මැදට මැදට යනවා. ඒ පාර අක්කාගෙ ළමයා ගිහින් අම්මා දැක්කදී කීවා ඒ මලේ සිද්දිය. එතකොට ඈ කීවා "හා හොඳයි මං ඔය මල කඩා ගන්නම්" කියලා. ඉතින් නංගාගෙ දුව මේ කතාව අහලා ගිහින් මානෙල් මලට කීවා "අම්මේ, අම්මේ, ලොකු අම්මා කීවා මානෙල් මල කඩා ගන්නවා" කියලා. ඒ පාර මානෙල් මල කීවා "එයාට නම් නෑ ඒක නම් එයාට කවදාවත් කරන්න බෑ" කියලා.

ඉතින් මිනිස්සු දෙන්නා ගෙදර ආවාම ඈ කෝරි ලෑව ඇරගෙන කීවා ඔයේ තියන මානෙල් මල කඩාගෙන එන්ට කියලා. මිනිස්සු දෙන්නත් ගිහින් දන්න කාලෙ උත්සාහ කළා මල කඩා ගන්ට ඒත් බැරිවුණා.

එතකොට මිනිස්සු ගිහින් මේ අපූරු මල ගැන රටේ රජ්ජුරුවන්ට කීවා. රජ්ජුරුවොත් ඇතා පිටින් ඇවිදින් බලාලා රාජ පුරුෂයන්ට කීවා මල කඩා දෙන්ට කියලා. රාජ පුරුෂයොත් දන්නා කාලෙ උත්සාහ කළා මල නෙලා දෙන්න. ඒත් බැරිවුණා කවුරු ගියත් මල ඈතට යනවා.



එතකොට අර නංගාගෙ දුව එතන හිටලා කීවා මට නම් ඔය මල නෙලිහැකි කියලා. රජ්ජුරුවන්ට මේ කතාව ඇහිලා රජ්ජුරුවො ඇහුවා මොකක්ද උඹ කීවෙ කියලා.

ඒ පාර ඒ ළමයා කීවා "ඔය බෝධි දේවයන් වහන්ස මට නම් ඔය මල නෙලා දෙන්ට පුළුවන" කියලා.

"හොඳයි එහෙනං නෙලා දියන්" කියා රජ්ජුරුවො කීවා ම නංගාගෙ දුව ඔයට බැහැලා දෝත පෑවා විතරයි මල දෝතට ඇවිත් පිපී සිටියා.

ඒ පාර රජ්ජුරුවො මහාසේම සන්තෝස වෙලා ඒ ළමයා ඇතා පිට උඩ තියාගෙන මලත් අරගෙන රජ-මාළිගාවට ගියා.

# ලොකු අප්පු

එහෙමත් එක කාලෙක දෙමල්ලෝ දෙන්නෙකුට පුතෙක් හිටියා ලොකු අප්පු කියලා.

එක දවසක් මේ ලොකු අප්පුගෙ අම්මා දිය පාරට ගඟට ගියා ලොකු අප්පුට ගෙය බාර දීලා "කාවවත් ගෙට ඇතුළු වෙන්ට දෙන්ට එපා" කියලා.

අම්මා ගියායින් පස්සෙ ලොකු අප්පු දොරකඩම ම වෙලා ඉඳ ගෙන හිටියා ගෙට කවුරුවත් එයි ද බලාගෙන. මේ අතරෙ එක හිකනලෙක් ආවා ගේ දිහාට. එතින් ලොකු අප්පු කිව්වා "එයි නැවතියන් ගෙට එන්ට එපා" කියලා. හිකනලා කොලුවාගෙ කීම ගණන් ගන්නෙ නැ. ගේ ඇතුලට ම ගිහින් වහලෙ අස්සට ගියා. ලොකු අප්පුට හිකනලා එලවා ගන්ට බැරි වුණ නිසා ලොකු අප්පු වහලෙට ගින්දර තැබුවා. අම්මා දියත් අරගෙන ගෙදර එනකොට ගේ ඔක්කොම දලා අළු වෙලා ගිහින්. මොකද මේ කියල ඇහුවාම ලොකු අප්පු කිව්වා හිකනලෙක් ගෙට ආ නිසා ඌ එළවන්ට වහලෙට ගිනි තිබ්බයි කියලා.

ඊට පස්සෙ ලොකු අප්පුගෙ අප්පොච්චි ගෙදර ඇවිත් මේ සිද්ධිය අහලා, "හා එහෙනං වරෙං ලොකු අප්පු කැලේ යන්ට ලී කපන්ට වෙන ගෙයක් හද ගන්ට" කියලා පුතාත් අඩගහගෙන කැලේ ගියා. දෙන්නා එක්ක ඔහොම ගිහින්

1. දියට



කැලේ තියෙන ගහක් අද්දර ලී කැපුවා. මේ අතරෙ ලොකු අප්පු අප්පොච්චිගෙන් ඇහුව කොහාට ද අප්පොච්චි මේ ගහ ගන්නෙ කියලා. ලොකු අප්පුත් එක්ක තරහෙයෙන් හිටිය අප්පොච්චි කීවා "ඔක පහවෙනකොටෙ ගෙදර" කියලා. ලොකු අප්පුත් මේ කතාව ඇහුවට ම බාර අරගෙන අප්පොච්චි කැපූ කැපූ ලී එකකු කර කර ගඟට දැම්මා "ගෙදර පලයල්ලා" කියලා. අන්තිමට අප්පොච්චි බැලුවාම එකම එක ලීයක්වත් නැ. ඔක්කොම ටික ගඟේ ඇරලා. අප්පොච්චිට තරහ ඇවිත් ලී කොටයක් අරගෙන ලොකු අප්පු ලී කොටේට තියලා කල වැලකින් බැඳලා "තෝත් එහෙනම් පල ගෙදර" කියලා ගඟේ පාකරලා ඇරියා.

ගඟ පහළ මහල් තොටුපොළ හිටිය ගොයි රාළ කෙනෙක් ගඟේ යන කොලුවා දැකලා ගොඩ ගත්තා. අර ගෙන මහල කොටුව පරෙස්සම් කරන්ට පුළුවන්ද කියලා ඇහුවා. ලොකු අප්පු කීවා පුළුවන කියලා. කොලුවාගෙ නම මොකක් ද කියලා ඇහුවාම කීවා "වැල් ලෙවන්නා මුල් අල කන්නා" කියලා. හොඳයි කියලා ගොයිරාළත් ලොකු අප්පු කොටුවේ පැලේ නවත්තලා ගෙදර ගියා. දවස් දෙකකට පස්සෙ ගොයිරාළ කොටුවට ඇවිත් බැලුවාම කොලුවා මහල වැල් ටික ඔක්කොම ලෙවලා අල කාලා. ඒ පාර ගොයිරාළ කොලුවා අල්ලල අර කොටේට ම තියා බැඳලා ආයෙත් ගඟේ පාකර ඇරියා.

ගඟේ තව පහළින් හිටියා තවත් ගොයිරාළ කෙනෙක් මේ කොලුවා දැකලා ආයෙත් ගොඩට ගත්තා. මේ ගොයිරාළ ඇහුවා ලොකු අප්පුගෙන් මගෙ කෙසෙල් කොටුව පරෙස්සම් කරන්ට උඹට ඉන්ට පුළුවන් ද කියලා. ලොකු අප්පු කීවා පුළුවනි කියා. නම මොකක්ද ඇහුවාම

ලොකු අප්පු කිව්වා "අමාරුවෙයියන් තලන්නා[1] මුල් ඇවරි කන්නා" කියලා. ඒ පාර ගොයියාළ කොලුවා කෙසෙල් කොටුමට පැළ නවත්තලා ගෙදර ගියා. පසුව ද ගොයි-රාළ ඇවිත් බැලීන් නැට මේ කොලුවා කෙසෙල් පැල ටික ඔක්කොම පොඩි කරලා කෙසෙල් කැන්වල මුල් ඇවරි කාලා. ඒ පාර ඒ ගොයි රාලත් ලොකු අප්පුට ගහලා එතනින් පැන්නුවා.

ඊට පස්සෙ ලොකු අප්පු කලක් තියම්සෙ තැන් තැන්වල ඇවිද ඇවිද ඉඳලා පහුවෙන ගෙදරක පදිංචි උණා. මේ ගෙදර කිට්ටුවකිබුණා බෙරවා කුලේ මිනිසුන් ඉන්න ගමක්. ලොකු අප්පු මේ ගමට ගිහින් බෙරවා මිනිසුන්ගෙන් ණය ගන්ට පුරුදු උණා. මාස කීපෙකට පස්සෙ මේ ණය කාරයා එකතුවෙලා දවසක් ගියා ලොකු අප්පුගෙන් ණය ආපහු ඉල්ලන්ට.

ණය කාරයන් එන බව දැන සිටියාම උට්ටව ලොකු අප්පු ගෙදර මිනිසුන්ට රහසක් කියලා ගෙදර තිබ්බ කිඩැල්ලක්, අටුවට නංගවලා ඉමෙහෙ කුඹුරු පිහිය අරගෙන ලොකු පොල්ලක් රැහැ රැහැ හිටියා. ණය කාරයො ආවාම ගෙට අඩ ගහලා වාඩි වෙන්න දුන්නා- දීලා, ගෙයි තිබ්බ ව්‍යසන ගැටියකට අඩ ගහලා අර පොල්ලෙන් හොඳ හයිය ඇති පාරක් ගහලා අර අටුවට ම දැම්මා. ඊට පස්සෙ ලොකු අප්පු පුවක් ගෙඩියක් කපලා ටික වෙලාවකට පස්සෙ කතා කරලා කිව්වා "ඔය අටුවෙන් මුලත් ටිකකුත් අරගෙන බැහැපන්" කියලා. එතකොට අර කලින් අටුවට නැගලා හිටපු කිඩැල්ල මුලකුත් අරගෙන අටුවෙන් බැහැලා ආවා.

1. කුඹා පතල්ල පරුණිය.



මේ කාරණේ දැක්ක ණය කාරයො හොඳටම පුදුම උණා. ඒ මිනිස්සු මේ ගැන ඇහුවාම ලොකු අප්පු කිව්වා මේ පොල්ලෙ ආනුභාවෙන් නාකි ගෑනුන් තිරිහන්[1] කරන්ට පුළුවනි කියලා.

මේ කතාව ඇහුවම අර ණය කාරයන්ට මේ පොල්ල ලබා ගන්ට ලොකු ආසාවක් ඇතිවුණා. ඉතින් ලොකු අප්පුට කිව්වා අපට එන්ට තියෙන ණය වෙනුවට මේ පොල්ල දෙන්ට කියලා. ඒත් ලොකු අප්පු ඒකට කැමති වුණේ නැහැ. ඒ මිනිස්සු පිංසෙන්දු උණා; ඒත් ලොකු අප්පු මේ පොල්ල නම් දෙන්ට බැරිමය කියාගෙන හිටියා. ඒ පාර අර මිනිස්සු වට වෙලා ලොකු අප්පු අතින් පොල්ල උදුරාගෙන කෙළින් ම ගෙදර ගියා.

ඊට පස්සෙ පොල්ල අරගෙන ගිය මිනිස්සු ගෙවල තිබ්බ ව්‍යසන ගෑනුන්ගෙන් ටංගුවකට අඩගහලා ඒවා තිරිහන් වෙන්ට අර පොල්ලෙන් හොඳටම ගහලා අටුවලට දැම්මා. ඊට පස්සෙ හොඳට තිරිහන් වෙන්ට කියලා තුන් දවසක් ම යන්ට ඇරියා. ඊට පස්සෙ දැන් හොඳට තරුණ වෙලා ඇති කියලා ගිහින් අටුවලට නැගලා බැලුවාම තිරිහන් වෙනවා වෙනුවට ඔක්කොම මැරිලා හිටියා.

ඒ පාර මේ මිනිස්සු ටික කේන්තියෙන් පිපිරි පිපිරී ගියා ලොකු අප්පුගෙන් පළි ගන්ට කියලා. ගිහින් කිව්වා "උඹ අප රැවැට්ටුවා. අපේ ගෑනු තිරිහන් වෙනවා වෙනුවට මේ පොල්ලෙන් බැට කාලා මැරිලා ගියා කියලා.

එතකොට ලොකු අප්පු කිව්වා "අනේ! අනේ! පොල්ලෙ දැරදි පැන්න පාට්ටි කරලා කර ගත්තු වින්නැහියන්.

1. විහංගයක්

ඉන්න් මං මොකද කරන්නෙ. මට ඒ වගේ කියන්ටවත් ඉඩක් දුන්නා යැ. මගෙන් බලාත්කාරෙන් උදුරාගෙන උන් පොල්ල හෙම්බෙව, හරි පැත්තෙන් ගැහුවා නම් තිරිහන් වෙනවා. වැරදි පැත්තෙන් ගැහුවාම මැරෙනවා තමයි" කියලා

එහෙම කියලා මේ පාර ඇඹෙයි නොවිරදින්ට මං පොල්මල කට්ටයක් කපා දෙන්නම් කියලා පිහිය අරගෙන කට්ටයක් කපලා දීලා කිව්වා "හරි පැත්තෙන් හරියට කැල්ලවත් කීයි ම, අනුමානයක් නැතුව තිරිහන් වෙනවා මයි" කියලා.

බෙරවා මිනිස්සුන් ඒ පෙන්න පොල්ල අරගෙන ගමට ඇවිත් අතිරි වෙලා හිටිය වයසක ගෑනු ටික අදනා එකතු කරලා අර පොල්මල හරි පැත්තෙන් හොඳට තළලා උන් අවුවලට දැමුවා. ඊට අනේ දවසකට පස්සෙ බැලුවාම ඒ ගෑනුන් මිත්තොම් අදනා මැරී හිටියා.

මේ ගමින හොඳට ම ගත්තසි ගිය මිනිස්සු ඇවිදින් ලොකු අප්පු අල්ලා බැඳලා ගෝනියක දමාගෙන අරගෙන ගියා ගඟේ දමන්ට කියලා. මේ මිනිස්සු ලොකු අප්පුත් කර තියාගෙන මෙහෙම යනකොට එක තැනකදී ඇහුණා හේවිසියක් ගහන සද්දයක්. ඒ පාර අර මිනිස්සු ලොකු අප්පු ඉන්න ගෝනිය මග අයිනෙ දමලා ගියා හේවිසි අඩි ඇහෙන තැනට බලන්ට.

මේ අතරෙ ලොකු අප්පු ගෝනිය ඇතුළෙ නිකං හිටියෙ නෑ. කෙඳිරි ගාන්ට පටන් ගත්තා- "මේ අනෙක කරුමලයක් ද? නැතුව ම මෙහෙත් කරන්ට පුළුවන් වැඩක් ද මට මළ පසේ අකුරක් බැරුව ඉඳගෙන මං කොහොම ද රජ කම් කරන්නෙ" කිය කියා.



මේ මගින් යන්ට ආ රෙදි වෙළඳාම් යන තම්බි කෙනෙකුට මේ කෙඳිරිය ඇහිලා ටිකක් වෙලා කනවට කන් දීගෙන ඉඳලා කතා කරලා ඇහුවා "මේක මොකද අයියා, කියාන්නෙ?" කියලා ගෝනිය ලිහුවා. එතකොට ලොකු අප්පු කිව්වා මේ මිනිස්සු මට කරදර කරනවා රටේ රජකම් කරන්ට කියල. අකුරැත් බැරි නිසා මම ඒකට කැමති නෑ, ඒත් කිව්ව අහන්නෙ නෑ. මා බලෙන් අල්ලලා මේ ගෝනියෙ දමලා උන් ගියා පෙරහැරක් ගේන්ට කියලා ඕය හේවිසි සද්දයක් ඇහෙන්නෙ ඒක වෙන්ට ඇති" කියලා.

එතකොට තම්බි කිව්වා, "මේක අයියා තමුසෙට පැප්පා නම් මට දෙනවා- මට කිහ අකුරක් කමා පුළුවනි" කියලා.

ඒ පාර ලොකු අප්පු "හා හොඳයි තම්බි උඹ එහෙනං මේ ගෝනියට රිංගාපන් කියලා" තම්බි ගෝනියට දාලා කොණ්ඩ කර බැඳලා තම්බිගෙ රෙදි පොදියත් අරගෙන හනික එතනින් පැනලා යන්ට ගියා.

බෙරවා මිනිස්සුත් ටික වෙලාවකට පස්සෙ ඇවිත් ගෝනිය කර තියාගෙන ගිහින් ගඟේ දාලා ගඟ අයින දිගේ ම ආපහු එන්ට ආවා.

මෙහෙම එනකොට ඒ ළඟ ම වෙන මංසන්ධිය ලොකු අප්පු තාන් රෙදි ගොඩක් දමාගෙන ගේනවා දකලා අර මිනිස්සු පුදුම වුණා. පුදුම වෙලා ලොකු අප්පුගෙන් ඇහුවා, "ආ ලොකු අප්පුහාමි, මොකද මේ තමුසෙ කොහෙ ඉඳලා ද ආවෙ? කොයින් ද මේ වෙළඳාරන්න අලුත් රෙදි ගොඩක්" කියලා.

එතකොට ලොකු අප්පු කිව්වා දෙවා තම්බි මට ගඟ පල්ලෙ තිබිලා හම්බ වුණු දේවල්. උඹලා මා ගෝනිය

පිටින් ගහට දැමුවා. ඉතින් මේවායෙ මඩ තියන නිසා මං මේ හෝදනවා කියලා.

ඒ ගමන අර මිනිස්සු ලොකු අප්පුට පිං සෙත්බු වෙන්ට උණා "අනේ අප්පුහාමි අපටත් මේ රෙදි ටිකක් ගන්ට සැලැස්සුවොත් බොහොමින් ම ලොකු උදව්වයි," කියලා.

ඒ පාර ලොකු අප්පු කීවා "හා එහෙනං උඹලාත් දුවලා ගිහිල්ලා එක එක ගෝනිය හොයාගෙන විගහට වරෙල්ලා" කියලා.

ඉතින් ඒ මිනිස්සුත් ලඟියේ[1] දුවලා ගිහින් ගෝනි අරගෙන ආවා.

ලොකු අප්පු මුන් එක එකා ගෝනිවලට දමලා හොඳට තිර වෙන්ට කොණ්ඩ කර බැඳලා ගඟට දැමුවා. ඊට පස්සෙ ඒ මිනිස්සුන්ගෙ ගමට ගිහින් උන්ගෙ දේපල ඉඩ ගඩමුත් අයිති කරගෙන යන්තින් හිටියා.

1 හනික-ඉක්මනින්



# බ්‍රාහ්මණ කුමාරි

එකමත් එක නුවරක හිටියා පුංචි රජ කුමාරයෙකු යි පුංචි රජ කුමාරියකු යි අකුරට ඇවිත්. මේ දෙන්නා හැමදම අකුරට යන්නෙ එකට යි. එක දවසක් මේ දෙන්නා එකට එනවා දැකලා ආචාරි දෙන්නට ම අවවාද කළා මින් මතු දෙන්නා එකට අකුරට එන්ට එපා කියලා.

ඊට පස්සෙ මේ කුමාරි යි කුමාරය යි එකට නැවත් කුමාරි ඉස්සර වෙලා එනවා; කුමාරයා පසුවෙලා එනවා, ඔහොම යන අතරෙ එක දවසක මේ කුමාරි ඉස්සරවෙලා ඇවිත් දිය බොන්ට ළිඳට කර බෑවා- එතකොට කුමාරි-ගෙ අතේ තුබුණ ගල්ලැල්ල ළිඳ ඇතුළට වැටුණා. කුමාරි හිටියෙ තනියම නිසා ඇට ගල්ලැල්ල ළිඳෙන් ගන්ට බැරි වුණා.

එතකොට ම කුමාරයාත් එතනට ආවා. කුමාරි කීව කුමාරයාට "මගේ ගල්ලැල්ල ළිඳේ වැටුණා, අනේ මට ඒක අරගෙන දෙනවා ද" කියලා.

ඉතින් ඒ පාර කුමාරය කීවා "හොඳයි මං ගල්ලැල්ල අරගෙන දෙන්නම්, හැබැයි මිට පොරොන්දුවක් වෙනවා නම්: ලොකු උණාම මං ඇර වෙන කා එක්කවත් කසාද බඳින්නෙ නැතෙයි" කියලා.

කුමාරියත් කුමාරයාගෙ ඇඟේ අත තියලා දිවුරුවා "කුමාරයා ම ඇර වෙන කවුරුන්වත් කසාද බඳින්නෙ නැහැ" කියලා. කුමාරයාත් එහෙම ම දිවුරුවා "මේ කුමාරි ඇර වෙන කවුරුවත් කසාද බඳින්නෙ නැහැ" කියලා. ඊට පස්සෙ කුමාරයා ගල්පැල්ල අරගෙන දුන්නා.

ඊට පස්සෙ කුමාරි ඉස්සර වෙලා ගියා: කුමාරයා පස්සෙන් ගියා.

ඔය දෙන්නාම බොහොම හොඳට අකුරු ඉගෙන ගෙන තම තමන්ගෙ රටවලට ගියා. පස්සෙ කුමාරයා වැඩිවිය පැමිණුණාම පිය රජ්ජුරුවො අදහසක් කළා වෙන රටක රාජ කුමාරිකාවක් මේ කුමාරයාට සරණ පාවලා දෙන්ට. එහෙම අදහස් කරලා ඒ ගැන කුමාරයා ගෙන් කැමැත්ත විමසුවාම කුමාරයා කීවා "මට මං කැමැති කුමාරිකාවක් සරණ පාවා ගන්න. හැබැයි වෙන රටක රාජ කුමාරිකාවක් නෙමෙයි. අසවල් රටේ අසවල් රජ්ජුරුවන්ගෙ දූ කුමාරිකාව; එහෙම නැත්නම් මට කසාද බඳින්ට වුවමනා නැහැ" කියලා.

එතකොට රජ්ජුරුවො ඇහුවා "උඹට රාජ්‍යය ඕනෑද එහෙම නැත්නම් මේ කියන කුමාරිය ම ඕනෑද" කියලා.

කුමාරයා ඒකට කිව්වා "මට ඕනෑ නැහැ රාජ්‍යයක්. මට ඒ කුමාරිය ම ඕනෑ" කියලා.

හොඳයි එහෙනම් කියලා රජ්ජුරුවො ඒ කුමාරිගෙ පිය රජ්ජුරුවන්ට පණිවිඩයක් ඇරියා කුමාරිය ගැන අහලා. ඒ පාර ඒ කුමාරියගෙ පිය රජ්ජුරුවො කීවා "මං මගෙ දූ කුමාරිය දෙන්නෙ මගෙ මේ ළිඳ පිරෙන්ට රත් රන් දුන්න කෙනාකුට යි" කියලා.



ඒ පාර මේ කුමාරයා පිය රජ්ජුරුවන්ගෙ ගබඩා-වෙන් රත්රන් ගෙන ගිහින් අර ළිඳ පුරවා දීලා කුමාරිය ලබා ගත්තා. මේ දෙන්නා කසාද බැඳලා කුමාරයාගෙ පිය රජ්ජුරුවන්ගෙ මාලිගාවේ ටික දවසක් වාසය කළා.

එතනදි එක දවසක් පිය රජ්ජුරුවො පුතාට කතා කර කීවා "උඹ කලින් කීවා නේ රාජ්‍යයක් ඕනෑ නැහැ, කුමාරිය විතරයි ඕනෑ කියලා. ඒ නිසා දැන් තවත් මගෙ මාලිගාවෙ ඉන්ට බැහැ කැමැති තැනකට යන්ට හොඳයි' කියලා.

ඊට පස්සෙ මේ කුමාරය යි කුමාරි යි ගියා කුමාරිගෙ පිය රජ්ජුරුවන්ගෙ මාලිගාවට. ඒ මාලිගාවෙ ටික දවසක් ඔහොම ඉන්න කොට කුමාරිගෙ පිය රජ්ජුරුවො එක වසක කීවා "මම ළිඳක් පුරවලා රත්රන් අරගෙන කුමාරිය දික්කා. ඒ නිසා උඹලාට මගේ මාලිගාවෙ ඉන්ට බැහැ. කැමති තැනකට යන්ට පුළුවනි" කියලා.

එතකොට මේ කුමාරය යි කුමාරි යි දෙන්නා හොයි දේ වෙන්නෙත් හොඳට යි කියලා මගට බැහැලා ගියා වෙන රටකට යන්ට. ඉතින් මේ යන ගමන ම කුමාරි-කාව හැට්ටයක් මහ මහ ගියා. මේ කුමාරි මැහුමට දක්ෂ යි. ඔහොම බොහොම දුර ගිහින් වෙන රටකට පැමි-ණුණාම මේ දෙන්නා මඟ අයිනෙ තිබුණ අම්බලමක නැවතුණා. නැවතිලා කුමාරිය තමන් මහමින් ගිය හැට්-ටය මහලා ඉවර කරලා කුමාරයාත් අතට දීලා කිව්වා නුවර ඇතුළට ගිහින් මේ හැට්ටය විකුණා අපට කෑමට මොනවත් අරගෙන එන්ට කියලා.

ඒ පාර කුමාරයාත් වෙළඳාම් පුරුදු නැතත් හොඳයි කියලා මේ හැට්ටිය අරගෙන කඩ වීදියට ගියා විකුණන්ට. කඩ වීදියෙ වෙළෙන්දෝ හැට්ටිය බලාලා පුදුම වෙලා මේක බොහොම වටිනා හැට්ටියක් අපට මේක ගන්ට වත්කම නෑ කියලා කිව්වා.

එතකොට කඩ වීදියෙ හිටපු රාජ පුරුෂයො වගයක් මේ කතාව අහලා කිව්වා හැට්ටිය අරගෙන යන්ට කියලා රජ්ජුරුවන්ගෙ මාලිගාවට. කුමාරයත් ඒ මිනිසුන් එක්කම හැට්ටියත් අරගෙන රජ මාලිගාවට ගියා-රජ්ජුරුවො හැට්ටිය දකලා බොහොම සතුටු වෙලා මසුරන් මලු දෙකක් ම දීලා හැට්ටිය ගත්තා. ඉතින් කුමාරයාට මේ මසුරන් මලු දෙක ම එක වර ගෙන යන්ට බැරුව කුමාරයා එක මල්ලක් දෙවෙනි ගමනට ගෙනයන්ට කියලා එක මල්ලක් අරගෙන ගියා.

එතකොට ම රජ්ජුරුවො,-රජ්ජුරුවන්ට සැක හිතුණා හැට්ටෙට මැහුවෙ රාජ කුමාරියක කියලා. රාජ පුරුෂයන්ට කැඳවලා අණ කළා අර කුමාරයා මසුරන් මල්ල අරගෙන යන්නෙ කොහාටද බලාගෙන ඉක්මනට එන්ට කියලා. ඉතින් රාජ පුරුෂයෝ රජ අණ හැටියට කුමාරයා පස්සෙන් ම අම්බලම ළඟට ගිහින් හනික ආපහු මාලිගාවට ආවා-ඇවිත් රජ්ජුරුවන්ට කිව්වා කුමාරයා ගියේ අම්බලමට යි. ඒ අම්බලමේ ඇතුළට කතාට හොඳ අපූරු කුමාරිකාවක් ඉන්නවා කියලා.

කුමාරයාත් මසුරන් මල්ල අම්බලමේ ගිහින් තියලා අනිත් මසුරන් මල්ලත් ගෙනයන්ට ආපහු මාලිගාවට හැරිලා ආවා. ඒ අතරවාරෙ රජ්ජුරුවො අස්සයෙකු පිට නැඟිලා හනික අම්බලමට ගිහින් අර කුමාරිය අස්සයා පිට උඩ තියාගෙන මාලිගාවට ආවා වෙන පාරකින්.



ඉතින් කුමාරයා මසුරන් මල්ලත් අරගෙන අම්බලමට ගිහින් බැලින්නම් කුමාරිකාව අම්බලමෙ නැහැ. කුමාරයාත් වටේ ම හෙව්වා, අඬ ගැහුවා, ඒත් කුමාරි නම් නෑ. ඒ පාර කුමාරයා ශෝකයෙන් මසුරන් මලු දෙකත් අරගෙන මඟ දිගේ ගියා.

මේ වෙලාවෙ කුමාරිය මාලිගාවේ උඩු මාලෙ පුර-හාවල් ඇතුළු තියලා උන්නා-කුමාරිකාව ජනේලෙකින් බැලුවම දැක්කා අර කුමාරයා ඈත එනවා. ඒ බව කුමාරිකාව එතන හිටිය සේවිකාවන්ට කිව්වා මට පිපාස යි හනික දෙහි ගෙඩියක් ගෙනැවිත් දෙන්ට කියලා. සේවිකාවොත් දෙහි ගෙඩියක් ගෙනෙන්ට ගියා. ඒ පාර කුමාරිකාව ලියුමක් ලිව්වා මෙහෙම; කොහොමද: "ඔය මසුරන් මලු දෙක ම හරි දීලා අස්සයින් දෙන්නෙකු අරගෙන ඒව මේ මාලිගාව ළඟට ඇවිත් අස්සයො දෙන්නා බැඳලා නොපෙනී ඉන්ට. රජ්ජුරුවො නින්දට ගියාම මම යන් ගැට ගලා මෙතෙකින් බැහැලා ඇවිත් අස්සයකු පිට නඟිනවා එතකොට පිටත් වෙන්ට සූදානමින් ඉන්ට" කියලා.

ඊට පස්සෙ කුමාරිකාව දෙහි ගෙඩියෙ මැද්ද ගලවලා ලියුම ඒක ඇතුළට රුවලා ආයෙත් මැද්ද හොඳට හද කරලා, කුමාරය එතනින් යන්ට යන කොට පුරහාවලට හොරෙන් කුමාරයන් ඉස්සරහට විසි කළා.

කුමාරයින්ටත් හොඳට බඩගිනි වෙලාව. දෙහි ගෙඩිය සැමට හොඳයි කියලා අවුලාගෙන ගියා. ගිහින් ලොකු නිම්බ ගහක් යට හෙවණේ ඉඳගෙන දෙහි ගෙඩිය පලිඇරියා. එතකොටම කුමාරයා දුටුවා ලියුම. කුමාරයාත් කළේ මොකද ලියුම හෙමියෙන් කියෙව්වා. කුමාරයා ලියුම

කියවන කොට ඒ ගහ උඩ නැගලා හිටිය කරුමාන්තයෙක් කරුමාන්තයා නිවට කින්නරයෙක්-ලියුම මක්කොම අහගෙන හිටියා.

ඉතින්, ඊට පස්සෙ කුමාරයා ගිහින් මයුරන් මල්ලු ඉඳකම් දීලා හෙට්ටිරාළ මහගෙතුගෙන් අස්සයින් දෙන්නා-කුත් අරගෙන ආවා-ඇවිත් ඒ මෙවන්ට කිව්වුව රජමාලි-ගාව ළඟ ලියුමෙන් කියාපු හැටියට අස්සයො දෙන්නා බැඳලා හාන්සි වෙලා හිටියා. ඔහොම ඉන්න කොට අර ලියමන කියවනවා අහගෙන හිටිය කින්නරාත් මිය වෙලාවට ඕනෙකන්ට ආවා.

“අනේ. මාත් අද රෑට මේ මින්තිය අයිනෙ නිද ගන්ට ඕනැ” කියලා.

කුමාරයා කීවා “මෙතන නාවතින්ට බෑ රජ්ජුරුවො දැනගත්තොත් අපි දෙන්නාම එළවා දමයි” කියලා.

එතකොට ආයෙත් කරුමාන්තයා කීවා, “අනේ එහෙම කියන්ට එපා. මාත් කොහොම හරි අද මෙතන නිදගන්ට ඕනැ” කියලා මිනිහාත් හාන්සි උණා- ටිකක් වෙලා යනකොට කුමාරයාට වෙහෙස නිසා නින්ද ගියා. ඒත් කරුමාන්තයා නිද නොගෙනම හිටියා කුමාරිය ලබා ගන්ට හිතාගෙන.

ඉතින් රජ්ජුරුවො නින්දට ගියාටින් පස්සෙ කුමාරි-කාව පට් එකින් එක ගැට ගහලා උඩු මහලෙන් බිමට බැහැලා අස්සයින් හිටි තැනට ඇවිත් අස්සයකු පිට නැගුණා. කුමාරිකාව මේ අස්සයා පිට උඩ නගිනකොටම



කරුමාන්තයා නැගිටලා ඇවිදින් අනික් අස්සයා පිට උඩ නැගුණා. නැගිලා දෙන්නාම එකට පිටත් වෙලා ගියා. කුමාරි හිතුවෙ මේ කුමාරයායි කියලා.

ඔහොම ගිහින් ගිහින් එළිය වැටුණකොට පස්සෙ කුමාරි බලුවාම යි දැනගත්තෙ ඇවිත් ඉන්නෙ කරුමාන්තයා එක්ක බව. ඒ පාර කුමාරිය අස්සයා නැවැත්තුවා, නවත්-තලා කරුමාන්තයාට කතා කර කීවා මට බොහොම පිපාස යි ගිහින් මට බොන්ට දිය ටිකක් ගෙනත් දෙන්ට කියලා.

කරුමාන්තයා කීවා “මට බැහැ දිය ගෙනෙන්ට, තියෙන තැනකට ගිහින් බොන්ට” කියලා.

ඉතින් කුමාරි තවත් වරක් කීවා පි- සෙන්ඩු වෙලා. ඒ මෙන කරුමාන්තයා හිතුවා කුමාරිට ඇත්තට දිය තිබහ ඇති කියලා අස්සයා පිටින් බැහැලා දිය ගෙනෙන්ට ගියා. එතකොට කුමාරිකාව කඩුව ඇදලා අරගෙන කරුමාන්තයා නැගලා ආ අස්සයාගෙ බෙල්ල කපා දලා තමන්ගෙ අස්සයා පන්නාගෙන වේගයෙන් ගියා. කරුමාන්තයා ටික දුරක් කුමාරිය පස්සෙන් දුවලා දුවලා දුවන්ට බැරිව හිටියා.

කුමාරියත් ඔහොම ගැලූ පාරක් දිගේ යනකොට ඉස්සරහට හම්බ උණා වැද්දන් හත් දෙනෙකුත්. මේ වැද්දෙ දුර තියාම කුමාරිකාව දැකලා එක එනා අවර කරන්ට උණා. මට යි ඒ එන කුමාරිකාව මට යි කියලා. මේ කතාව ඇහිලා කුමාරිය නැවතිලා වැද්දන් අතින් ඇහුවා මොකද උඹලා කලබල කරන්නේ කියලා.

එතකොට වැද්දෙ හත් දෙනා ම කීවා “කුමාරිකාවුන් මට යි මට යි” කියලා.

එතකොට කුමාරිය උඹලාට මේ විදින්නම් කියා හිනා ගෙන කිව්වා "උඹලා හත් දෙනා ම එක අතට ඊ ගතක් විදපල්ලා. වඩා ම දුරට ඊය විදද එක්කෙනාත් එක්ක මම කසාද බඳිනවා" කියලා.

ඉතින් වැද්දෝ හත් දෙනා ම හරි කියලා මිට එකක වෙලා ඊ ගතක් විදලා ඒ ඊ අවුලන්ට දිව්වා. මේ අතරේ කුමාරිකාව අස්සයා පන්නාගෙන වේගෙන් පැන ගියා. වැද්දෝත් පස්සෙ පාරෙ එළවුවා. ඒත් වැද්දන්ට කුමාරියගෙ අහලකටවත් කිට්ටුවෙන්ට බැරිවුණා.

අම්බලමේ හිටිය කුමාරයා අවදිවෙලා බැලින්නම් අස්සයාත් නෑ. කින්නරයත් නෑ. එතකොට ම කරු-මක්කයා කුමාරි එක්ක ගියා තමයි කියලා කුමාරයා අඬ අඬා යන්ට ගියා.

අස්සයා පිටේ ගිය කුමාරිකාව ඔහොම ගිහින් ගිහින් වෙන රටක දුප්පත් බ්‍රාහ්මණ ගෙදරකට ගියා. ඒ ගෙදර ඉඳලා බ්‍රාහ්මණයකු විගේ ඇඳගෙන ගියා ඒ රටේ රජ්ජුරු-වන්ගෙ මාලිගාව ළඟ තුබුණ පල්ලියකට-පල්ලිය කියන්නෙ අකුරු උගන්නන තැනකට-ගිහින් එතන හිටිය ළමයකුගෙන් ගල්ලෑල්ලක් ඉල්ලාගෙන ඒකෙ ලිව්වා බ්‍රාහ්-මණ අකුරුවලින් සිලෝවක්. මේ සිලෝව ළමයින්ට කියා ඒ පල්ලියෙ අකුරු කරවන ගුරුන්ටවත් කියවන්ට බැරිවුණා. ඒතකොට ම රජ්ජුරුවන්ට ආරංචි වුණා බොහොම උගත් බ්‍රාහ්මණයෙක් පල්ලියට ආවා කියලා. රජ්ජුරුවො පණිවිඩයක් යවලා මේ බ්‍රාහ්මණයා ගෙන්නලා එයාගෙ උගත්කම ගැන පැහැදිලා මේ පල්ලියෙ ළමයින්ට අකුරු කරවන ගුරු කමට පත්කළා.



ඉතින් මේ කුමාරි ඔහොම උගන්න උගන්නා කලක් ඉන්න කොට මිනිස්සු ගිහින් රජ්ජුරුවන්ට කිව්වා "මේ ඉන්නෙ බ්‍රාහ්මණයෙක් නෙමෙයි කුමාරියක"යි කියලා.

"හා හොඳයි එහෙනම් අපි බලමු" කියලා රජ්ජුරු-වො රාජ පුරුෂයන්ට කිව්වා "මේ බ්‍රාහ්මණයා මල් උයනට එක්ක යමු. ඒ බ්‍රාහ්මණයෙක් නම් එක මලක් කඩා ගෙන ඇඟෙට කිට්ටු කරලා ඒක කරකව කරකවා එයි. ඒ ගෑනි-යක් නම් මල් ගුහාක් කඩාගෙන සිංඩාන්නු පොතෙට දමාගෙන එයි" කියලා.

මේ බ්‍රාහ්මණයා මේ කාලෙ ඇති කරගෙන හිටියා ගිරවකු. මේ ගිරවා වහල මුදුනෙ ඉඳලා මේ කතාව අහ-ගෙන බ්‍රාහ්මණයාට ඇවිත් කිව්වා.

ඊට පහුව ද රාජ පුරුෂයො ඇවිත් බ්‍රාහ්මණයාට කතා කළා මල් උයන බලන්ට යන්ට. හොඳයි කියලා බ්‍රාහ්මණයත් ගියා. ඒත් ගිරවා කී කතාව හිතේ තියාගෙන එක මලක් විතරක් කඩා ගෙන ඒක ඇඟෙට කිට්ටු කර ගන කරකව කරකවා මල් උයනෙන් ආවා. රජ්ජුරුවො මේ දැකලා මිනිස්සුන්ට කිව්වා "ඊත් මනක නෙම කවුරුවත් කියන්ට එපා මේ බ්‍රාහ්මණයා ගෑනියක කියලා. ඒ බ්‍රාහ්මණයෙක් මයි" කියා.

රජ්ජුරුවො එහෙම කිව්වාට මොකද ඊට පස්සෙත් වරක් මිනිස්සු ඇවිත් රජ්ජුරුවන්ට කියන්ට උණා "මේ නම් බ්‍රාහ්මණයෙක් නෙමෙයි ගෑනියෙක්ම ය" කියලා.

"හා හොඳයි ආයෙත් බලමු" කියලා රජ්ජුරුවෝ මිනිස්සුන්ට කීවා "හෙට ඒ බ්‍රාහ්මණයා මගෙ බුලත් වත්තට එක්ක යමු. ඒ ගැනියක් නම් බුලත් හුහක් කඩාගෙන මඩොක්කුවේ දමාගෙන එයි. බ්‍රාහ්මණයෙක් නම් එක බුලත් කොළයක් විතරක් කඩලා ඒක ඇඟට කිට්ටු කර අල්ලාගෙන මුළු බුලත් වත්තෙ ම ඇවිදලා ආපහු එයි" කියලා.

ඉතින් මේ කතාවත් අර වගේ ම ගිරවා අහගෙන ඉඳලා ඇවිත් අර බ්‍රාහ්මණයාගෙ වේසෙන් ඉන්න කුමාරියට දැන්නුවා "ඔන්න තව උගුලක්" ය කියලා.

ඉතින් පසුව ද රාජ පුරුෂයා ඇවිත් බ්‍රාහ්මණයාට කතා කළා "රජ්ජුරුවන්ගෙ බුලත් වත්ත බලන්ට යමුය" කියලා.

"හා හොඳයි" කියලා බ්‍රාහ්මණයත් ගියා. එත් අර ඉස්සර දවසෙ වගේ ම එක බුලතයක් විතරක් කඩාගෙන ඒක ඇඟට ළං කරගෙන වත්තෙ ඇවිදලා ආපහු ආවා. මේ කාරණේ බලාගෙන හිටලා එදත් රජ්ජුරුවෝ කීවා "මින් මතු ආයෙත් කියන්ට එපා මේ බ්‍රාහ්මණයා ගැනියක කියලා කිව්වොත් ඉස ගහ දමනවයි" කියලා.

ඊට පස්සෙ මිනිස්සු නෑ රජ්ජුරුවන්ට කියන්ට ගියෙ. ඉතින් මේ බ්‍රාහ්මණ කුමාරි මෙහෙම ඉන්න ගමන් තමන්ගෙ කුමාරි රූපෙ වගේ ම රූපයක් ලොකුවට ඇඳලා බමුණන් හතර දෙනාකුට කතා කරලා කීවා "මෙන්න මේ රූපෙත් අරගෙන නුවරක් නුවරක් ගානෙ ගිහින් රූපෙ පෙන්න පෙන්නා සම්මාදම් ගහිල්ලා. කවුරු හරි මේ රූපෙ ඇඳින ගත්තොත් අන්න ඒ ඇත්තා මා ළඟට කැඳුව වරෙල්ලා" කියලා.



බමුණෝ හතර දෙනාත් කුමාරියගෙ රූපෙ අරගෙන තැන් තැන්වල ඇවිදින්ට උණා. ඔහොම යන අතරේ එක දවසක් වැද්දෙ හත් දෙනෙක් මේ පින්තූරෙ දකලා කියන්ට උණා "මෙන්න අර පැන ගිය කුමාරි. අපෙන් පැනලා ගිහින් දැන් හොයි කරම කාලයක් දී කොහෙ ද මේ කුමාරි දැන් ඉන්නෙ" කියලා.

"ඒ කුමාරි දැන් අපේ නුවර ඉන්නවා. යමු අපි එහෙ" කියලා මේ බමුණෝ හතර දෙනා අර වැද්දන් කැඳුව ආවා බ්‍රාහ්මණ කුමාරිය ළඟට. ඒ හත් දෙනා අර බ්‍රාහ්මණයා ළඟට ගෙන ගියාම බ්‍රාහ්මණයා අණ කළා ඒ හත් දෙනාම හිරගෙයි දමන්ට. බමුණන්ට කීවා ආයෙත් වරක් පින්තූරයත් අරගෙන යන්ට කියලා.

මේ ගමන බමුණෝ පින්තූරයත් අරගෙන යන කොට අර කරුමාන්තයා මේ පින්තූරෙ ඇඳිනාගෙන බමුණන්ගෙන් ඇහුවා කොහෙ ද මේ කුමාරි දැන් ඉන්නෙ කියලා. ඒ ගමන බමුණෝ මේ කරුමාන්තයත් කැඳුව ආවා බ්‍රාහ්මණ කුමාරි ළඟට. කින්නරයාත් හිර කරන්ට අණ ලැබුණා, බ්‍රාහ්මණ කුමාරිගෙන්.

ඊට පස්සෙ බමුණන්ට කීවා ආයෙත් මේ පින්තූරයත් ඇරගෙන යන්ට කියලා. බමුණොත් පින්තූරය අරගෙන තවත් නුවරකට ගියා. එතනදී අර රජ කුමාරයා දුටුවා මේ පින්තූරෙ. දකලා අඩන්ට උණා. ඒ ගමන බමුණෝ කිවුවා අඩන්ට එපා. කුමාරිය අපේ නුවර ඉන්නවා. අපි එහාට යමු ය කියලා.

බමුණෙකුත් කැටුව රාජ කුමාරයා පල්ලියට එන කොට ම අර බ්‍රාහ්මණ කුමාරි හනික නැගිට්ටා. බ්‍රාහ්මණ ඇඳුම් මාරු කරලා කුමාරිකාවක් වගේ සැරසුණා. ඊට පස්සෙ වතුර උණු කරලා කුමාරයන් නාවලා, රස බොජුන් හදලා කන්ට දුන්නා.

මේ අතරෙ බමුණෙකා ගිහින් මුළු සිද්දිය ම රජ්ජුරුවන්ට කීවා;

මේ කතාව අහපු රජ්ජුරුවො හනි හනික පල්ලියට ආවා. ඇවිත් මේ කුමාරයාගෙ යි කුමාරියගෙ යි වග තුග ඔක්කොම අහලා බොහොම සතුටු වෙලා මේ දෙන්නාට හොඳ උළු මාලිගාවක් හදලා දීලා රටෙන් පංගුවකුත් දුන්නා. ඊට පස්සෙ ඒ දෙන්නා බොහොම සැපෙන් රාජ්ජෙ කළා.



# සෙනසුරු දසාව

ඉසමත් එක රටක එක මිනිහෙක් හිටියා සෙනහුරාගෙ දසාව උඩලා. මේ මිනිහා මොන වැඩක් කළත් හොයි විදිහෙ ගොයිතැනක් බතක් කළත් කිසිම සපලයක් උණේ නැහැ. සෙනහුරු අපලෙ නිසා, මේ මිනිහාගෙ නම පිට්ටානායිදෙ.

ඔහොම ඉඳලා පිට්ටානායිදෙ බොහොම දුප්පත් වෙලා දවසක් හිතුවා මට මේ රටේ වසලා හරි වගතුවක් වෙන්නෙ නෑ, එක නිසා මං වෙන රටකටවත් යන්ට ඕනැ කියලා මිනිහා ගමෙන් පිටවෙලා මගට බැහැලා ගියා; ගිහින් ගිහින් එක අම්බලමක නතර වුණා. ඒ වෙලාවෙම ඒ මිනිහාගෙ යාළුවෙකුත් අම්බලමට ගොඩ-වුණා. එතකොට අර මිනිහා යාළුවා දැක ඇහුවා "ආ යාළුවා, මේ කොහේ ද යන්නෙ?" කියලා.

එතකොට පිට්ටානායිදෙ කීවා, "යාළුවා මං යනවා වෙන කොහෙ හරි රටකට, මේ රටේ ඉඳලා මට කිසි ම සපලයක් නෑ මේ සෙනහුරාගෙ අපල කාලෙ නිසා" කියලා ඔක්කොම පුළුමුල කීවුවා.

ඉතින් අනික් මිනිහා කීවා, "යාළුවා ඔය ගමන යන්ට එපා, මං කියන්නම් උපායක්; දැන් යමු ආපහු ගමට, ගිහින් වැඩ කරන්ට පටන් ගනිමු. ඉබ්බෝර කාලෙ නාම් එළිතරනවා හේනක්, වැඩි වැස්සොත් කොටනවා කුඹුරක්" කියලා.

ඒ පාර පිට්ටාපයිඬෙ ආයෙමත් ආපහු ගමට ඇවිත් හේනක් එළි කරන්ට පටන් ගත්තා. හේන එළිකරන්ට පටන් ගත්තාම මින්න වහින්ට උණා. ඒ ගමන මිනිහා හේන එළි කිරිල්ල පියෙද්දී ගිහින් කොටන්ට පටන් ගත්තා කුඹුර. ඒ ගමන මින්න ආයෙමත් පායන්ට උණා. එතකොට මිනිහා කුඹුර කෙටිල්ල නවතලා ආයෙමත් හේන එළි කරන්ට ගියා. එතකොට ආයෙත් වැස්ස වහින්ට උණා. මිනිහා ගියා කුඹුර කොටන්ට. ඔය විදියට පායන කොට හේනට යනවා, වහින කොට කුඹුරට බහිනවා; ඔහොම ගිහින් මිනිහ හේනත් වැපුරුවා. අන්තිමට හේනත් පැහුණා. කුඹුරත් පැළුණා.

මේ අතරෙදී එක දවසක් හෙනහුරා පිට්ටාපයිඬෙට පෙනී කීවා ''හොඳයි පැහුණාට කමක් නෑ, එක කොළේ-කින් එක අමුණකට වඩා අස්වැන්න ගන්ට මං ඉඩ දෙන්නෙ නෑ. එක කොළේකට එක අමුණ යි'' කියාගෙන යන්ට ගියා.

ඒ ගමන පිට්ටාපයිඬෙ කළේ මොකද අී කුඹුරට ගිහින් ගොයම් කපා ලොකුවට කොළ ගහන්නෙ නැතුව උප්පිඩි තුනෙන් හතරෙන් එක කොළේ ගාණෙ කුඹුර පුරා ම කොළ ගැහුවා. ඊට පස්සෙ මීහරක් අරගෙන කමතට ගිහින් අර උප්පිඩි තුනෙන් හතරෙන් ගහපු පුංචි පුංචි කොළ එක වරට එක ගානෙ මැඩෙව්වා. එහෙමදී වෙලා තිබුණෙ මිනිහගෙ කුඹුරෙ උප්පිඩි තුනෙන් ගහපු කොළෙනුත් අමුණයි. උප්පිඩි හතරෙන් ගහපු කොළෙනුත් අමුණ යි. හැම කොළේකින් ම වී අමුණ අමුණ පැගිලා තිබුණා. මිනිහා වී ගෙනිහින් අටු දෙකක් පුරවා ගත්තා. ඊට පස්සෙ ගිහින් අර විදිහට ම හේනත් කපලා මඩවලා තව අටු දෙකක් පුරවා ගත්තා.



ඔය කාලෙ රජෙට ගිරියා දස්ස නැකැත්රාළ කෙනෙක්. පිට්ටාපායිඬෙ මේ නැකැත් රාළ ළඟට ගිහින් ඇහුවා කමින්ට තියෙන හෙනහුරු අපලෙ ගැන කොහොමද කියලා. නැකැත් රාළ කිව්වා පිට්ටාපායිඬෙ මැරෙනකලුත් මේ හෙනහුරු අපලෙ ඉවර වෙන්නෙ නෑ කියලා. ඒ පාර මිනිහා ඇහුවා දැන් හෙනහුරා කොහෙද ඉන්නෙ කියලා. හෙනහුරා මේ කාලෙ මිනිස් ලෝකෙ ඇවිද ඇවිද ඉන්නවා කියලා නැකැත් රාළ කිව්වාම ''හොඳයි මිට ඕයා හඳි ගැනෙන්නෙ නැතැයි'' කියාගෙන පිට්ටාපායිඬෙ ගෙදර ආවා.

දැනින්, අටුව පිරිලා තියන නිසා පිට්ටාපායිඬෙට කෑම බීමවලින් හිඟ මෙහෙයක් නෑ. මිනිහා යහතින් ඔහොම ඉන්න කොට මින් ඉහත තවදවක් දකලා නැති මිනිහෙක් දවසක් ඇවිත් වැට ළඟ හිටියා. පිට්ටාපායිඬෙත් මිනිහා ගෙදරට අඬගහලා ඉන්ට කාපිය දීලා වංශ ගුණ ඇහුවා. අමුත්තා කිව්වා මං නොරටක මිනිහෙක්. මේ රටේ වංශ ගුණ බලාග යන්ට ආවා, කොහොමද මේ පයිඬෙලාගෙ සෙත සැප සනීප කියලා.

පිට්ටාපායිඬෙත් කිව්වා ''අනේ අපට මොන සැපද? මේ හෙනහුරාගෙ අපල කාලයක් ඇවිදින් මෙච්චර කාලෙකට කිසි දෙයක් සපලයක් උණේ නැ. ඒත් මේ පාර මං උන්දැව පැරැද්දුවා-ආයෙත් හෙම මිට අපල කරන්ට ආවොත් මං උන්දැට කරන දේ දනිත්'' කියලා.

ඒ පාර අර අමුත්තා කතා කර කිව්වා; ''පයිඬෙ, හෙනහුරා කියන්නෙ මිට යි. උඹෙ හපන් කම් නිසයි මං ආවෙ උඹ දකින්ට. දැන් මම නැමෙයි උඹට උදව් කරන්ට. කියාපන් උඹට මොනවා ද ඕනෑ'' කියලා.

එතකොට පිට්ටාපයිඳෙ කීවා, "මට මොනවාද ඕනෑ? ගෙනහුරු අපලෙ නිසා හොඳට ම දුප්පත් මිනිහෙක් උණා. ඒක හන්ද මට යහතින් ඉන්ට උදව් කරන්ට" කියලා.

ඊට පස්සෙ, ගෙනහුරා පිට්ටාපයිඳෙ අතට ද්‍රාවි රන් පොතක් දීලා කිවුවා "වැඩක් පළක් කරන්ට පටන් ගන්න කොට, ගමනක් බිමනක් යන කොට මේ පොත් පිංචට වැඳලා මා සිහි කරගෙන යනවා. ඒ හැම වැඩේකින්ම උඹට ජය ලැබෙයි" කියලා ගෙනහුරා ඈ පාරෙන් ම යන්ට ගියා.

හැබැට අර කිව්වා වගේ පිට්ටාපයිඳෙ අර පොත් පිංචට වැඳලා ඕනෑ ම වැඩක් පටන් ගන්න ම ඒකෙන් මිනිහාට ජය වෙන්ට උණා. ඉතින් දිගට ම එහෙම කර ගෙන ගිහින් පස්සෙ කාලෙ පිට්ටාපායිඳෙ ලොකු පොහොසතෙක් වෙලා රටේ රජ්ජුරුවන්ගෙන් හිට්ටාණ නම්බුත් ලබා ගත්තා: පිට්ටා හිට්ටාණෝ කියලා.



# කොබෙයි මස

ඒකාමත් එක නුවරක හිටියාලු කුමාරවරු දෙන්නෙක්. මේ කුමාරවරුන් දෙන්නාගෙ මව් බිසව මැරිලා ගිහින් පියරජ්ජුරුවො වෙනින් බිසොවක් පාවා ගෙනලු හිටියෙ. මේ අලුත් කුඩම්මා කුමාරවරුන් දෙන්නට පලකන්නෙ නැති නිසා කුමාරවරු දෙන්නා ගිහින් මල් අම්මාත් එක්ක ජීවත් උණාලු.

එක දවසක් මේ අයියා මලෝ දෙන්නා දුනුත් ඊත් අරගෙන දඩයමේ ගිහින් දඩයමින් නැතුව හිස් අතින් ම ගෙදර එන්ට ආවාලු. ඒ එනකොට රජමාලිගාව ළඟ පුරුංග ගහක වහලා උන්න කොබෙයි කුරුල්ලෙකු දැකලා අයියා ඊ විද එව්වාලු.

ඒ පාර මල්ලී ගිහින් කොබෙයි කුරුල්ලා ඇහිඳ-ගෙන ඇවිත් අයියාගෙන් ඇහුවාලු "අයියා අපි මේ කුරු-ල්ලා පිය රජ්ජුරුවන්ට දෙනවාද එහෙම නැත්නම් මල් අම්මාට ගිහින් දෙනවාද" කියලා. එතකොට අයියා කිවුවාලු අපි මොකට ද මේකා පියරජ්ජුරුවන්ට දෙන්නෙ අපට බත් උයා දෙන මල් අම්මාට ගිහින් දෙමු කියලා.

මේ කතාවට කන් දීගෙන හිටපු කුමාරවරුන්ගෙ කුඩම්මා ගිහින් පියරජ්ජුරුවන්ට කේලමක් හද කීවාලු අයියා මලෝ දෙන්නා පිය රජතුමාට දෙස් කතා කරලා කොබෙයි කුරුල්ලා ගෙන ගිහින් මල් අම්මා අතට

දුන්නයි කියලා. ඉතින් මේ කතාවට රජ්ජුරුවන්ට තරහ ඇවිත් රජ්ජුරුවො කිව්වාලු මම හෙට ම උන් දෙන්නාගෙ ඉස් ගහ දමන්ට නියම කරනවා කියලා.

කොහොමද හරි මේ කතාව මල් අම්මාට දැනගන්ට ලැබිලා මල් අම්මා කුමාරවරුන් දෙන්නාට කතා කරලා කිව්වාලු රජ්ජුරුවො පුතුන් දෙන්නාගෙ ඉස් ගහ දමන්ට නියම කරනවා හෙට. ඒ නිසා පණ බේරාගෙන වෙන රටකට යන්ට කියලා. ඉතින් මල් අම්මා පාන්දර ම බත් උයලා අඩියට මැණික් ගල් දමලා උඩින් බත් දමලා බත් මුලතුත් බැඳ අතට දීලා කුමාරවරු දෙන්නාට කිව්වාලු එළිවෙන්ට ඉස්සර මේ නුවරින් පිටවෙලා යන්ට කියලා.

කුමාරවරු දෙන්නා බත් මුලත් අරගෙන මිදුලට බැහැලා යන්ට ගියාලු. බොහොම ගිහින් දවල් වෙන කොට බඩ ගිනි වෙලා මහා විශාලත්ත්වයේ ගහක් මුල ඉඳ ගත්තාලු. කුමාරවරු මුලත් කාලා හිටිය නිසා බත් කන්ට ඉස්සර කට සෝද ගන්ට වතුර නැතුව ඔහොම ටිකක්වෙලා ඔහොමේ හිටියාලු.

එතකොට එක කොබෙයි කුරුල්ලෙක් ඇවිත් මේ කුමාරවරුන් ඉස්සරහ ම බිම වැටුණාලු දඃ ගාලා. ඒ දැකලු මල්ලී ඇහුවාලු අයියෙ අපි මොකද කරන්නෙ මේ කොබෙයි කුරුල්ලාට කියලා. අයියා කිව්වාලු පස්සෙ අරගන්ට කොළ අස්සෙ හංගන්ට ය කියලා. ඒ පාර මල්ලී එහෙම කළාලු.

එතකොට මහ වැද්දෙක් හී දගන දුවගෙන ඇවිත් ඇහුවාලු, අනේ, කොබෙයි කුරුල්ලෙක් මෙහෙ මෙහාට වැටුණෙ නැද්ද?'' කියලා.



කුමාරවරු කිව්වාලු ''නෑ'' කියලා.

''අනේ මං හත් අවුරුද්දක් තිස්සෙ මහන්සිවෙලා මගෙ දුන්නෙන් මේ අද ඌ විද්ද — අනේ! ඌ කොහාට වැටුණා ද දන්නෙ නෑ'' කිය කියා වැද්ද කුරුල්ලා හොයන්ට පටන් ගත්තාලු.

එතකොට කුමාරවරු ඇහුවාලු ''අනේ වැදි අයියෙ, ඔය කොබෙයි කුරුල්ලා ඒච්චර හොඳ එකෙක් ද?'' කියලා.

ඉතින් වැද්ද උත්තර දුන්නා ලු ''මොකද හොඳ නැත්තෙ, මේ කොබෙයියාගෙ දකුණු අංසෙ මස් කෑ කෙනෙක් අද ම රජ වෙනවා. වම් අංසෙ මස් කෑ කෙනෙක් හත් අවුරුද්දකින් රජකමට පත් වෙනවා'' කියලා.

වැද්ද මෙහෙම කියලා තවත් හුඟ වෙලාවක් කොබෙයියා හොය හොයා ඉඳලා දුක් වෙලා යන්ට ගියා. වැද්ද එතනින් ගියාට පස්සෙ කුමාරවරු දෙන්නා කොබෙයියා පුලුස්සාගෙන වැඩිමල් කුමාරයා කෑවාලු උගෙ දකුණු අංසෙ මස. බාල කුමාරයා කෑවාලු වම් අංසෙ මස.

ඊට පස්සෙ වැඩිමල් කුමාරයා මල් අම්මා දුන්න පුංචි සෙම්බුවත් අරගෙන ගියාලු දිය හොයන්ට; මල්ලී ඒ ගහ මුල ම ඉන්දැද්දි. අයියා කැලේ හරහා දිය හොයාගෙන යනකොට මඟ දිගට කොළ අතු කඩ කඩා ගියාලු. බොහොම ගිහිං අන්තිමට ලොකු දිය පාරක් ළඟට සේන්දු උණාලු. වැඩිමල් කුමාරයා ඒ ගඟ ළඟට යනකොට ම ඇහුණාලු පංචතූර්ය නාද අඬක් ළඟ ළඟ ම එනවා. ඒ මොකක් ද කියා බලන්ට කුමාරයාත් එතනට වෙලා හිටියාලු. එත-

කොට ම පාවිතුර්ය නාදෙ කරගෙන ආ පෙරහැරක අස්ස-රණින් ආපු දළ ඇතෙක් කුමාරයා ඉදිරියට ඇවිත් දණ ගැහුවාලු.

එතකොට කුමාරයාට තේරුණා මේ මඟුල් ඇතා ඇවිත් දණ ගහලා තමා රටේ රජකමට තෝරා ගත්ත විත්තිය. ඉතින් කුමාරයා එතනට ආ අමාත්‍යයන්ට කතා කර කිව්වාලු "මගේ මල්ලියා අර කැලේ ගහක් යට ඉන්නවා, මම ගිහින් මල්ලියා අඬ ගහගෙන එන්ට ඕනැයි" කියලා.

එතකොට අමාත්‍යවරු කීවාලු "මේ ඇතා දුන් ඔබ-වහන්සෙ අපේ රජතුමා හැටියට තෝරා ගත්තා. දුන් කොහේවත් යන්ට බැ; ඇතා පිට නැගින්න ඕනැ" ය කියලා. එහෙම කීවාම කුමාරයා ඒ ඇතා පිටට නැගලා නුවරට ගිහින් රටේ රජකමට පත් උණාලු.

ඉතින්, බාල කුමාරයා අයියා එනතෙක් එතන බලාගෙන ඉඳලා බත්මුලත් අරගෙන ගියාලු අයියා හොයන්ට; අයියා අඬ ගහ ගහා ගිහින් තුබුණ මඟ දිගේ, ගහ ළඟට යන තෙක් ම. එතකොට එතන ඇතකුගෙ අඩි සටහන් තියනවා දැකලා බාල කුමාරයා හිතුවාලු "අනේ අපෙ අයියා දිය හොයාගෙන මෙතනට ඇවිත් මේ වල් ඇතා අයියා මරන්ට ඇති" කියලා. ඉතින් ඒ කුමාරයා අඬ අඬා ඉඳලා පස්සෙ බත්මුලෙන් භාගයක් කාලා ඉතුරු ටිකත් මුල බැඳගෙන ගඟෙන් දිය බීලා යන්ට පිටත් උණාලු.

මේ කුමාරයා අර ඇතා ගිය අඩි පාර දිගේ ම ඔහොම යනකොට දුටුවාලු වැඩුම්මල් කුමාරයා ඇඳගෙන හිටිය සළුව අර දුර මඟ දිගට අඹා තියනවා. ඉතින් මේ කුමාරයා හිතුවාලු මේ ඇතා ම තමයි අපෙ අයියා මරලා තියෙ-න්නෙ කියලා. "අනේ දෙයියනේ මාත් මැරුවා නම් හොඳා" කිය කියා කුමාරයා ගිහින් ගිහින් වෙන නුවරකට සේන්දු උණාලු. එතකොට රෑ වෙලා තුබුණ නිසා කුමාරයා ගියාලු හෙට්ටිරාළ කෙනෙකුගෙ ගෙදරකට; ගිහින් කිව්වාලු "මට අද රෑට නවාතැන් දෙන්ට" කියලා. මේ වේලාවෙ හෙට්ටිරාළ ගෙදර හිටිය නැ. හෙට්ටි දුව කීවාලු "මෙහෙ අපි කාටවත් නවාතැන් දෙන්නෙ නැ. හෙට්ටිරාළ රජ්ජුරුවන්ගෙ මූණට පවන් සලන්ට රජ මාලිගාවට යනවා ඒ නිසා මෙහෙ කාටවත් ඉඳුම් හිටුම් දෙන්නෙ නැ. දුන් හෙට්ටි රාළ රජමාලිගාවේ ඉඳලා එනවා. ඒ එන්ට ඉස්සර හනික මෙතනින් යන්ට" ය කියලා.

එතකොට කුමාරයා කිවුවාලු "අනේ එහෙම කියන්ට එපා, මේ හරියෙ මට නවාතැන් ගන්ට තැනක් නැ. අනේ, කොහොම හරි අද රෑට මට ඉන්ට ඉඩ දෙන්ට" කියලා.

එහෙම කිවුවාම හෙට්ටි දුවට දුක හිතිලා පැදුරු ඉරූ-වක් අරගෙන කුමාරයා අතට දීලා කිවුවාලු "එහෙනං ගිහින් අර විහු මඩුවෙ මේ පැදුර එළාගෙන ඉන්ට, හැබැයි හෙට්ටිරාළ ආවාම කහින්ටවත් හෙම එපා" කියලා.

ඉතින් කුමාරයා විහු මඩුවට ගිහින් ඉඳගෙන බත් මුල ලිහා ගෙන කන්ට හදනකොට හෙට්ටිරාළ ගෙදර ආවාලු. කුමාරයා බත් කන කොට කැස්සක් එන්ට ආවාලු. ඒක නවතා ගන්ට මහන්සි ගත්තාට මොකද බැරි උණා නිසා කුමාරයා කැස්සාලු.

එතකොට හෙට්ටිරාළට මේ කැස්ස ඇහිලා හෙට්ටි දුවගෙන් ඇහුවාලු "කවුද බල අර කහින්නෙ" කියලා.

ඒ පාර හෙට්ටි දුව කිව්වාලු "අනේ, ඉබාගාතේ අහිංසක පාට කුමාරයෙක් වගේ පැංචෙක් පාවා රෑට නවාතැනක් ඉල්ලාගෙන. මං කීවා අර වහු මඩුවේ නිදා ඉඳලා පාන්දරින් ම නැගිටලා යන්ට කියලා– අනේ ඒ පැංචාට මොකුත් කරන්ට එපා" කියලා.

එතකොට හෙට්ටිරාළට තරහ ඇවිත් බැණ වැදුණාලු "මං කීව කියා තියනවා නේද කිසි කෙනෙකුට මෙමගෙ නවාතැන් දෙන්ට එපා කියලා; එහෙම නේද? ඇයි නී නවාතැන් දුන්නෙ" කියලා හෙට්ටි දුවට බැට දුන්නාලු. ඒ කරලා හෙට්ටිරාළ බත් කාලා එළියෙ පිළ උඩට ආවාලු.

අර කුමාරයාත් කද්වරේ ම බත් කන ගමන් හිතුවාලු "අනේ, මාත් රාජ කුමාරයෙක් නේ ද? ඇයි මා මේ වහු මඩුවේ ඉන්නෙ" කියලා. මෙහෙම හිත හිතා බත් කද්දි කුමාරයාට අඳු උණාලු. මල් අම්මා බත්මුලේ අඩියට දමලා තුබුණ මැණික් ගල්, ඊට පස්සෙ කුමාරයා එයින් එක මැණිකක් අරගෙන දණිහ උඩ තියාගෙන ඒකෙ එළියෙන් බත් කෑවාලු.

පිළේ උන්නු හෙට්ටිරාළ මේ එළිය දකලා හෙට්ටි දුව ගෙන් ඇහුවාලු "අඩියෙ නී එළියකුත් දුන්නා ද ඒකාට?" කියලා. හෙට්ටි දුව කිව්වාලු "මං දුන්නා එළියක් නැහැ" කියලා.

ඒ පාර හෙට්ටිරාළ නැගිටලා වහු මඩුවට ගිහින් බැලුවාම මැණික් ගල දකලා හෙට්ටි දුවට බණින්ට පටන් ගත්තාලු. "අඩියෙ, තොරටක ඉඳලා මගෙ යාළුවකු ආවාම නවාතැන් දෙන්නෙ මෙමගෙම දී මේ වහු මඩුවට



පැදුර දුන්නෙ මොකටාට ද? ඊට වඩා හොඳ තැනක් නැතුවාට ද?" කියලා හෙට්ටි දුවට ආයෙත් තලලා "ඉක්මනට වතුර ටිකක් උණු කරපිය" කියලා කෑ ගැහුවාලු.

ඊට පස්සෙ හෙට්ටිරාළ වතුර උණු වෙනතුරු බලා ඉඳලා වතුර උණු උණගම් වහු මඩුවට ගිහින් කුමාරයාට කතා කරලා කිව්වාලු "එන්ට මලයා උඹ ඇඟ සෝදගන්ට යන්ට, මේ වහු මඩුවේ ඉන්ට වටිනවැයි" කියලා කුමාරයා කැටුව ගිහින් උණු දියෙන් ඇඟ සෝදවලා ආයෙමත් උයලා හොඳට කැමත් කන්ට දීලා හොඳ හැටි යහනාවකුත් පනවල "ඉතින් මලේ මේකෙ නිදගන්ට" කියලා කිව්වාලු.

කුමාරයා නිදගන්ට ගියාම හෙට්ටිරාළ ඇවිත් කීවාලු "වටිනා කියන දේවල් තියනවා නම් තියාගන්ට එපා, මගෙ බොහොම් අහාර හතුරො ඉන්නවා, ඒවා නැති වෙන්ට පුළුවනි, මට දුන්නොත් මං පරෙස්සම් කරලා යනකොට දෙන්නම්" කියලා.

එතකොට කුමාරයා කීවාලු "මං ළඟ වටිනා දේවල් කොයින් ද? මම මේ අසරණ වෙලා මග යන කෙනෙක්" කියලා.

එහෙම කීවාම හෙට්ටිරාළ කීවාලු "ඇයි අර වහු මඩුවේ ඉන්න කොට එළිය තියන මැණිකක් අතේ තිබුණෙ, ඒකු තවම් උඹේ ඇති නෝ, පරෙස්සමට මට දෙන්ට" ය කියලා.

"ඒ පාර කුමාරයා කීවාලු අනේ හෙට්ටි අයියෙ මම හිමිදිරි පාන්දර ම නැගිටලා යන්ට ඕනෑ. ඒක ඔහෙ මගෙ

අතේ ම තිබුණාවෙ. ආයෙ පාන්දරට හෙට්ටි අයියා අවදි කරන්ට බෑ" කියලා.

ඉතින් හෙට්ටිරාළ ආයෙ කිව්වාලු "ඒක මා අතට දෙන්ට බය ගන්ට එපා. ඉල්ලාපු හැටියේ දෙන්නම් ඕනෑ වෙලාවක ඉල්ලන්ට. මා එහෙම ගන්නෙ නෑ" කියලා.

ඔහොම ඉතින් බේරෙන්ට ම බැරි තැන කුමාරයා තමා අතේ තිබුණ මැණික් ඔක්කොම හෙට්ටිරාළ අතට දීලා නිදා ගත්තාලු. හෙට්ටිරාළත් මේ මැණික් ගෙන ගිහින් දොරවල් හතකට ඇතුළෙ කාමරේක හංගලා තිබ්බාලු.

උදේ පාන්දර කුමාරයා ගමනට යන්ට සූදානම් වෙලා හෙට්ටිරාළ පුබුද්දලා කිව්වාලු "අනේ හෙට්ටි අයියෙ මම දැන් යන්ට ඕනෑ. ඉක්මනට මගෙ මැණික් ටික ආපහු දෙන්ටයි" කියලා. එත් හෙට්ටිරාළ කතාවක් බහක් නැතුව ගොට වෙලා හිටියාලු.

ඉතින් කුමාරයා මෙහෙම ඉල්ලනකොට ඉල්ලන-කොට හෙට්ටි දූව කිව්වලු "මොකක්ද මේ කරදරේ, තාගෙ හරි දෙයක් ගත්තා නං ඒක දෙන්ට ඕනෑ නේද? මේ අහිංසක පැංචාගෙ අත මිට තිබුණ ඒවා ගත්තා නේද? ඇයි ඉතින් ඒවා නොදෙන්නෙ ඒ ඇත්තාට යන්ට" කියලා.

ඒ ගමන හෙට්ටිරාළ දොරවල් හත ඇරගෙන එළියට ඇවිත් "කවුද බොල තොගෙ මැණික් ගල් ගත්තෙ" කියලා කුමාරයාගෙ කෙස්ස කපලා වාල් කමට ගත්තාලු. ඉතින් කුමාරයාත් හෙට්ටිරාළට වාල් කම් කර කර එහෙ ම හිටියාලු.



ඔහොම ඉන්න කාලෙ එක දවසක් හෙට්ටිරාළ මේ කුමාරයාත් එක්ක කොහෙදෝ ගමනක් ගිහින් එන මග ගහක් ළඟට පැමිණුණාලු. මේ වෙලාවට මේ ගහේ හතා හිටියාලු ඒ රටේ රජ්ජුරුවන්ගෙ දූ කුමාරිකාවෝ හත් දෙනෙක්.

ඉතින් හෙට්ටියාගෙ වාලා වගේ යන මේ කුමාරයාත් දුටුව බාල ම කුමාරි කිව්වාලු අක්කලාට "අක්කලා දන්නවා ද අර හෙට්ටි රාළ පස්සෙන් යන්නෙ රාජ කුමාරයෙක් නේ" කියලා.

එතකොට අනික් කුමාරිකාවරු හයදෙනා බාල ම කුමාරිට හිනා උණාලු "ඔව්, ඔව්, හෙට්ටියාගෙ වාලා උඹට රාජ කුමාරයෙක් උණා" කියලා.

එත් බාල කුමාරි කිව්වාලු "අක්කලා කොහොම කිව්වත් ඒ නම් රාජ කුමාරයෙක් ම තමා" කියලා.

"ඔව්, ඔව්, ඒ වාලා රාජ කුමාරයෙක් ම තමා, උඹ එක්ක යන්ට එව්" කියලා අක්කලා ආයෙත් විහිළු කළාලු.

එතකොට බාල කුමාරි ආයෙ කිව්වාලු "ඔව් ඇත්ත ම තමා, ඒ රාජ කුමාරයා මා ගෙනයන්ට දවසක එනවා තමා" කියලා.

"හා, හා, උඹ ගෙනයන්ට ඒ ඇත්තා එනවියා. උඹ බලයන්, අන්න හෙට්ටියගෙ වාලා අරගෙ යනවා." කියලා එතකොට වැඩිමල් කුමාරිකාවෝ තවත් කවටකම් කළාලු.

ඒ පාර බාල කුමාරි ආයෙත් කිව්වාලු, ඔව් මං යනවා තමයි. අක්කලාට බලන්ට පුළුවනි, දැන් තොගියාට මං පස්සෙ යනවා" කියලා.

ඉතින් මේ කුමාරිකාවරු තුන් දෙනා මාලිගාවට ආවාට පස්සෙ බාල ම කුමාරි රජ්ජුරුවන් ළඟට ගිහින් කිව්වාලු, "පිය රජ්ජුරුවන් වහන්ස, අපි දූන් ගඟේ නාන-තොට එසනින් යන්ට ගියා හෙට්ටිරාළ කෙනෙකු යි වාලෙකු යි. ඒ වාලා නියම වාලෙක් නොමෙයි, රාජ කුමාරයෙක්. මට ඒ රාජ කුමාරයා ගෙන්නලා දෙන්ට" කියලා.

එහෙම කිව්වාම රජ්ජුරුවෝ අණ පණිවිඩයක් ඇරලා මේ හෙට්ටිරාළ යි වාල් කොල්ලා යි මාලිගාවට ගෙන්නුවා. ගෙන්නලා රජ්ජුරුවෝ හෙට්ටිරාළගෙන් ඇහුවාලු "කොහෙන් ද මේ කරුණයා" කියලා.

එතකොට හෙට්ටිරාළට ඉස්සරවෙලා කුමාරයා කතා කර කීවාලු "මම රාජ කුමාරයෙක්, ඒත් දැන් මේ හෙට්ටි අයියාට වාල්කම් කරනවා" කියලා.

රජ්ජුරුවෝ හෙට්ටිරාළගෙන් ඇහුවාම ඒ කතාව ඇත්ත ද කියලා හෙට්ටිරාළත් කීවා "ඇත්ත තමා" කියලා.

ඊට පස්සෙ රජ්ජුරුවෝ තමුන්ගෙ බාල කුමාරි මේ කුමාරයාට පාවා දීලා හෙට්ටිරාළත් එක්ක යන්ට ඇරියා.

ඉතින් මේ තුන් දෙනා ම හෙට්ටිරාළගෙ ගෙදරට යන්ට. එහෙම යනකොට හෙට්ටිරාළට මගදී බඩගිනි වෙලා කුමාරයා අතට සල්ලි දීලා කිව්වාලු මේ තුට්ටු



හයට හාල් පත තුනක් ගෙනත් ලිපේ තියලා, මේ තුට්ටු හයට කරවල ගෙනත් හොද්දක් හදන්ට" ය කියලා.

කුමාරයොත් හා හොඳයි කියලා හාල් පත තුනක් ගෙනත් ලිපේ තියලා තුට්ටු හය අරගෙන ගියාලු කරවල ගේනන්ට. ගිහින් ඇවිද්දලු ඇවිද්දලු තුට්ටු හයට ගන්ට කරවලයක් නැ. ඒ පාර කුමාරයා හිස් අතින් ම එනකොට මග එක තැනක මිනිහෙක් හිටියාලු ලොකු කරවල ගොඩක් තියාගෙන. ඒ මිනිහා මේ කුමාරයා දැකලා ඇහුවාලු "කොහෙද මලේ උඹ යන්නෙ" කියලා.

"මම ගියා තුට්ටු හයක් අරගෙන කරවල ගේනන්ට, තුට්ටු හයට ගන්ට කරවලයක් නැති නිසා ආපසු යනවා" කියලා මේ කුමාරයා කිව්වාලු.

එතකොට අර මිනිහා කතා කරලා කිව්වලු, "ඔය තුට්ටු හය මට දීලා මෙයින් කරවල කුරියෙක් තෝරාගෙන යන්ට" කියලා.

ඒ ගමන කුමාරයොත් ලොකු ම කරවල කුරියකු තෝරාගෙන තුට්ටු හය දීලා කරවල කුරියත් කරේ තියා-ගෙන එන්ට ආවාලු. ගඟ අයින දිගේ කුමාරයා මෙහෙම එනකොට කරේ හිටපු කරවල කුරියා හිනාවෙන්ට පටන් ගත්තාලු. හිනාවෙලා කරවල කුරියා ඇහුවාලු කුමාරයා අතින් කොහෙ ද මං ව අරගෙන යන්නෙ කියලා.

කුමාරයා කීවාලු "උයන්ට ගෙන යනවා" කියලා.

එතකොට කරවල කුරියා කීවාලු "මා ගෙනයන්ට එපා. මේ ගඟට දමන්ට. උඹ අද මැරෙන්ට යනවා මේ ගෙයේ; එතකොට මං ගොඩ දාන්නම්" කියලා.

ඒ පාර කුමාරයා කරවල කුරියා දමලා නිකම් ම ගියාලු. ගිහින් බත් කන්ට කහපිරිස් හොද්දක් හැදුවාලු.

උයලා ඉවර උණාම හෙට්ටිරාළ කිවුවාලු, හාල් පත දෙකක බත් වේදලා හොඳින් එක්ක තමුන්ට දෙන්ට කියලා. කුමාරයෝ එහෙම බත් බෙදලා හොඳින් එක්ක දුන්නාම හෙට්ටිරාළ ඇහුවාලු "මොකද කෝ මිරිස් හොදි හෝ කරවල" කියලා.

ඒ පාර කුමාරයා කීවාලු, "තුට්ට හයට කරවල ගන්ට බෑ කොහොමකින්වත්. ඒ නිසා නිකං මිරිස් හොද්ද හැදුවා" කියලා.

"හොඳයි එහෙනං" කියලා හෙට්ටිරාළ බත් පතෙන් බාගයක් කාලා ඉතිරි හරිය අර රාජ කුමාරිට දුන්නලු කන්ට කියලා.

"ඒ පාර කුමාරී, උඹ පලයන් යන්ට, මං ආවේ හෙට්ටියකුගේ පතෙන් කන්ට නෙමෙයි" කියලා. ගිහින් කුමාරයාගෙ පතේ බත් කෑවාලු.

එතකොට හෙට්ටිරාළ ඇහුවාලු "මගෙ පතේ කන්ට නරක නම් මගෙ වාලාගෙ පතේ කන්ට හොඳ උනේ කොහොමද ඈ?" කියලා.

එහෙනම් කුමාරී කිව්වාලු "තවත් කිසි දවසක ඔය වාලා කියන කතාව කිවුවොත් පියරජ්ජුරුවන්ට කියලා හෙට්ටිරාළ හතරට ඉරලා හතර වාහල්කඩ එල්ලනවා" කියලා. ඊට පස්සෙ හෙට්ටිරාළ කට පියාගෙන හිටියාලු.

ඉතින් තුන් දෙනාම කෑම කාලා ඉවර වෙලා ගිහින් අහුලට නැංගාලු ගඟෙන් එගොඩ වෙන්ට. අහුලෙදී හෙට්ටිරාළ කුමාරයාට කතා කරලා කිවුවාලු "පුවක් ගෙඩියක් කපලා බුලත් විටක් හද ගෙනත් දෙන්ට" කියලා.



එතකොට කුමාරි කිවුවාලු "පුවක් කපලා බුලත් හදලා බත් උයලා ඉවර යි. ආයෙ මොකුත් කර දෙන්ට එපා" කියලා.

ඒත් කුමාරයා, "අපේ ඉතින් බුලත් විටක් හදලා දුන්නාට මොකද" කියලා බුලත් හද දුන්නාලු.

ආයෙත් පාරක් හෙට්ටිරාළ කිව්වාලු "මට දිය ටිකක් ගෙනත් දෙන්ට" කියලා.

එතකොටත් කුමාරි කිවුවාලු, ඕන්න ඉතින් වැල් වැඩ කරලා දුන් ඉතින් ඉවර යි. වතුර ගෙනත් දෙන්ට එපා" කියලා.

"දිය තිබහට දිය ටිකක් දුන්නාට පවක් යැ, මං දිය ටිකක් ගෙනත් දෙන්නම්" කියලා සෙම්බුවක් අරගෙන ගිහින් දිය ගන්ට ගඟට පාත් වෙන කොට ම හෙට්ටිරාළ පිටිපස්සෙන් හිටලා කුමාරයා ගඟට පෙරළුවාලු. එතකොට කුමාරිත් දියේ පනින්ට හදන කොට හෙට්ටිරාළ අල්ලා-ගෙන ගෙදරට යන කල්ම අතින් අත නැර අල්ලා ගෙන ගියාලු. ගඟට වැටුණු කුමාරයා අර දියට දමාපු කරවල කුරියගෙ උදව්වෙන් ගොඩට ආවාලු.

කුමාරයා ගොඩට ඇවිත් වැල්ලෙ ඉන්නකොට එක මල් අම්මා කෙනෙක් දියට ඇවිත් කුමාරයා දැක්කාලු. දැකලා, "අනේ පුතේ ඇයි මේ තෙමීගෙන මෙතෙන්ට වෙලා ඉන්නෙ යමු අපේ ගෙදර යන්ට" කියලා ඇගෙ ගෙදරට කැටුව ගියාලු. ගිහින් වතුර උණු කරලා නාවලා හොඳ සළුවක් අන්දවලා බතුත් උයා කන්ට දුන්නාලු.

ඊට පස්සෙ කුමාරයා මල් අම්මාට වෙච්ච සිද්දි ඔක්කොම කියලා ආයෙත් ගියාලු හෙට්ටිරාළගෙ ගෙදරට යන්ට. කුමාරයා යන කොට හෙට්ටිරාළගෙ ගෙදර සෙනඟ පිරිලා වැඩ කරනවාලු. මොකද කියා හොයලා

බැලුවාම කුමාරයාට දැනගන්ට ලැබුණාලු හෙට්ටිරාළ තව දවස් තුනකින් රාජ කුමාරි කාර බඳිනවා කියලා.

හොඳයි කියලා කුමාරයා, ආයෙත් මල් අම්මාගෙ ගෙදරට ගිහින් මල් අම්මාගෙන් සල්ලි හතරක් ඉල්ලා-ගෙන ගියාලු බඩහැල ගමට. ගිහිං වළං හදන තැනකට සල්ලි හතර දීලා කිවුවාලු මම හෙට එනකොට වංගි තුනක් තියෙන්ට කෙමි දෙළහක් තියෙන්ට කොතලයක් හදා තියන්ට කියලා.

පස්සෙ දවසෙ කුමාරයා මේ කොතලෙත් අරගෙන හෙට්ටිරාළගෙ ගෙදරට යන කොට මංගල්ලෙ පටන්-ගන්ට ලෑස්ති යි. රජ්ජුරුවොත් ඇවිත් ඉන්නවා. නැට්ටු-වො නටනවා. කුමාරයා ටිකක් වෙලා බලා ඉඳලා ඒ නැටුම් ඉවර වුණාම සබාවට ගිහින් "මාත් ටිකක් නටන්ට ඕනැ" කියලා නටන්ට පටන් ගත්තාලු. ටිකක් වෙලා නටලා කතාවක් කියන්ට පටන් ගත්තාලු.

"අපි නම් අයියා මලෝ දෙන්නායි, කාසි රටේ කෝසී රජ්ජුරුවන්ගෙ පුත්තුයි, කුඩම්මා අපට කළ වරදට රටින් පිට වී ආවයි, මල් අම්මා අපි දෙන්නම බතුත් බැඳලා දුන්නායි." කිය කියා කතාව ටිකක් කියලා ආයෙ ටිකක් නටනවාලු. ආයෙ කොතලෙ දැකින් අර ගෙන කොතලෙට කියනවාලු.

වංගි තුනක් ඇති, කෙමි දෙළසක් ඇති
කොට් කොතලේ
අපට වැදුණු දුක, මේ අහපන් සකි
කොට් කොතලේ

ඉතින් මේ කුමාරයා ආයෙ ටිකක් නටලා කොත-ලෙට කියනවාලු "අපෙ අම්මා මළාට පස්සෙ අපි වින්දේ



දුක ම යි, ඊට පස්සෙ අයියායි මායි රටින් පැනලා ආවයි," කිය කියා මේ කුමාරයා තමන්ට වෙච්ච සිද්දිය ටිකක් කතාවෙන් කියනවා, ආයෙ ටිකක් නටලා වංගි තුනක් ඇති කියලා කොතලෙට කියනවා මිය විදියට මුළු කතාව ම කුමාරයා කිවුවාලු. මේ කතාව බොහොම දුකෙන් අහගෙන ඉඳලා මංගල්ලෙට ඇවිදින් හිටිය රජ්ජුරුවො හෙට්ටි-රාළගෙන් ඇහුවාලු මේ මැණික් ගල් කතාව ඇත්තද කියලා. හෙට්ටිරාළ කිවුවාලු "ඒක ඇත්ත" කියලා. අනික් සිද්දීන් ඔක්කොම ඇත්තද කියලා ඇහුවාම හෙට්ටි-රාළ කිවුවාලු ඒවත් ඇත්ත කියලා.

එතනදී රජ්ජුරුවො අණ කළාලු හෙට්ටිරාළ හතරට ඉරලා හතර වාහල්කඩ එල්ලා දමන්ට. ඊට පස්සෙ මේ කුමාරය යි කුමාරිකාවයි දෙන්නා කාර බන්දවලා කිවාලු, මා තමයි ඒ නැතිවුණ අයියා— කියලා එද වෙච්ච සිද්දිය මලයාට කිවාලු. ඉන් පස්සෙ රටෙත් බාගෙක රජකම බාල කුමාරයට බාර දීලා වැඩිමල් කුමාරයා ගියාලු උන්නු නුවරට ම. ඊට පස්සෙ ඒ රජවරු දෙන්නාම යහතින් රජකම් කරගෙන හිටියාලු.

# කුමාරියෝ හත් දෙනා

ප්‍රාසමින් එක රටක රජ්ජුරු කෙනෙකු යි දේවියකු යි හිටියා. මේ දෙන්නාට ද කුමාරියෝ හත් දෙනෙකු යි පිස්සෙකුට ම බාල එක පුත් කුමාරයකු යි හිටියා.

ඔහොම ඉන්න අතරෙදි මේ රජ්ජුරුවන්ට යුද්දෙකට යන්ට සිද්ද උණා. ඉතින් රජ්ජුරුවෝ යුද්දෙට ගිහින් යුද්දෙත් පරාජය වෙලා ආපහු මාලිගාවට ආවා. එද රජ්ජුරුවන්ට මාලිගාවේ රාජ භෝජන හදලා තිබුණෙ නෑ. ඉතින් රජ්ජුරුවෝ දේවින්නාන්සෙගෙන් ඇහුවා රාජ භෝජන හදලා නොතිබ්බෙ ඇයි ද කියලා.

දේවින්නාන්සෙ ඇලිමැලි කරලා කිව්වා "මට මේ දරුවන් හදන්ට යි රාජ භෝජන හදන්ට යි ඔක්කොම කරන්ට බෑ" කියලා.

"ඉතින් රජ්ජුරුවෝ ඇහුවා මොකද දරුවන්ගෙන් තියන කරදරේ" කියලා.

දේවින්නාන්සෙ කීවා "මොකුත් නෑ, අපේ නංගො හත් දෙනා එකතු වෙලා ගෙට ගිහින් හාගෙන ඇවිත් බත් පිර පීරා ඉන්නවා. ඔයක මේ මාලිගාව හරියෙ වැඩක් කරන්ට තියෙ උදව්වක් වෙන්නෙ නැහැ කියලා.

ඒ ගමන රජ්ජුරුවන්ට තරහ ගිහින් රජ්ජුරුවෝ කීවා "හොඳයි. මං හෙට උන් හත් දෙනාගෙම ඉස් ගහ දම්මනවා" කියලා.

ඒ ගමන දේවින්නාන්සෙ බත් මුලක් හදලා ද කුමාරිකාවන් හත් දෙනාට දීලා කිව්වා "මාලිගාවෙ නොහිට



කැමති තැනකට ගිහින් ජීවත් වෙයල්ලා; මාලිගාවෙ හිටියොත් හෙට රජ්ජුරුවෝ ඉස් ගහ දම්මවයි" කියලා.

ඉතින් මේ කුමාරිකාවරු හත් දෙනා බත් මුලත් අර ගෙන මාලිගාවෙන් පිටවෙලා ගියා ගඟ ළඟට. ගිහින් ගඟ ළඟ ඉඳගෙන බත්මුල ලිහාගෙන බෙදාගෙන කාලා ආයෙ පිටත් වෙලා ගියා.

ඔහොම ගිහින් ගිහින් හැන්දෑ වෙනකොට ගියා එක රාක්සයාගෙ ගෙදරකට. කුමාරිකාවරු යන වෙලාවෙ රාක්සයා හිටියෙ නෑ ගෙදර, රාක්සි විතර යි හිටියෙ. ඉතින් මේ කුමාරිකාවරු ගිහින් රාක්සිට කිව්වා "අනේ කරුණා-කරලා අපට අද රෑට මෙහෙ නවාතැනක් දෙන්ට" කියලා.

ඉතින් රාක්සිත් හොඳයි කීවා. ඒ ගමන බාලකුමාරි කතා කරලා කීවා "අපට කන්ට දෙයක් නෑ. ඒ නිසා උයාගන්ට දේකුත් දෙන්ට" කියලා. ඉතින් රාක්සි දුන්නා වී ඩිංගක්.

බාල කුමාරි වී ඩිංග අරගෙන අක්කලාට කතා කළා ඒක කොටන්ට. අක්කලා හය දෙනා ම අපට බැරිය කියලා කිව්වා. ඉතින් බාල කුමාරි වී ටික කොටලා අක්කලාට කතා කළා බත් උයන්ට. ඒත් ඒ හයදෙනා ම කීවා අපට බැරිය කියලා. ඉතින් බාල කුමාරි තනියම ඉව්වා. උයලා ඉවරවෙලා අක්කලාට කතා කළා බත් කන්ට. ඒත් ඒ හය දෙනාම අපට බැරිය කියලා කිව්වා. ඉතින් බාල කුමාරි බත් බෙදලා අක්කලා හය දෙනාට ම කැව්වා.

ඔන්න ඉතින් රෑ උණාම මේ කුමාරිකාවෝ හත් දෙනා නිදා ගන්ට ගියා. මේ ගෙදර හිටියා රාක්ෂ දූලා හත්

දෙනෙක්. ඒ හත් දෙනාත් නිදි ගත්තා ඒ ගෙයි ම. ඔක්කොටෝ ම නින්ද ගියා. ඒත් බාල කුමාරි විතරක් ඇහැ ඇරගෙන හිටියා. මොකද, බාල කුමාරිට සැක හිතුණා මේ රාක්ෂ ගෙදරක් වෙන්ට ඇති කියා. ඒ ගමන රාක්ෂී ගෙට ඇවිත් රාක්ෂ දූවරු හත්දෙනාට සුදු රෙදි හතක් පොරවලා යන්ට ගියා; ඊට අඳුනාගන්ට. මේක බලා-හිටිය බාල කුමාරි අර සුදු රෙදි හත ඇරගෙන අක්කලා හය දෙනාට පොරවලා තමනුත් එකක් පොරවාගෙන නිදි ගත්තා.

ඊන්න ඉතින් රාක්ෂයා රෑ වෙලා ගෙදර ආවාම රාක්ෂී කිව්වා "කුමාරිකාවන් හත් දෙනෙක් ඇවිදින් නිදි ඉන්නවා. අන්න දනාගන්ට මං අපේ ළමයි හත් දෙනාට සුදු රෙදි පොරවලා ඇති" කියලා.

ඉතින් රාක්ෂයත් කළුවරේ ම ඇවිදින් අර සුදු රෙදි නැති ව හිටිය රාක්ෂ දූවරුන්ගෙන් එකකු මරාගෙන ඇර ගෙන ගියා කෑමට.

මේ ඔක්කොම බලාගෙන හිටිය බාල කුමාරි, රාක්ෂයා නිදි ගන්ට ගියාට පස්සෙ හීන්සැරේ අක්කලාවත් පුබුද්දගෙන රාක්ෂ ගෙදරින් පිටවෙලා ගිහින් ගඟක් අයිනට සේන්දු වෙලා ගං වැල්ලෙ හාන්සිවෙලා හිටියා.

මේ වෙලාවේ එතැනින් යන්ට ආපු සඳපාගෙන් මුව දඩයමේ ගිය රජකෙනෙක් කුමාරිකාවරුන් දකලා ඇහුවා "රාක්ෂ දූලා ද මනුෂ්‍ය දූලා ද" කියලා.

ඉතින් බාල කුමාරි ඇහුවා "මේ අපට කතාකරන්නෙ රාක්ෂයෙක් ද මනුෂ්‍යයෙක් ද" කියලා.

රජ්ජුරුවො කිව්වා "මං මනුෂ්‍යයෙක්— රජ කෙනෙක්" කියලා.



ඒ පාර බාල කුමාරි කිව්වා "අපිත් මනුෂ්‍ය දූවරු— රාජ කුමාරිකාවෝය" කියලා.

රජ්ජුරුවො කීවා "රාජ කුමාරිකාවුන් නම් මාත් එක්ක මගෙ මාලිගාවට යන්ට කැමති ද" කියලා.

ඒ ගමන මේ හත්දෙනා ම හා හොඳයි කියලා රජ්ජුරුවොත් එක්ක ගිහින් රජ්ජුරුවන්ට කසාද වෙලා මාලිගාවෙ හිටියා.

මේ අතර අතර රාක්ෂී හොයන්ට පටන් ගත්තා කුමාරිකාවුන් තමා රවටලා කොහෙද ගියෙ කියලා. හොයන-කොට දැනගත්තා ගං වැල්ලෙ ඉඳලා රජ්ජුරුවන් එක්ක ගිය විත්තිය. ඒ ගමන රාක්ෂී ගෙදර ගිහිං එක දුවක් එව්වා අර රජ්ජුරුවො එන වෙලාවට අර කුමාරියන් වගේ ගං වැල්ලෙ ඉන්ට කියලා.

එද රාක්ෂ දුව ගං වැල්ලෙ හාන්සිවෙලා ඉන්නකොට ඊන්න එදත් අර රජ්ජුරුවෝ මුව දඩයමේ ගිහින් එතැනින් යන්ට ආවා. එතකොට මේ රාක්ෂ දුව දකලා ඇහුවා "රාක්ෂ දුවක් ද මනුෂ්‍ය දුවක් ද" කියලා.

රාක්ෂී කිව්වා "මං මනුෂ්‍ය දුවක්— රාජකුමාරිකාවක්" කියලා.

ඒ ගමන රජ්ජුරුවො රාජකුමාරිකාවක් නම් මගේ රජමාලිගාවට යමු කියලා මේ රාක්ෂීවත් එක්ක ගියා මාලිගාවට. ගිහින් කසාද කර ගත්තා.

මෙහෙම ඉන්න කොට සහෝදරියන් හත්දෙනා ගැබි-බර උණා.

එක දවසක් රාත්තිරියෙ කුමාරිකාවන් හත්දෙනා නිදාගෙන ඉන්න අතරෙ අර රාක්ෂි හොරෙන් ම ඇවිත් මේ කුමාරිකාවුන් හත් දෙනාගෙ ම ඇස් උගුලා ගත්තා නොදැනෙන්නට.

ඉතින් කුමාරිකාවරු උදේ නැගිටලා යන්ට හැදුවා-- යන්ට බෑ. ඇස් නැතුව පේන්නෙ නෑ. ඒ ගමන එහෙම ම නිදි ඉන්නකොට රජ්ජුරුවො ඇවිත් ඇහුවා නැගිට්ටින්නෙ නැතුව ඉන්නෙ ඇයි ද කියලා.

කුමාරිකාවරු කිව්වා අපි නින්දෙ ඉන්නකොට ම අපේ ඇස් නැතිවෙලා; ඒ නිසා නැගිටලා යන්ට බැරිය කියලා.

රජ්ජුරුවො ඇහුවා ''ඇයි ඇස්වලට මොකද උණේ'' කියලා.

''අනේ අපි දන්නෙ නෑ, අපි නිදාගෙන ඉන්නකොට කවුදෝ ඇස් ගලවාගෙන තියනවා'' කියලා.

ඉතින් ඒ ගමන රජ්ජුරුවො කීවා ''එහෙනං මේක මායාවක් වෙන්ට පුළුවනි. කැමති තැනකට ගිහින් ජීවත් වෙන්ට, මාලිගාවෙ ඉන්ට එපා'' කියලා.

ඒ පාර කුමාරිකාවො මාලිගාවෙන් බැහැලා ගිහින් වනාන්තරේකට ගියා. ඒ වනාන්තරේ කොළ ජාතියි ගෙඩි ජාතියි අතගගා කඩාගෙන කකා ජීවත්වුණා. මේ අතරෙ හත් දෙනාට ම පුත්තු හත්දෙනෙක් උපන්නා.

ඒත් හදාගන්ට පුළුවන් උණේ බාල ම කුමාරිගෙ පුතා විතර යි. අනිත් හය දෙනාගෙ ම පුත්තු මළා. ඒත් බාල ම කුමාරි බොහොම අමාරුවෙන් තමන්ගෙ පුතා හදා ගත්තා.



මේ කුමාරයා ටිකක් ලොකු උණා හැටියෙ ම ආචාරියකු ළඟට ගිහින් දුන්නකුයි ඊතලයි හදවා ගත්තා. ඊට පස්සෙ හැම දම සතුන් විදලා මරාගෙන ඇවිත් අම්මලාට කෑම හදලා දෙන්ට උණා.

ඔහොම කලක් ගියායින් පස්සෙ මේ කුමාරයා වැද්දෙකුත් යාළු කරගෙන පෝනුන් මුවන් වගේ ලොකු සතුන් විදගෙන නුවරට ගෙනයන්ට පටන් ගත්තා. ඉතින් එහෙම සතකු මරාගෙන නුවරට ගෙන ගිහින් විකුණලා අම්මලාට ඕනෑ කරන කෑයි දේත් අරගෙන එන්ට මේ කුමාරයා පුරුදු උණා.

ඔන්න එක දවසක් කුමාරයා මුව නාම්බෙකු මරා ගෙන නුවරට යන්ට හදනකොට කුමාරයාගෙ අම්මා කතා කර කීවා ''පුතා ඔය මුවා රජ්ජුරුවන්ට ගිහිං දීලා වරෙන්'' කියලා.

කුමාරයාත් හා හොඳයි කියලා මුවාත් අරගෙන රජ්ජුරුවන්ගෙ මාලිගාවට ගියා. ඉතින් රජ්ජුරුවො.ත් මේ කුමාරයා දැකලා බොහොම සතුටු වුණා. තමන්ගෙ ම පුතා වගෙ දන්නෙ නැතිවාට මොකද රජ්ජුරුවන්ට කුමාරයා ගැන ආදරේ හිතුණා. ඉතින් රජ්ජුරුවො කුමාරයාට හොඳට කෑම බීම හෙම දීලා සංග්‍රහ කරලා ආයෙ එන්ට කියලා පිටත් කළා.

ඉතින් මේ කුමාරයා මෙහෙම මාලිගාවට යන එන කොට අර රාක්ෂි අඳුනා ගත්තා මේ කුමාරයා අර ඇස් උගුලාගෙන යන්ට ඇවිය කුමාරිකාවන්ගෙන් බාල ම කුමාරිගෙ පුතා වග. එහෙම අඳුනාගෙන මේ කුමාරයා මරන්ට අදහස් කරගත්තා.

එක දවසක් මේ රාක්ෂි කුමාරයාට කතා කරලා එයාගෙ පණිවිඩයකට යන්ට පුළුවන් ද කියලා කුමාරයාගෙන් ඇහුවා.

ඉතින් කුමාරයාත් "හා හොඳයි" කීවා.

ඒ ගමන මේ රාක්ෂි ලියුමක් දීලා, පුංචි පොදියකුත් දීලා කීවා "අන්න අහවල් රටේ අහවල් තැන අපේ අම්මා ඉන්නවා ගිහින් මේ ලියුම දීලා එන්ට" කියලා.

මේ කුමාරයා ඔය ලියුමත් අරගෙන ඒ කියාපු රටට යන්ට පිටත් වෙලා ගිහින් අතරමග වෙනින් රටකට ගියා. ගිහින් එක මැලි අම්මා කෙනෙකුගෙ ගෙදරින් නවාතැනක් ඉල්ලුවා.

එතකොට ඒ මැලි අම්මා කීවා "අනේ පුතේ මොන එහෙකට මේ රටට ආවා ද, මේකට මේ යකෙක් ඇබ්බැහි වෙලා මෙහෙ ඉන්න මිනිසුන්ගෙන් වැඩි හරියක් මරා ගෙන කෑවා. අද ඔන්න අපේ රජ්ජුරුවන්ගෙ දූ කුමාරිය කනි-යන්ඩ එනවා" කියලා.

ඉතින් කුමාරයා ඇහුවා "කොහොම ද ඒ යකා එන්නෙ" කියලා.

මැලි අම්මා කීවා "ඒ යකා ඉස්සෙල්ලා ම තුන් ගව්ව-කට එහායින් ඉඳලා හූවක් කියනවා, අනික් යැරේ ගව්වකට එහායින් ඉඳලා හූවක් කියනවා, තුන්වෙනි හූව දොර ළඟට ඇවිදින් කියනවා" කියලා.

එතකොට කුමාරයා කීවා "එහෙනං හොඳයි, මට පුළුවනි ඔය යකා මරන්ට. මට කැඩුණු ඇට ගෝනියකුයි



හොඳ කඩුවකුයි ලෑස්තිකර දෙන්ට රජ්ජුරුවන්ට කියන්ට" කියලා.

හොඳයි කියලා මැලි අම්මාත් රජ්ජුරුවන්ට ගිහින් කීවා. රජ්ජුරුවොත් කුමාරයා මාලිගාවට ගෙන්නලා මේ ඔක්කොම ලෑස්ති කරලා දුන්නා.

ඊට පස්සෙ කුමාරයා කුමාරිගෙ ගෙට ගිහින් කුමාරිගෙ උකුලෙ ඉස තියාගෙන නිදාගෙන හිටියා.

ඔන්න රෑ දොළහාමාරි ජාමෙ එනකොට තුන් ගව්වකට එහායින් යකා හූවක් කිව්වා කුමාරිට ඇහුණා. ඒත් කුමාරයාට නින්ද ගිහින්. ඊළඟට ගව්වකට එහායින් දෙවෙනි හූවත් කියනවා කුමාරිට ඇහුණා. එතකොට කුමාරිගෙ ඇහෙන් කඳුළු බින්දු කඩා වැටුණා.

මේ කඳුළු බින්දු කුමාරයාගෙ මූණට වැටිලා කුමාරයා අවදි වෙලා කුමාරිගෙන් ඇහුවා මොකද කියලා.

එතකොට කුමාරි කීවා "දැන් හූ දෙකක් කිව්වා දැන් ආයින් හූව කියන්නෙ මේ දොරකඩ"ය කියලා.

ඒ ගමන කුමාරයා නැගිටලා කැඩුණු ඇට ගෝනිය අරගෙන හැළුවා දොරකඩ. ගිහිලා ඇන්දකට වෙලා හිටියා කඩුවත් අතට අරගෙන.

එතකොට ම යකාත් තුන්වෙනි හූව කියාගෙන එක පාරට ම දොරකඩට පැන්නා. පැන්නාට ඉතිං අර කැඩුණු ඇට ගොඩට පය තිබ්බ හැටියෙ යකා ලිස්සලා ගිහින් බිම ඇද වැටුණා. ඒ එක්කම කුමාරයා කඩුව උස්සලා යකා දෙකට පොළු ගහලා දැමුවා.

ඒ පාර කුමාරි බොහොම සන්තෝස වෙලා කුමාරයා හිපාගෙන ඇඬුවා. අඬලා ඉවරවෙලා කුමාරයා ගැන තොරතුරු ඇහුවා.

ඉතින් කුමාරයාත් ඔක්කොම වං හුං කුමාරිට කීවා. ලියුම ගැනත් කීවා.

එතකොට මේ කුමාරිට සැකයක් හිතිලා අර ලියුම බලන්ට දෙන්ටය කියා ඉල්ලාගෙන ලියුම බැලුවා. ඒ ලියුමෙ තිබුණා:

"අම්මේ මේ ලියුම අරගෙන එන කුමාරයා මරාගෙන කාපන්. මේ කියන අර කුමාරිකාවන් හත් දෙනාගෙ ඇස් ගුලිත් කාපන්" කියලා.

ඉතින් මේ කුමාරි ඒ ලියුම ඉරාදලා ලියුමක් ලිව්වා "අම්මේ, මේ එන මගෙ පුතාට හොඳට සලකාපන්. ඇස් ගලවාපු උන්ගෙ ඇස් පෙනීම ඇති කරන බෙහෙත් ටිකක් පුතා අත එවාපන්" කියලා.

ඊට පස්සෙ මේ කුමාරයා ඒ ලියුමත් අරගෙන බත් මුලකුත් බැඳගෙන ගියා අර රාක්ෂිගෙ ගෙදරට.

කුමාරයා යනකොට ම රාක්ෂි දොරකඩ ඉඳලා කිව "කටට රසට මසක් හම්බ වෙන්ට යි යන්නෙ අද මට" කියලා.

කුමාරයාට මේ කතාව ඇහිලා "මොකක් ද අම්මෙ, කිවුවේ" කියලා අර ලියුම දුන්නා රාක්ෂිට.

රාක්ෂි ලියුම බලලා "අනේ මගෙ පුතාමෙ" කියලා කුමාරයාට හොඳට සත්කාර කෙරුවා.



ඊට පසුව ද රාක්ෂි ගහක් පෙන්නලා කීවා "පුතා මෙන්න මේ ගහේ කිරි අරගෙන අන්ධයින්ගෙ ඇස්වල ගෑවාම ඇස් පෙනීම ඇති වෙනවා" කියලා.

ඒ පාර කුමාරයා කීවා "එහෙනං අම්මෙ මට ඒ බෙහෙත මුලක් බැඳලා දියන්" කියලා. රාක්ෂින් ගහේ කිරි එකතු කරලා මුලක් බැඳලා කුමාරයා අතට දුන්නා.

කුමාරයා බෙහෙත් අරගෙන ගියා අර අන්ධ කුමාරි-කාවන් හත් දෙනා හිටි ගුහාවට. ගිහින් ඒ බෙහෙත්වලින් හත් දෙනාගෙ ම ඇස් සනීප කරලා, ඒ අම්මලා හත්දෙනාත් එක්කම ගියා අර යකා මරාපු රටේ රජ්ජුරුවන්ගෙ මාලිගාවට.

ගිහින් ඒ රාජකුමාරිත් කරකාර බැඳගෙන, කුමාරිත්, අම්මලා හත් දෙනාත් එක්ක ගියා පිය රජ්ජුරුවන්ගෙ මාලිගාවට; ගිහින් අර රාක්ෂි මරලා රජ්ජුරුවන්ට ඔක්කොම සුලමුල විස්තර කලා.

රජ්ජුරුවොත් බොහොම සන්තෝස වෙලා බිසෝවරු හත් දෙනා ආයෙත් සරණ පාවාගත්තා. කුමාරයාට යි කුමාරිට යි අලුත් මාලිගාවකුත් හදා දීලා රටේ රජකමත් දුන්නා. ඊට පස්සෙ ඒ රටේ කවුරුත් සන්තෝසෙන් හිටියා.

# රන්ගස, රිදීමල, රිදීකුකුළා

එකමත් එක රටක එක රජ්ජුරු කෙනෙකුයි පුතුන් තුන් දෙනෙකුයි හිටියා. මේ රජ්ජුරුවො එක දවසක් රාත්තිරියෙ නිදා ඉන්න කොට හීනෙකින් දුටුවා රන්තරන් ගහක මුදුනෙ රිදී මලක් පිපිලා ඒ මල උඩ කුකුළෙක් ඉඳ අඬ ලනවා.

ඉතින් මේ රජ්ජුරුවො උදේම අවදි වෙලා කුමාරවරු තුන් දෙනාගෙන් වැඩිමල් කුමාරයාට කතා කර කීවා "මං ඊයෙ රෑ හීනයක් දුටුවා; ඒ හීනය තෝරලා කියන්ට පුළුවනි ද" කියලා.

ඒ ගමන වැඩිමල් කුමාරයා කීවා "පිය රජ්ජුරුවන් වහන්ස මොකක් ද ඒ හීනය?" කියලා.

රජ්ජුරුවො කීවා "මම ඊයෙ රෑ හීනෙකින් දුටුවා රන් ගසක සුදු පාට රිදී මලක් පිපිලා ඒ උඩ කුකුළෙක් ඉඳ අඬලනවා. මේ හීනෙ තෝරා දෙන්ට කියලා."

ඒ ගමන වැඩිමල් කුමාරයා කීවා "පිය රජ්ජුරුවන් වහන්ස, මට නම් මේ හීනය තෝරන්ට අමාරු යි, ඒත් බාග වෙලාවට මගෙ මල්ලිලා දෙන්නා තෝරයි" කියලා.

රජ්ජුරුවො ඊට පස්සෙ මද්දුම කුමාරයත් ළඟට ගෙන්නලා හීනෙ විස්තර කළා. ඒ කුමාරයා කීවා "පිය රජ්ජුරුවන් වහන්ස, මට මේ හීනෙ තෝරන්ට අමාරුයි මගෙ මලයා නම් බාග වෙලාවට මේ හීනෙ තෝරයි" කියලා.



ඉතින් රජ්ජුරුවො බාල කුමාරයත් ළඟට කැඳවලා කීවා "මම හීනයක් දුටුවා ඒක තෝරා දෙන්නට පුළුවන් ද?" කියලා.

බාල කුමාරයා ඇහුවා "මොකක් ද පිය රජ්ජුරුවන් වහන්ස හීනය" කියලා.

රජ්ජුරුවො කීවා "මම හීනෙකින් දුටුවා රන් ගහක මුදුනෙ රිදී මලක් පිපිලා ඒ මල මුදුනෙ රිදී කුකුළෙක් හිටලා තුන් පාරක් හඬලනවා මේ හීනෙ තෝරා දෙන්ට පුළුවන් ද" කියලා.

ඒ පාර බාල කුමාරයා කීවා, "පුළුවනි පිය රජ්ජුරුවන් වහන්ස, ඒත් ඊට අස්සර වෙලා මේකෙ තේරුම හොයා ගෙන එන්ට ඕනෑ" කියලා.

ඉතින් පිය රජ්ජුරුවො කීවා හොඳයි එහෙම නම් තුන් දෙනා ම ගිහින් මේ රන් ගහ යි රිදී මල යි, රිදී කුකුළා යි හොයා ගෙන එන්ට කියලා.

ඒ පාර කුමාරවරු තුන් දෙනා ම බත් මුලකුත් බැඳගෙන පිය රජ්ජුරුවන්ගෙන් තුන් අවුරුද්දකට සමු අරගෙන එක මගින් ම පිටත් වෙලා ගියා. එහෙම යන කොට මේ තුන් දෙනාට හමු වුණා තුන් මංසලක්. ඉතින් මේ තුන් දෙනා මේ තුන් මංසල ගහක් යට ඉඳගෙන බත් මුල ලිහා බෙදා ගෙන කාලා කතා කර ගත්තා තුන් දෙනා වෙන වෙන ම මේ මං තුනෙන් යන්ට. වැඩිමල් කුමාරයා කීවා මම යනවා මෙන්න මේ මඟින් උඹලා දෙන්නා මේ අනික් මං දෙකින් පලයල්ලා කියලා. මද්දුම කුමාරයත් එක මඟක් පෙන්වා මලයාට කීවා මං යනවා මෙන්න මේ මඟේ, මලයා අනික් මඟේ යන්ට කියලා. බාල කුමාරයත් ඉතිරි මඟේ ගියා.

ඔන්න බාල කුමාරයා ඔහොම ගිහින් ගිහින් එක නුවරක කනවැන්දුම් නැගියකගෙ ගේකට ගියා. මේ නොරටක ඉඳලා ආ කුමාරයන් දුටුවාම අර මැලි අම්මා ඇහුවා "අනේ පුතා මොකට ආවාද මේ රටට අපට ලිපේ ලන්න දර කැල්ලක්වත් නැ නේ මේ රටේ" කියලා.

ඉතින් මේ කුමාරයා ඇහුවා "ඒ මොකද" කියලා.

එතකොට මැලි අම්මා කීවා "අනේ පුතේ මේ රටට යකෙක් ඇබ්බැහි වෙලා මේකෙ මිනිසුන් මරාගෙන කනවා නේ කියලා."

කුමාරයා ඇහුවා "ඉතින් ඔය යකා කොහොම ද මිනිසුන් අල්ලා ගන්නෙ?" කියලා.

මැලි අම්මා කීවා "අනේ පුතේ මිනිසුන් මේ කැලේට ගිහින් දර කපන කොට යකා හුවක් කියාගෙන ඇවිත් දර කපන මිනිසුන් බැගෙන යනවා" කියලා.

ඉතින් ඊට පස්සෙ කුමාරයා තමන්ගෙ කඩුවත් අරගෙන ගියා කැලේට ගිහින් දර ලීයකට කොටන්ට උණා. එතකොටමත් මේ යකා හයියෙන් හුවකුත් කියාගෙන දුවගෙන ආවා කුමාරයන් බැගෙන යන්ට.

කුමාරයා එක පාරට ම යකා ඉස්සරහට පැනලා කඩුවෙන් යකා පොලු ගැහුවා. පොලු ගහලා දර මිටියකුත් කඩාගෙන මැලි අම්මාගෙ ගෙදරට ගියා.

එතකොට මැලි අම්මා ඇහුවා "අනේ පුතේ යකා හදි වුණේ නැද්ද" කියලා.

කුමාරයා කීවා "යකා හුවක් කියාගෙන ආවා, මං ඌ මේ කඩුවෙන් පොලු ගහලා දැමුවා" කියලා.



ඉතින් මැලි අම්මත් අර දර දමලා ගිනි පුගාලා බත් උයලා කුමාරයින්ට කන්ට දුන්නා.

පසුව ද උදේ රටේ රජ්ජුරුවෝ කැලේට ගිහින් දර කපන්ට උණ යකා මරන්ට හිතාගෙන. ඒත් එද යකා ආවෙ නැ හූ කියා ගෙන, ඒ පාර රජ්ජුරුවො හොයාගෙන යනකොට දුටුවා යකා මරා දමා තිබෙන වග. ඉතින් රජ්ජුරුවො මාලිගාවට ගිහින් අණ බෙරයක් පතුරුවලා කීවා "මේ යකා මැරූ කෙනා කවුරු ද කියලා රජ්ජුරුවන්ට වහා ම දන්වන්ට" කියලා.

මේ අණ බෙරය ඇහුණු අර මැලි අම්මා කුමාරයනුත් කැටුව රජ මාලිගාවට ගිහින් රජ්ජුරුවන්ට කියා සිටියා යකා මැරුවෙ මේ කුමාරයො යි කියලා.

රජ්ජුරුවො ඇහුවා "කොහොම ද යකා මැරුවෙ" කියලා.

කුමාරයා කීවා "මං මේ මැලි අම්මාට ලිප ලන්ට දර ටිකක් කපන කොට හුවක් කියාගෙන යකා පැනගෙන ආවා මා කන්ට. මං ඉස්සරහට පැනලා මේ කඩුවෙන් යකා පොලු ගහලා දැමුවා" කියලා.

රජ්ජුරුවො මේ කතාව අහලා බොහොම සන්තෝස වෙලා කුමාරයන්ට නෑගි කරලා දුන්නා ඇතකු හිරව වස්තුව ඕ රටෙන් පලාතකුයි. ඉතින් මේ කුමාරයා ඒ ඔක්කොම අර මැලි අම්මාට දීලා එතනින් යන්ට ගියා ඒ ගමන කුමාරයා ගියා වෙන රටකට. ඒත් අර වගේ කනවැන්දුම් අම්මා කෙනෙකුගෙ ගෙදරට. ගිහින් කීවා;

"අනේ! අම්මෙ, මට අදට නවාතැනක් දෙන්ට" කියලා.

ඉතින් ඒ මැලි අම්මා කීවා "නවාතැනක් දෙන්ට නම් බැරි නෑ පුතා ඒත් කොතැනද නිද ගන්නෙ. මේකෙ එළියෙ පහළියෙ නිද ගන්ට බෑ රෑට මහ එළියක් වැටෙනවා. ඒ එළිය දුටු හැම දෙනා ම මැරී යනවා" කියලා.

ඉතින් කුමාරයා ඇහුවා. "කොහෙන් ද අම්මේ ඒ එළිය එන්නෙ" කියලා.

මැලි අම්මා කීවා "අන්න අර තලාවෙන් තමයි මේ එළිය. කාටවත් ම නවත්වන්ට බෑ. රජ්ජුරුවො අණ බෙරේකුත් පැනෙව්වා මේ එළිය නැවැත්තු කෙනෙකුට රටෙන් පළාතකුයි ඇතකු බරට වස්තුව යි දෙනවා" කියලා.

ඒ පාර කුමාරයා කීවා "හොඳයි එහෙනම් රජ්ජුරුවන්ට ගිහින් කියන්ට මට ඒ එළිය නවත්වන්ට පුළුවනි. ඒ තලාවෙ උසට මැස්සක් බැඳලා එහෙන්ට ගොම් කුල්ලකුයි, දිය කළේකුයි ගිහින් තියන්ට කියලා. අද රෑට ම මං ඔය එළිය නවත්වන්නම්" කියලා.

මැලි අම්මා ගිහින් රජ්ජුරුවන්ට කීවාම රජ්ජුරුවොත් හනික ඒ අඩුම කුඩුම සූදානම් කර දුන්නා.

ඉතින් මේ කුමාරයා හැන්දෑවෙ බත් පෙහෙව් කාලා ගිහින් අර මැස්සට වෙලා හිටියා. ඔන්න රෑ දෙගොඩ හරිය විතර වෙනකොට එළියක් වැටුණා. කුමාරයා බැලුවාම දුටුවා නාග ලෝකෙ නාග රජ්ජුරුවො ඇවිත් කණ්ට මාණික්කය වමාරා තියලා එළිය වෙන්ට ගොදුරු හොයන්ට දුරට ගියා.

එතකොට මේ කුමාරයා අර ගොම කුල්ල උස්සලා අර මැණික උඩට දැමුවා. එතකොට නාග රාජයා හනික දුවගෙන ඇවිත් මැණික ගත් ඇත්තාය කියලා දිය කළේට දෂ්ට කරන්ට ආවා. එතකොටමත් කුමාරයා ඉස්සරහට පැනලා අර නාගයා කඩුවෙන් කොටලා කොටලා දැමුවා.



ඊට පස්සෙ ගොම් ගොඩ පීරලා අර මැණික අරගෙන හෝදලා රෙද්දක් කුළුවෙ දමා ගත්තා.

ඉතින් කුමාරයා ඔහොම ඉන්නකොට එළි වුණා. රජ්ජුරුවොත් උදේ ම ආවා එළිය නැවැත්තුවා ද බලන්ට. ඇවිත් කුමාරයන්ගෙන් ඇහුවා එළිය නැවැත්තුවා ද කියා. කුමාරයා කීවා "ඔන්න බලන්ට, මේ නාග රාජයා තමයි ඒ එළිය ඇති කෙළේ. මං ඒ නාගරාජයා මරා දැමුවා" කියලා.

රජ්ජුරුවොත් බොහොම සන්තෝෂ වෙලා මේ කුමාරයාට රටෙන් පළාතකු යි ඇතෙක් බරට වස්තුව යි කැපී කරලා දුන්නා. ඉතින් කුමාරයත් ඒ ඔක්කොම මැලි අම්මාට දීලා ඒ නාග රාජයා ආ මග දිගේ ම ගියා නාග ලෝකෙට.

මේ කුමාරයා නාග ලෝකෙට යනකොට නාග රජ්ජුරුවන්ගෙ දූ කුමාරිකාවො තුන් දෙනා ම එක තැනක හිටියා. මේ කුමාරයන් දැකලා නාග කුමාරිකාවො කීවා "මොකට ද මෙහාට ආවෙ, අපේ පිය රජ්ජුරුවො දැන් ආවොත් විනාශ කර දමයි" කියලා.

ඉතින් මේ කුමාරයා කීවා "තොපේ පිය රජ්ජුරුවන්ට දැන් ආයෙ එන්ට බැහැ. මං එයා මරා දමලයි ආවෙ මෙන්න බලන්ට කණ්ට මාණික්කය" කියලා.

ඒ ගමන කුමාරිකාවො ඇහුවා "ඉතින් මොකටද මේ නාග ලෝකෙට ආවෙ?" කියලා.

කුමාරයා කීවා "මං ආවෙ සැත්තරයක් හොයාගෙන යි කියලා."

එතකොට නාග කුමාරිකාවො ඇහුවා "මොකක් ද ඔය සැත්තරය" කියා.

කුමාරයා කිව්වා "අපේ පිය රජ්ජුරුවො දක්කා රන් ගහක රිදී මලක් පිපිලා ඒ උඩ රිදී කුකුළෙක් හිටලා තුන් පාරක් අඬලනවා. අන්න ඒක හොයාගන්ටයි මං මේ ආවෙ" කියලා.

ඉතින් කුමාරිකාවො කිව්වා අපට පුළුවනි ඒ ගහ හොයලා දෙන්ට, හැබැයි මෙහෙදී බැහැ, අපි යමු දැන් පිය රජ්ජුරුවන් ළඟට කියලා.

"හා හොඳයි" කියලා මේ කුමාරය යි අර නාග කුමාරිකාවුන් තුන් දෙනා යි හතර දෙනාම ඔන්න ආවා අර සහෝදරයො තුන් දෙනා වෙන් වෙලා ගිය තුන් මංසලට. ඇවිදින් වැඩිමල් සහෝදරයා ගිය මහ දිගේ ගිහින් ඒ සහෝදරයාත් කැටුව ආවා අර තුන් මංසලට. ඊට පස්සෙ මද්දුම සහෝදරයා ගිය මග ඔස්සෙ ගිහින් එයත් හොයා ගෙන හයදෙනාම කැටුව ආවා පිය රජ්ජුරුවන්ගෙ මාලිගාවට.

ඉතිං රජ්ජුරුවො ඇහුවා "හොඳයි ගහ හොයන්ට අහගෙන ද ආවෙ" කියලා.

එතකොටු බාල කුමාරයා කිව්වා "ඔව් පිය රජාණන් වහන්ස, මේ කුමාරිකාවො තුන් දෙනා ඒ ගහ හොයා දෙයි" කියලා.

එතකොට අර නාග කුමාරිකාවන් තුන් දෙනාගෙන් බාල ම කුමාරි මේ බාල කුමාරයාට කිව්වා "අප තුන් දෙනා ම එක පෙළ තියලා පිය කඩුවෙන් එක පාරට කපා දමන්ට. එතකොට රන් ගහේ රිදී මල යි, රිදී මලේ රිදී කුකුළ යි දකින්ට ලැබෙයි. රිදී කුකුළා තුන් පාරක් අඬලා ඉවර වෙනවාත් එක්කම ඒ කුකුළ යි, රිදී මල යි, රන් ගහ යි තුන ම කපා දමන්ට" කියලා.



ඉතින් බාල කුමාරයා මේ කුමාරිකාවුන් තුන් දෙනා එකපෙළට හිටුවලා එක කඩු පාරකින් තුන් දෙනාගෙ ම ඉස් ගහ දැමුවා. එතකොටමත් එතන රන් ගහකුත් එගහෙ රිදී මලකුත් මලේ රිදී කුකුළෙකුත් පෙනී හිටියා. මේ කුකුළා තුන් පාර අඬලා ඉවර වෙන කොටමත් බාල කුමාරයා මේ රන් ගහයි, රිදී මලයි, රිදී කුකුළයි කඩුවෙන් කොටා දැමුවා.

එතකොට ම ආයෙත් කුමාරිකාවුන් තුන් දෙනාට ම පණ ආවා. ඉතින් මේ කුමාරිකාවො තුන් දෙනා රජ්ජුරුවන් අතින් ඇහුවා "දේවයන් වහන්ස දැන් ඒ ගහ තේරුණා ද?" කියලා.

ඉතින් රජ්ජුරුවො කිව්වා "ඔව් ඒ හීනෙන් දුටුව රන් ගහත් රිදී මලත්, රිදී කුකුළත් මං දැන් දුටුවා. හීනෙත් තේරුණා", කියලා.

ඊට පස්සෙ මේ රාජ කුමාරවරු තුන්දෙනා අර නාග කුමාරිකාවුන් තුන් දෙනා සරණ පාවා ගෙන ඒ රටේ හිටියා.

# අනුන් නසන්ට යනකොට තමන්ම නැසෙනවා

ඒකමත් එක රටක එක රජ කෙනෙකු යි රජ බිසෝ කෙනෙකුයි හිටියා. මේ දෙන්නාට දරුවන් හිටියෙ නැති නිසා පිටින් කුමාරයකු අරගෙන හද ගන්ට වුණා. මෙහෙම ඉන්න අතරෙදී අර රජ බිසවටත් පුතෙක් උපන්නා.

පුතා ඉපදුණායින් පස්සෙ රජ්ජුරුවෝ කල්පනා කළා මේ හද ගත්ත කුමාරයා මරා දමන්ට. ඉතින් අමාත්‍යයකුට කතාකරල කිව්වා "මෙන්න මේ කුමාරයා මහා කාලකණ්ණියෙක් මාලිගාවෙ තියාගන්ට හොඳ නැ කියලා සාස්තරකාරයා කියනවා. ඒක හින්ද මූ ගෙන ගිහින් ගව ගාලෙ කඩුල්ල අරිනකොට එතන බාවල එන්ට" කියලා.

ඉතින් අමාත්‍යයත් මේ කුමාරයත් අරගෙන ගිහින් ගව ගාලෙ කඩුල්ල අරින කොට එතන බාවා තිබුවා. ගාලෙන් ඉස්සරවෙලා ම පිටවුණ නායක ගවයා මේ කුමාරයත් දකලා අනික් ගවයින් පාගා දමයි කියලා කුමාරයත් ගතර ගාතයට මැදි කරගෙන එහෙම ම හිටගෙන හිටියා. පන් සියයක් ගවයො නායක ගවයා දෙපැත්තෙන් පිටවෙලා ගියා. අන්තිමට ගව පල්ලා එන කොට මේ කුමාරයත් දකින්ට ලැබිල වඩාගෙන ගියා ගෙදර.

අමාත්‍යයත් ගිහින් රජ්ජුරුවන්ට කියා හිටිය වෙච්ච



සිද්දිය මික්කොම. ඒ ගමින රජ්ජුරුවො කණගාටු වෙලා මසුරන් දහක් අර ගෙන අමාත්‍යයන්ට අතට දීලා කිව්වා ඒ කුමාරයත් ඇරගෙන එන්ටය කියලා. ඉතින් අමාත්‍යයත් ගිහින් ගව පල්ලාට මසුරන් දහ දීලා කුමාරයත් ඇරගෙන ආවා.

ඊට පස්සෙ ආයෙත් දවසක් රජ්ජුරුවෝ අර අමාත්‍යයාට කතා කර කිව්වා මේ කුමාරයත් අරගෙන ගිහින් හාත්තු කණ්ඩායමේ ගැල් දහක් එනකොට ඒ එන මග බාවලා එන්ට ය කියලා. අමාත්‍යයත් කුමාරයත් ඇරගෙන ගිහින් ගැල් දහක් එන මග බාවා තිබුවා. එත් ගැල් කරුවො කුමාරයත් මග ඉන්නව දකලා ගැල් නවත්තලා කුමාරයත් අරගෙන ගැලක තියාගෙන යන්ට ගියා.

ඒ ගමනත් අමාත්‍යයා ඇවිදින් රජ්ජුරුවන් දක්කදි කියා හිටියා වෙච්ච සිද්ධිය මික්කොම. ඒ ගමින රජ්ජුරුවො ආයෙමත් මසුරන් දහක් ඇරගෙන අමාත්‍යයන් අතට දීලා කිවුවා ගැල්කරුවන්ට මසුරන් දහ දීලා කුමාරයත් ඇරගෙන එන්ට කියලා. අමාත්‍යයත් ගිහින් මසුරන් දහ ගැල්කරුවන්ට දීලා ආයෙත් කුමාරයත් ඇරගෙන ආවා මාලිගාවට.

ඊට පස්සෙ තවත් දවසක රජ්ජුරුවෝ මේ අමාත්‍යයාට කතා කරල කිව්වා මේ කාලකණ්ණි කුමාරයා ගෙන ගිහින් කඳු පාමුල උණ පඳුරකට විසි කර එන්ට කියලා. හොඳයි කියල අමාත්‍යයත් ගිහින් ගල උඩ හිටල කුමාරයත් විසි කළා උණ පඳුර උඩට. කුමාරයත් බිමට වැටුණෙ නෑ; උණ පඳුරෙ එතිලා කුඹුණ මාළුවා වැල් ගාලක් උඩ රැඳිල හිටියා. එද එතෙන්ට උණ ලී කපාගෙන යන්ට ආ මිනිහෙක් මේ කුමාරයත් දකලා උණ පඳුරෙන් බාගෙන ගෙදර ඇරගෙන ගියා. එදත් අමාත්‍යයා ගිහින්

රජ්ජුරුවන් දන්නදී කීවා වුණ සිද්දිය ඔක්කොම.

ඒ ගමන රජ්ජුරුවෝ ආයෙමත් මසුරන් දහක් අරගෙන අමාත්‍යයෝ අතේ යවලා කුමාරයන් එතැනින්ම ගෙන්නා ගත්තා. ඊයින් මෙයින් කුමාරයන්ට හත් අවුරුද්දකුත් වයස උණා. මේ රජ්ජුරුවෝ මේ කුමාරයන් මරාගන්ටම තැනුවා මිස අකුරටවත් ඇරියෙ නෑ. ඒත් මේ කුමාරයා වෙන වෙන දේවලට හොඳට දක්සයි.

ඕහොම කලක් ගියායින් පස්සෙ මේ කුමාරයන් බලන්ඩ ලක්ෂණත් බැරුව හැදීගෙන එනවා. හොඳ හුරු බුහුටියි. ඉතින් මේක රජ්ජුරුවන්ගෙ ඇහේ ඇනුණු කටුවක් වගේ පෙනෙනවා. ඒ පාර රජ්ජුරුවෝ අර අමාත්‍යයාට කතා කරලා කීවාලු කාලකන්නියා මරා ගන්ට හැටියක් නෑ ගිහින් කුඹලාටවත් කතා කරල එන්ට කියලා. ඉතින් අමාත්‍යයත් ගිහින් කුඹලට කිවුවා අපේ රජ්ජුරුවන්ගෙ කාලකන්නි පුතෙක් ඉන්නවා. මෙතෙක් මෙතෙක් දේ කළා ඒත් මරා දමන්ට බැරිවුණා. ඉතින් මේ වළං පලහන ගෙටවත් මැදිකරලා මරා දමන්ට බැරි ද? ඒ කරලා ඉවර වෙලා දන්නුවාම රජ්ජුරුවන් ගෙන් කාන්න මාන්න ලැබෙයි කියලා. කුඹලාත් කීවා හා හොඳයි ඕකත් මහ කාරියක් ද, මං කරන්නම්කො කියලා.

ඒ ගමන අමාත්‍යයා ඇවිදින් කුඹලා කැමති බව කීවාම රජ්ජුරුවෝත් සතුටු වෙලා හතික ලියමනක් ලීවා "මගෙ මේ කාලකන්නි පුතා වළං පලහන ගෙට මැදිකරල ගිනි ලා ඉවර වෙලා මට දන්නුවාම ඊට සුදුසු පඬුරක් මගෙන් ලැබෙනවා" කියලා. මේ ලියමන ලියා අර හද ගත්ත කුමාරයාට කතා කරලා කීවා පුතා "මේන්න මේ ලියමන අහවල් කුඹලාට දීලා කියන දෙයක් අහගෙන වරෙන් කියලා".



කුමාරයත් ලියමන මොකක් ද දන්නෙ නෑ අරගෙන කුඹල් ගෙදරට යන්ට ගියා. මේ යන අතරමගදී මේ කුමාරයට හදි වුණ රජ්ජුරුවන්ගෙ ම පුත් කුමාරයා වෙන ළමයින් එක්ක සිල්ලු කෙළිනවා. රජ්ජුරුවන්ගෙ ම පුතා සෙල්ලමෙන් හුඟක් පැරදීලා හිටියෙ. ඒ හින්ද ඒ කුමාරයා මේ හදගත්ත කුමාරයන් දුටු හැටියෙ කීවා "අනේ අයියෙ මා දැන් හුඟක් පැරදිලයි ඉන්නෙ, ඒක හන්ද මගෙ අත සෙල්ලම් කරලා මා දිනවලා දෙන්ට."

එතකොට හද ගත්ත කුමාරයා කීවා, "පිය රජ්ජුරුවො මට ලියමනක් දීලා අහවල් කුඹලාට ගිහින් දීලා එන්ටෙයි කීවා. ඒක හින්ද දැන් මට මෙතන සෙල්ලම් කර කර ඉන්ට වෙලාවක් නැහැ" යි කියලා.

එතකොට අනික් කුමාරයා කීවා "හා එහෙනම් අයියා මගෙ අත සෙල්ලම් කරන කල් මම දුවලා පිය රජ්ජුරුවන්ගෙ ලියමන දීලා එන්නම් කුඹලාට" කියලා. ඉතින් ඒ කුමාරයා ලියුම ඉල්ලාගෙන කුඹල් ගෙදරට ගියා.

රජ්ජුරුවන්ගෙ ම පුත් කුමාරයා මේ ලියුමත් අරගෙන කුඹල් ගෙදරට යනකොට කුඹලාත් වළං අඹරලා ඉවරවෙලා ගින්දර තියන්ට හැරගිලයි හිටියෙ. ඉතින් කුඹලා කුමාරයන් ඇරගෙන ගිය ලියුම කියවලා ඒකෙ තිබුණ හැටියට අර කුමාරයත් වළං පලහන ගෙට මැදි කරලා ගිනි දැමුවා. ගින්න ඇවිලෙන කොට ගෙට මැදිවෙලා හිටිය කුමාරයා දලා මළා.

ඉතින් අර හදගත්ත කුමාරයා ළමයින් එක්ක සෙල්ලම් කරලා මලයා පැරදි හිටි හරියටත් එක්ක දිනුවා, දිනලා හැන්දෑවෙ ගියා මාලිගාවට. මෙයා එනව දුටුවාම

රජ්ජුරුවෝ ඇහුවා "ඇයි කුඹලාට ලියුම අරගෙන ගියෙ නැද්ද?" කියලා.

එතකොට හදගත්ත කුමාරයා කිව්වා මං ලියුම අරගෙන යන කොට මලයා සිල්ලු කෙළින තැනදී හදී ගැහුණා. මලයා මට කිව්වා "අනේ අයියෙ, මා දැන් හුඟක් පැරදිලා ඉන්න නිසා මගෙ අත සෙල්ලම් කරන්ට" කියලා. ඉතින් මා කිව්වා "බැහැ මලයා, පිය රජ්ජුරුවන්ගෙ පණිවිඩේකට කුඹල් ගෙදර යනවා" කියලා. ඒ ගමන මලයා "හා හොඳයි ඒ පණිවිඩේට මං යන්නම්, අයියා මේ මගෙ අත සෙල්ලම් කරන්ට" කියලා ලියුමත් අරගෙන කුඹල් ගෙදරට ගියා කියලා.

ඒ ගමන රජ්ජුරුවෝ හනික අමාත්‍යයාට කතා කරලා කීවා ඉක්මනට කුඹල් ගෙදරට ගිහින් කුමාරයා එහෙ ඉන්නවා නම් එක්ක එන්ට කියලා. අමාත්‍යයාත් පමානැතුව ගියා කුඹල් ගෙදරට.

අමාත්‍යයා දුර තියාම දුටුව කුඹලා කිව්වා මහත්ත "කියාපු හැටියට වැඩේ හරියට ම කෙරුවා" කියලා.

ඉතින් අමාත්‍යයා ආපහු ඇවිදින් රජ්ජුරුවන්ට කිව්වා වෙලා තිබුණු දේ. ඒ ගමන රජ්ජුරුවන්ට බොහොම හිතට අමාරු උණා.

ඒ පාර රජ්ජුරුවෝ හනික ලියුමක් ලිව්වා වෙන රටක රජ කෙනෙකුට. ඒ ලියුමෙ රජ්ජුරුවෝ ලිව්වා "මේ ලියුම අරගෙන එන මගෙ මේ කාලකන්නි පුතා මරා වට අන්වන්නට"ය කියලා. ඊට පස්සෙ අර හදගත්ත කුමාරයාට ලියුම දීල කිව්වා "මේ ලියුම අරගෙන ගිහින් අසවල් රටේ අසවල් අසවල් රජ්ජුරුවන්ට දීලා එන්ට" ය කියා.



ඉතින් මේ හදගත්ත කුමාරයා මේ ලියුමත් අරගෙන අර කියාපු රජ්ජුරුවන්ගෙ මාලිගාවට ගියා. ඒ යන වේලාවෙ රජ්ජුරුවෝ හිටියෙ නැ මාලිගාවෙ. රජ්ජුරුවන්ගෙ දූ කුමාරිකාව හිටියෙ. මේ හදගත්ත කුමාරයා දැන් යස තරුණයෙක්, හොඳ පෙනුමයි. ඉතින් අර රාජ කුමාරිට එක පාරටම හිතුණා මේ කුමාරයා කසාද බැඳගන්ට. ඉතින් මේ කුමාරි ඇවිදින් කුමාරයත් එක්ක කතා කරලා වග තුග ඇහුවම කුමාරයා කිව්වා මේ ලියුම අරගෙන ආ වග.

ඒ ගමන කුමාරි ලියුම ඉල්ලාගෙන බැලුවා. බලාපුකොට ඒකෙ තියෙන්නෙ මේ කුමාරයත් මරා දමන්ට ය කියලයි. ඉතින් කුමාරි කළේ මොකද? අර ලියමන ඉරා දමලා වෙනින් ලියමනක් ලියලා කුමාරයා අතට දීලා කිව්වා අපේ පිය රජ්ජුරුවෝ ආවාම මේ ලියමන දෙන්ට කියලා.

ඉතින් මේ කුමාරයා ලියුමත් තියාගෙන ඉන්නකොට රජ්ජුරුවෝ ආවා. කුමාරයා ලියමන දුන්නාම ඒ රජ්ජුරුවෝ ලියමන කියෙව්වා. ඒ ලියමනේ ලියලා තිබුණෙ "මගේ ආදරණීය පුත් කුමාරයා මේ ලියුමත් අරගෙන ආවාම ඔබේ දූ කුමාරිය සරණ පාවා දීලා වාසයට මාලිගාවක් තනා දෙන්ට ය" කියලයි. ඉතින් මේ රජ්ජුරුවොත් බොහොම සන්තෝස වෙලා දූ කුමාරියත් සරණ පාවා දීලා වාසයට මාලිගාවකුත් තනා දුන්නා.

ඊට පස්සෙ මේ කුමාරයයි කුමාරියි සන්තෝසෙන් මෙහෙම ඉන්නකොට අර ලියුම එවාපු නපුරු රජ්ජුරුවන්ට දැනගන්ට ලැබුණා, මේ කුමාරයත් නොමරා රාජ කුමාරියත් සරණ පාවා දීලා මේ රටේ යහතින් ඉන්න වග.

මේ විග අහල රජ්ජුරුවන්ගෙ හිතේ වේදනාව වැඩිකමට රජ්ජුරුවන්ට අසනීපයක් හැදුණා.

රජ්ජුරුවෝ අසනීපෙන් ඉඳගෙන මේ හදෙහන්ත කුමාරයාට ලියමනක් එවුවා දකින්ට එන්ට කියලා. ඒත් කුමාරිකාව කුමාරයට යන්ට දුන්නෙ නෑ; දුන්ම යන්ට එපා කිව්වා. ඔන්න ඊට පස්සෙ ලියමනක් ලැබුණා රජ්ජුරුවන්ට බොහොම අසාද්දයි; අදවත් විශ්වාස නෑ කියලා.

ඒ ගමන කුමාරිකාව කිව්වා හොඳයි එහෙනං දැන් අපි යමු කියලා. ඉතින් කුමාරි යි කුමාරයා යි දෙන්න ම ආවා. ඒ එනකොට රජ්ජුරුවන්ට හුස්ම යන්නම වැටෙන්නෙ. දැන් අන්තිම යි, ඉතින් රජ්ජුරුවෝ කුමාරයට කතා කළාම කුමාරිය කිව්වා කුමාරයාට රජ්ජුරුවන්ගෙ පය පාමුලින් ඉඳගන්ට කියලා. කුමාරි ඉඳගත්තා ඉහ ළඟින්. දැන් ඉතින් මේ රජ්ජුරුවෝ කරන්ට යන්නෙ තමන්නෙ රාජ්ජේවත් භාණ්ඩාගාරෙවත් මාලිගාවවත් මේ කුමාරයට අයිති නැහැ කියන එක කියන්ටයි. එහෙම හිතාගෙන රජ්ජුරුවෝ එකින් එක කියාගෙන ගියා රජ්ජුරුවන්ට අයිති දේවල්. "මේ දේවල් ඔක්කොම"—කියලා තොපට අයිති නෑ කියන්ට යනකොටමත් කුමාරිය රජ්ජුරුවන්ගෙ බෙල්ල බදාගෙන "අනේ පියාණන් වහන්ස, ඔබ වහන්සෙ අපට නැතිව ගියායින් පස්සෙ මෙච්චර මේ දේවලින් මොන පොරෝජ්ජනයක් ද කියල වැලපෙන්ට පටන් ගත්තා. කුමාරි බෙල්ල බදාගෙන හිටි නිසා රජ්ජුරුවන්ට කියා ගන්ට බැරිවුණා "තොපට අයිති නෑ" කියන ටික. එයින් ම රජ්ජුරුවෝ මළා.

ඊට පස්සෙ මේ කුමාරයා රටේ රජකමත් අරගෙන කුමාරියත් එක්ක බොහොම සන්තෝසෙන් එහෙ රාජ්ජෙ කළා.



# දීපුණුවට යන බැණා

එකමත් එක රටක එක මිනිහෙක් ඒ රටේ පොල් නැති නිසා පොල් තියන රටකට ගියා පොල් හොයාගෙන. ගිහින් ඒ රටේදී පොල් ගෙඩි හැට හැත්තෑවක් එකතු කර ගත්තා. ඒත් මේ පොල් ගෙඩි ටික ගෙදර ගෙනයන්ට බර වැඩි නිසා මේ මිනිහා පොල් ගෙඩි ටික බිඳලා තෙල් ඇර ගත්තා.

මේ තෙල් ගෙදර ගෙනයන්ට හිතාගෙන මේ මිනිහා තෙල් ටික ලොකු කළගෙඩි දෙකකට වත් කරලා කළ දෙක පත් බැඳලා කදක එල්ලා ගත්තා. ඊට පස්සෙ කදත් කරේ තියාගෙන මිනිහා පිටත් උණා ගමට යන්ට.

ඉතින් ඔය මිනිහා කඳේ බරෙන් පැද්දි පැද්දී කාන්තාරෙ ම මග යනකොට ඒ අතට ම මග යන තරුණ පාටෙ තව මිනිහකු හමු උණා. ඊට පස්සෙ දෙන්නා එක්ක එක තැනක ඇදිගෙන බුලත් විටක් හෙම කාලා මේ කද ගෙනා ඇත්තා මගදී හදිවුණ හෙනාට කතාකරලා කිව්වා, "ඔබාලේ, උඹලගෙට පුළුවන් නම් මට මේ කද ගමට ගෙනියන්ට උදව් වෙන්ට ඒ වෙනුවෙන් මං තුට්ටු පහක් දෙනවා" කියලා. ඉතින් මග ගිය ඇත්තාත් හා හොඳයි කියලා කද ගෙනයන්ට කැමති උණා.

ඉතින් මේ ඇත්තා කද කරට අරගෙන යන ගමන් තනියම කල්පනා කළා. "දැන් මේ කද මෙහුළුන් දුන්නාම-

මට තුට්ටු හතරක් හම්බ වෙනවා. මම මේ තුට්ටු හතර දීලා පුංචි කිකිලියක් ගන්නවා—මේ කිකිලි ගෙදර ගෙනු-ණුත් ලොකු උණාම කිකිලි බිජු ලන්ට පටන් ගන්නවා. කිකිලි බිජු දොළහක් ලැවාම මම ඒවා රකින්ට තියලා පැටවුන් දොළොස් දෙනාකු ඇති කර ගන්නවා—ඊට පස්සෙ මම ඒ පැටවුන් එකා පණම් හතර ගානෙ විකුණනවා. ඊට පස්සෙ මම මේ ඔක්කොම මුදල් දීලා එළු දෙනාක යි එළුවකු යි ගන්නවා.

මේ එළු දෙන පැටවුන් ගහන්ට උණාම මම ඒ එළුවන් එකා රුපියල් පහ ගාණෙ විකුණනවා. මෙහෙම ගිහින් රුපියල් දහයක් අතට ආවාම මම ඒ රුපියල් දහය ම දීලා මී වැස්සියක් ගන්නවා. ඉතින් මගෙ මේ මී වැස්සි ලොකු උණාම පැටියකු වදනවා—එතකොට පැටියාගෙ අතකර වැල් ලන්ටත්[1] හා පුරා කියලා කිරි දෙවින්ටත් හොඳ වෙලාවක් ඕනෑ කරනවා. එතකොට මට නැකැත් රාළ හොයාගෙන යන්ට වෙනවා.

ඉතින් ඔන්න මං ගිහිං නැකැත් රාළ හම්බවෙලා හොඳ නැකතකුත් අහගෙන කිරි දෙවින්ට එනවා මුගයත්[2] අතින් අරගෙන. ඇවිදින් බුරුල්ලට අත තියන කොට ම මී දෙන බය වෙලා මට පයින් ගහනවා'' කියලා. මෙහෙ-මට හිතන ගමන් ම මීදෙනාගෙ පයින් පාරෙන් වළකින්ට මිනිහා එක පාරට ම අහකට පැන්නා.

මේවෙලෙ මේ ඇන්නා තෙල් කළත් කරේ තියාගෙන යමින් හිටියෙ ඒ දණ්ඩක් උඩිනුයි. ඒ දණ්ඩෙන් මැද හරියෙ යි. ඉතින් මිනිහා අහකට පැන්න ගමන ඒ දණ්ඩෙන් මෑත්වෙලා තෙල් කළත් එක්කම ඇළට වැටුණා. තෙල් කළ දෙක ම බිඳිලා තෙල් ඔක්කොම අහක ගියා.

---

1 කරේ පෙළුවූ පරට වැලක් ලනවා 2 කොල් කැටය, කෝපිසිය



එතෙන්දි තෙල් කළ අයිති ඇන්නා ඇහුවා "ඇයි බොලේ මෙච්චර මේ තැනක් ඇවිදින් මේ තෙල් කළ දෙක මෙතන අත ඇරලා බිඳින්ට උඹෙහෙට යකා වැහුණෙ ද?" කියලා.

එතකොට කද ගෙනා ඇන්නා කිව්වා තමා හිතූ හිතු-විල්ල. "මට මේ කද ගෙනා යන මහන්සියට තුට්ටු හතරක් ලැබෙනවා, ඉතින් මං ඒ තුට්ටු හතරෙන් මෙච්චර මෙච්චර දේ කරනවා කියලා හිතුවා" කියලා තමන් හිතූ දේ ඔක්කොම විස්තර කර කීවා.

ඒ ගමන තෙල් ගෙනා ඇන්නා හිතුවා "වැඩේ වැරදුණාට මන්ද මේ එක්කෙනා හොඳට දියුණු වෙන්ට හිතන මනුසයෙක්. ඒක නින්ද කොයි එකටත් මෙයා අපේ ගෙදර කැටුව ගියොත් හොඳා" කියලා.

එහෙම හිතලා කද ගෙනා ඇන්නාට කීවා "බොලේ දැන් ඉතින් වෙච්ච දේට කරන්ට දෙයක් නැ. ඒත් උඹ්ගෙ නම් මාත් එක්ක අපේ ගෙදර යන්ට එන්ට ඕනැ" කියලා.

ඉතින් අනික් මිනිහත් හා හොඳයි කියලා එයත් කැටුව ගෙදර ගියා. අර මිනිහත් මෙයා ගෙදර කැටුව ගිහින් හොඳ දියුණුවෙන මිනිහා කෙනෙක් කියා ගෙදර ගිටිය දුව දීලා බෑණා කර ගත්තා. ඉතින් ඒ බෑණත් කලබලයක් නැතුව වැඩක්පලක් බලාගෙන හොඳින් හිටියා.

මේ සන්දියෙ ම ගමේ අනික් මිනිස්සු බඩු හුවමාරුවට පුත්තලමේ යන්ට හැරුණා. කරත්තවල නොයෙකුත් බෝග ජාති පටවා ගෙන ගිහින් ඒවාට ලුණු කරවල වගේ

වෙනත් ජාති හුවමාරු කර ගෙන එන්ට යි මේ මිනිස්සු පුත්තලම් යන්නෙ.

ඉතින් ඔන්න මේ රාළත් හිතුවා තමන්ගෙ මේ දියුණු වෙන්ට හිතන අලුත් බෑණාවත් මේ මිනිස්සුත් එක්ක පුත්තලම් ගිහින් එන්ට ඇරියොත් හොඳයි කියලා. එහෙම හිතාන ගෙදර ඇඹුණු කරත්තය පිළිරත්ට බෝග ජාති පෙතම පටවා දීලා කිව්වා "ඔන්න බෑණෝ බඩු සූදානම්. ඔය අනික් ඇත්තො කරන හැටියට මැණලා දෙන බඩුවක් එහෙම දෙනවා. නිකම් දෙන බඩුවක් එහෙම දෙනවා; හොඳයි ඉතින් මේ අනික් කාණ්ඩෙත් එක්ක ගිහින් එනවා" කියලා.

ඔන්න ඉතින් කාණ්ඩෙ එක්ක ම ගමෙන් පිටවෙලා ගියා. ගිහින් අර අනික් මිනිස්සු ගම්වලදී තමන් අරගෙන ගිය බඩු දීලා තම තමන්ට ඕනෑ කරන වෙන වෙන බඩු මාරුකර ඇරගත්තා. ඉතින් මේ මිනිහත් අනික් මිනිස්සු මැණලා දෙන බඩු බලලා ඒවා ගැණ ගැණ දුන්නා. නො-ගැණ දෙන බඩු බලා ඉඳලා ඒවා නොගැණ නිකම් දුන්නා හැබැයි කීයි ම බඩුවකට මුදල්වත් බඩුවක්වත් ආපහු ඇර ගත්තෙ නැ. ඇයි, මාමණ්ඩි කිව්වෙ නිකං දෙන්නෙඩ කියා නේ. ඉතින් මේ මිනිහා මෙහෙමට බඩු දීලා දීලා අන්තිමට හිස් කරත්තය යි ගොන් බාන යි විතර යි ඉතුරු වුණේ.

මේ කාණ්ඩෙට ගිය අනික් මිනිස්සු ගිහින් බඩු දීලා ගත්ත ලාබ මුදල්වලින් එක එක මිනිහා හොඳ දෙමුහුන් ගොනුන් එකා දෙන්නා ඇර ගත්තා. මේ මිනිහාට දෙන්ට වෙන දෙයක් නැ. අර කරත්තෙ යි ගොන් බාන යි දීලා දෙමුහුන් ගොනාකු ගත්තා.



ඔන්න ඉතින් ආපහු එන ගමනෙ එක තැනකදී අනික් මිනිස්සු තමන්ගෙ බඩු දීලා එක එක එළුවා ඇරගත්තා. මේ මිනිහට දෙන්ට දෙයක් නැ. අර දෙමුහුන් ගොන් නාම්බා දීලා එළුවකු ඇරගත්තා.

ආයෙත් තැනකදී කාණ්ඩෙ ගිය මිනිස්සු බඩු දීලා හොඳ ජාති බල්ලන් එක එකා ඇරගත්තා—මේ මිනිහා අර එළුවා දීලා ජාති බල්ලකු ඇරගත්තා.

ආයෙ තවත් තැනකදී හොඳ කළගෙඩි වගයක් දැකලා අනික් මිනිස්සු බඩු දීලා එක එක කළගෙඩිය ඇරගත්තා. ඉතින් මේ මිනිහත් අර ජාති බල්ලා දීලා කළගෙඩියක් ඇරගත්තා.

ඉතින් ඔහොම ඇවිත් ගම කිට්ටුවට ආවාම අනික් මිනිස්සු පණික්කියකු ළඟට ගිහින් අට්ටු හතර හතර දීලා තම තමන්ගෙ රැවුල් කප්පවා ගත්තා. ඒත් මේ ඇත්තාට අට්ටු හතරක් නැ, අර කළගෙඩිය පණික්කියාට දීලා රැවුල කප්පවා ගත්තා.

අන්තිමට අර හොඳ දියුණුවට යන්ට හිතන අලුත් බෑණා ඇන්න ගිය ගොන් බානවත් කරත්තයවත් බඩුවත් මොකුත් ම නැතුව හිස් අතින් ගෙදර ආවා.

# මී පැටික්කි

ඔන්න එකමත් එක රටක රජ කෙනෙකුයි බිසෝ කෙනෙකුයි හිටියා. මේ දෙන්නාට දූ කුමාරියකුත් හිටියා.

ඉතින් මේ රජ්ජුරුවොයි බිසොවයි වෙන රටක රාජ කුමාරයකුට පණිවිඩ ඇරියා තමන්ගෙ දූ කුමාරි කරකාර බන්දලා දෙන්ට එන්ට කියලා.

එතකොට අර අහින් රටේ කුමාරයා තමන්ගෙපිරිවරත් එක්ක මේ රටට ආවා රාජකුමාරිය කරකාර බැඳගෙන යන්ට. ඒ ආවාම මේ රාජ කුමාරයාට යි සේනාවට යි මඟුල් බතක් ඇරියා.

ඉතින් කුමාරයා කීවා "බත් කන්ට කුමාරිටත් එන්ට කතා කරන්ට" කියලා. ඒ ගමන කුමාරිගෙ මව් බිසොව කීවා කුමාරි ගෙයි ඇතුළෙදී බත් කනවා" කියලා.

බත් කාලා ඉවර වෙලා කුමාරයා කීවා කමා ගෙනා සළුත් ආබරණත් පළඳවන්ට කුමාරියට එන්ට කියලා. එතකොට කුමාරිගෙ මව් බිසොව කීවා කුමාරි ගෙයිදී සළු පැළඳ ගන්නවා කියලා.

ඊටත් පස්සෙ රාජ කුමාරයා කීවා "අපත් සැවුව අපේ රටට පිටත්වෙලා යන්ට කුමාරියට එන්ට" කියලා.

එතකොට කුමාරිගෙ මව් බිසොව ඒ කුමාරයාගෙ පිරිසෙන් දෙන්නෙකුට කතා කරලා මී පැටික්කියක් අල්-ලලා හඳුන් කරඬුවක දමලා ඒ දෙන්නාට බාරදීලා කීවා හත් දවසක් යනකල් මේ කරඬුවෙ පියන්පත අරින්ට එපා, ඊට පස්සෙ අරින්ට කියලා.



ඉතින් ඒ රාජකුමාරයා සේනාවත් ඒ හඳුන් කරඬුවත් අර ගෙන තමන්ගෙ රටට ගිහින් හත් දවසකට පස්සෙ හඳුන් කරඬුවෙ පියන්පත ඇරියා. එතකොටමත් එතන ඉඳලා එක මී පැටික්කියක් එළියට පැනලා වළංදරට දුවලා ගිහින් වළං අස්සෙ හැංගුණා.

මේ කුමාරයාගෙ මාලිගාවෙ හිටියා එක කෙල්ලක්. මේ කෙල්ල කෑම උයා කුමාරයාට බෙදු දීලා වළං වහලා තියලා එළියට ගියා. ඊට පස්සෙ මී පැටික්කි ඇවිදින් බතුයි මාලුයි කාලා වළං වහලා තියලා ආයෙත් වළං මුල්ලට ම ගියා.

පහුවදත් ඒ විදියට ම කටයුතු කෙරුණා. ඉතින් කුමාරයා කෙල්ල අතින් ඇහුවා මී පැටික්කි බතුයි මාලුයි කාලා තුබුණා ද කියා. කෙල්ල කීවා කාලා තුබුණා කියලා. කුමාරයා කීවා එහෙනං උඹත් ගිහින් කාපන් කියලා.

ඔන්න ඊට පස්සෙ දවසක් කුමාරයා කෙල්ලට කතා කරලා කීවා "මම අද ගොයම් කපන්ට කුඹුරට යනවා; උඹ උයන පිහන දේ වළංදරට කිට්ටුකර තියලා ගෙට වෙලා ගේ දොර බලාගෙන හිටපන්" කියලා.

කෙල්ලත් උයන පිහන දේ කුස්සියෙහි තියලා එළියට ගිහින් හිටියා.

ඒ ගමන මී පැටික්කි එළියට ඇවිත් කෑම උයලා කුමාරයාට ඇර තියලා වළංදරට ගිහින් හැංගිලා හිටියා.

කුමාරයා හැන්දෑවෙ කුඹුරෙ ඉඳලා ඇවිදින් බත් කාලා කෙල්ලට කීවා "උඹත් ගිහින් බත්කාලා මෙහාට ඇවිත් හිටපන්" කියලා.

කෙල්ලත් ගිහින් බත්කාලා එළියට ඇවිදින් හිටියා.

ඒ ගමන මී පැටික්කී එළියට ඇවිත් බත් බෙදාගෙන කාලා වළං වහලා තියලා ගිහින් අනික් මීයන් එකතු කරලා කීවා "අපි යමු කුඹුරෙ ගොයම් කපන්ට" කියලා.

ඊට පස්සෙ දස් ගානක් මීයන් එකතු කරගෙන කුඹුරට ගිහින් එක රෑට මුළු කුඹුරු යාය ම ගොයම් කපා ඉවර කරලා ගෙදර ඇවිත් වළංදරට රිංගාගෙන හිටියා.

පහුවදා කුමාරයා කුඹුරට ගොයම් කපන්ට ගිහින් බැලින්නම් ඔක්කොම ගොයම් කපා ඉවර කරලා.

ඒ ගමන කුමාරයා මිනිසුන් අඬගහගෙන ගිහින් කුඹුරෙ ගොයම ඔක්කොම එකතු කරලා කලවිටේ දාලා මී හරකුන් ගලතලා ගොයම් පාගවලා බැත හුළං කරලා වී මැණගෙන ගෙදර ගෙන ගියා.

ඉතින් එදා කුමාරයා ගෙදර ගිහින් කෙලින් ම ගියා වළංදරට. ගිහින් මී පැටික්කී හැංගිලා ඉන්න තැනට කිට්ටු කර කීවා "ඉන්න වී ගෙනාවා, ඒ වී අද කොටා පැහැලා බත් උයලා බත් මුලක් බැඳගෙන අපි යමු අම්මා අප්පච්චී දකින්ට. ගෙය් බත එහෙම ගෙනියන්ට ඕනෑ නේ!" කියලා.

එතකොට මී පැටික්කී වළං අස්සෙ ඉඳලා කීවා "මට බැහැ, මං යන්නෙ නැහැ" කියලා.

ඉතින් ඒ පාර කුමාරයා කෙල්ලට කතා කරලා කීවා වී කොටලා බත් උයලා බැඳලා දෙන්ට කියලා.

කෙල්ලත් වී කොටලා පැහැලා බත් උයලා මුලක් බැඳලා කුමාරයත් අතට දුන්නා.

ඉතින් කුමාරයා බත් මුලත් අරගෙන ගියා මී පැටික්කිගෙ අම්මා අප්පච්චී දකින්ට, ගිහින් බත් මුල දුන්නා.



ඒ වෙලේ මී පැටික්කිගෙ මව් පියව ඇහුවා ඇයි කුමාරි ආවෙ නැත්තෙ මොකද කියලා.

එතකොට කුමාරයා කීවා "කුමාරියන් මහන්ද මී පැටික්කිට තව මං කතා කළා එන්ට, ඒත් බැරිය කීවා" කියලා.

ඉතින් මී පැටික්කිගෙ මව් පියව කුමාරයට කීවා "හොඳයි දැන් නුවරට ගිහින් උයන පිහන දේවල් වළංදරට දීලා හිටවුවක හැංගිලා බලා ඉන්ට" කියලා.

කුමාරයත් ආපහු ගිහින් උයන දේවල් වළංදරට දෙන්ට කෙල්ලට කියලා පැත්තකට වෙලා හැංගිලා බලා හිටියා.

එතකොට මී පැටික්කී එළියට ඇවිදින් මී හැට්ටෙ ගළවලා පැත්තකින් තියලා හොඳ අපූරු ලස්සන කුමාරියක් වෙලා හොඳ ඇඳුම් ඇඳගෙන උයන්ට පටන්-ගත්තා.

මේක බලාගෙන හිටිය කුමාරයා හීන් සැරේ ගිහින් අර මී හැට්ටෙ අතට අරගෙන ලිපට දමාලා පිලිස්සුවා.

ඊට පස්සෙ අර කුමාරි උයලා පෙම් ඉවර වෙලා මී හැට්ටෙ ඇඳගන්ට ගිහිං බැලින්නම් ඒක තිබුණ තැන නෑ. ඒ ගමන සොයා ගෙන යන කොට දුටුවා ලිපේ තියෙනවා එක අතක් විතරක් ඉතුරු වෙලා. ඉතින් කුමාරි අඬන්ට පටන් ගත්තා, කුමාරි අඬ අඬා ඉන්න කොට කුමාරයා ඇවිදින් කතා කරලා කීවා "අඬන්ට, එපා මිට මී හැට්ටෙට පුළුස්සා දමන්ට අම්මා මට ඉගැන්නුවෙ" කියලා.

ඉතින් ඊට පස්සෙ මී පැටික්කිට ඒ වෙසෙ ගන්ටවත් වළංදරට රිංගා ගන්ටවත් පුළුවන් උණේ නැහැ. අර ලස්සන කුමාරිකා වෙසෙන් ම කුමාරයත් එක්ක හොඳින් කල් ඇර හිටියා.

# නගුල් මුන්නා

ඒක ගමක මිනිස්සු දෙන්නෙක් හිටියා-නගුල් මුන්නායි, මුංඇටගුරුවායි. මේ දෙන්නා ම වැඩක් පළක් නොකර නිකම්ම ම තමයි කාලෙ ගත කළේ. එක දවසක් නගුල් මුන්නාගෙ ගෙදර ඇත්තො කතා කරලා කිව්වා "මොකද වගේ ඉතින් හැමදාමත් මෙහෙම ඉඳලා හරියනවාද, කන්ට කෑම වැටෙනවාද අහසින්! මේ අනිත් මිනිස්සු කරන්නා වගේ හේනක්වත් වපුරා ගත්තාම නරකද?" කියලා.

එතනදී නගුල් මුන්නායි මුංඇටගුරුවායි දෙන්නා එක්ක කතා කර ගත්තා, ''හැමදාමත් මෙහෙම ඉඳලා බෑ තමයි අපි දෙන්නා එකට හේනක් වල් කොටමු'' කියලා. දෙන්නා එක්ක ගිහින් හේනක් වල් කොටලා ගිනි ලාලා හේන හදලා කුරහන් වපුරුවා. ඊට පස්සෙ හේනෙ පැලකුත් හදාගෙන දෙන්නා එක්ක ම පැල් රකින්ටත් ගියා. මේ දෙන්නා කන්නෙ මොනවත් පැලේ ම උයාගෙනයි. දෙතුන් දවසකට වරක් ගෙදර ඇවිත් උයා පිහා ගන්ට කුනපහේ ඇරගෙන යනවා.

මෙහෙම ඉන්න අතරෙ එක දවසක් දෙන්නා එක්ක පැලට වෙලා මැලේ මහත් කරගෙන දෙගොඩ හරියක් වෙනකල් කතා කර කර ඉඳලා නිදා ගත්තා උදේ අවදිවෙලා කළම්බා ගෙන්ට ගෙදර යන්ටත් ඕනෑ කියලා.



රෑත්තිරියෙ මේ දෙන්නා මෙහෙම නිදා ඉන්න අතරෙදී මුංඇටගුරුවාගෙ වස්තරේට මැලෙන් ගිනි ඇරගෙන පැලත් එක්ක දාගෙන යනකොට නගුල් මුන්නා ඇහැරිලා පැලෙන් පිටට පැන ගත්තා. මුංඇටගුරුවා ඒ ගින්නෙ ම දාලා මැරිලා ගියා. මුංඇටගුරුවා ගින්නෙන් පිළිස්සිලා මළ නිසා නගුල් මුන්නා ගමට යන්ට බයෙන් හේනෙන් නොනිට බැදී වැදුණා.

ගෙදරවල උදවියත් බලා හිටියා පැලට කළම්බා ගෙනයන්ට මේ දෙන්නා එනතෙක්. කල් පහු වෙලත් නාව නිසා ගෙවල ඇත්තො ගියා හේනට බලාගෙන එන්ට. ඒ ගිහිං බැලූ කොට හේනෙ පැල්පත දාලා අළු වෙලා—තියනවා දැකලා ඒ ගිය ඇත්තො කතා කළා "අනේ පැලට ගිනි ඇරගෙන නගුල් මුන්නායි, මුංඇටගුරුවායි දෙන්නාම දාලා අළුවෙලා ගිහින්" කියලා. ඒ ගිය ඇත්තො ආපහු ආවා.

බැදී වැදීලා හිටිය නගුල් මුන්නා ඊට පස්සෙන් ද ඉර බැහිලා ගෙවල උදවිය නිදාගත්තායින් පස්සෙ හෙමින් හෙමින් ගෙදරට ආවා. ඇවිත් දොරට ගහලා ගෙදර ඇත්තන්ට කතා කළා. එතකොට නගුල් මුන්නා මැරිලා ගියා කියලා හිතාගෙන හිටිය නගුල් මුන්නාගෙ ගෙදර ඇත්තො හිතුවා මේ දොරට ගහන්නෙ නගුල් මුන්නාගෙ මළ උපන් යකා තමයි කියලා හිතා ගෙන බය වෙලා කෑ ගහන්ට පටන් ගත්තා. ඒ සද්දෙට අහල පහල මිනිස්සු එළි ඇරගෙන දුවගෙන එනකොට නගුල් මුන්නා ලැහැබෙ දුවලා ගිහින් බැදී වැදුණා.

නගුල් මුන්නා ඊට පස්සෙ දෙදවසක් ම ඇවිත් "මම නගුල් මුන්නා, මා මළේ නෑ. දොර අරපන් යෝදිංගෙ"

කියලා ගෙදර ඇත්තන්ට කතා කළා. ඒත් ඈ හිතුවා මේ මළ උපන් යකා ම තමයි. මට මොකුත් කරයි කියලා බැර ඇරියෙ ම නෑ.

ඊට පස්සෙත් ද නගුල් මුන්නා බැද්දෙන් ඇවිත් ගමේ අහල වැව් අද්දර හැංගිලා හිටියා. එහෙම ඉන්නකොට කොහේ දෝ සංචාරියකට[1] ගිහින් එන යද්දෙස්සෙක්[2] බත් ටිකකුත් බැඳගෙන යක්කමට අඳින වෙස් ඇඳුමුත් පොඩිය බැඳලා කරේ තියාගෙන එතනින් යන්ට ආවා.

මේ මිනිහා එනු දුටුව නගුල් මුන්නා දුවගෙන ගිහින් ඒ මිනිහාට තළලා අර වෙස් පොට්ටනියත් බත් මුලත් උදුරා ගෙන බැද්දට වැදුණා. බැද්දට වැදිලා බත් ඩිංග ලිහාගෙන කාලා වෙස් පොඩිය ලිහලා බැලුවා—ඊට පස්සෙ ඒකෙ තුබුණ වෙස් ඇඳුම් අරං ඇඳගෙන ගිගිරි වළලු දාගෙන අම්බගෙන සිලම්බු[3] දෙපයෙ දම්මගෙන වෙස් මූණෙක් තිබුණා ඒකත් බැඳගෙන ආවා ගමට.

ගමට මෙහෙම ඇවිදින් එක ගෙයක් ළඟ බැඳලා උන්න වහු පැටියෙකුගෙ බෙල්ල අඹරවාලා කඩාදලා එත- නින් වෙලට පැනලා අර ගිගිරි වළලු සිලම්බු නාද කරලා හයියෙන් හූ හූනක් කියලා කෑ ගහලා ගමේ මිනිසුන්ට කීවා "මේ ගමේ ඇත්තො හැම ද ම උදේ හවස කොට- නුගේ අහල බත්ගොටුවකුත් කහපත්[4] හෙඩියකුත් ඔප්පු කර නොතිබ්බොත් මේ ගමේ එක ම හරකකුවත් තියා- ගන්ට දෙන්නෙ නෑ. උන් මරාගෙන ලේ බීලා යනවා" කියලා.

ගමේ මිනිස්සු මේ ගැන හොඳට ම බය වැදිලා එද පටන් හැම ද ම උදේ හවස බත් ගොටුවකුත් කහපත් හෙඩියකුත් ගිහින් පුද එන්ට පටන් ගත්තා.

1. කලුන් නැටුම, 2. යකැදුරෙක්, 3. පයේ දාන ගිගිරි වළලු, 4. කහ දියර



මෙහෙමට අවුරුදු හතරක් පහක් තිස්සෙ ගමේ මිනිස්සු මේ පිදවිල්ල කරගෙන ගියා. නගුල් මුන්නත් ඒවා කාලා තමන් ඉන්න වග තේරෙන්ට ඉදහිට කලබලයක් කරලා බැද්දට ම වෙලා හිටියා.

අවුරුදු හතරකට පහකට පස්සෙ ගමේ මිනිසුන්ටත් මේ කරදරේ කරන්ට බැරුව යකා අල්ලන්ට යද්දෙස්සකු කැඳෙව්වා.

ඉතින් මේ යද්දෙස්සත් කැලේට ගිහින් පිදේනි තටු මල් බුලත් තටු හදාගෙන ගොප් රීත් ඇඳගෙන පහන් පත්තු කරගෙන යකා අල්ලන්ට මන්තර මතුර මතුරා නූල් ජීවම් කරන කොට ඔන්න නගුල් මුන්නා අර ඇඳුමුත් ඇඳගෙන හූ කියාගෙන දුවගෙන ආවා. හිටිය මිනිස්සු බයේ පැනලා ගියාම නගුල් මුන්නා යද්දෙස්සා අල්ලලා දැත එකට ගැට ගහලා ගහක එල්ලලා ගියා.

ඒ ගමන ගමේ මිනිස්සු වැඩියත් බය වෙලා යකා එළවන්ට දස්ස මන්තර කාරයකු හොයන්ට උණා. මේ ගමන මිනිස්සු ගෙන්නුවා සන්නාසියකු. එද මේ සන්නා- සියත් කැලේට ගිහින් මල් බුලත් තටු තාටිය තදලා මතු- රාගෙන යනකොට සන්නාසියා දුටුවා යකා කොටහුගේ උඩට නැගගෙන හිටින වග. ඒ පාර සන්නාසියාට නැඟ ගිහිලා සන්නාසියා තුගේ මුලට ගිහින් මන්තරයක් කියලා යකාට බහින්ට කීවා. යකා බැස්සෙ නැහැ. ආයෙත් මැතු- රුවා ඒත් යකා බැස්සෙ නැහැ.

ඉතින් මේ මන්තරේටවත් යකා ගහෙන් බිමට නො බැස්ස නිසා සන්නාසියා හිතුවා මේ යකෙක් නෙමෙයි මිනි- හෙක්මය කියලා. ඒ ගමන සන්නාසියා හූ කියා අඬගැහු-

වාම ගමේ මිනිස්සු ඇවිත් වට වුණා. ඊට පස්සෙ යකා ගෙන් බස්සලා බලාපුවාම මේ නගුල් මුන්නා. මිනිස්සු නගුල් මුන්නා ගමට ඇරගෙන ගියා.

එතකොට ඔන්න පැමිණිලි පිට පැමිණිලි එන්ට පටන් ගත්තා.

මුංඇටගුරුවා ගිනි තියා මැරුවා කියා ගුරුවාගේ හැදෑයා නගුල් මුන්නාට විරුද්ධව පැමිණිල්ලක් කළා.

එතකොට තමන් රවටාගෙන අවුරුදු පහක් හයක් බත්ගොටු කෑවා කියා ගමේ මිනිස්සු තව පැමිණිල්ලක්.

වයිද්දෙකට ගිහින් එන අතර මඟ තමන්ට හිරිහැර කරලා වෙස් පෙට්ටිය උදුරාගෙන ගියා කියලා වෙදරාළගෙන් තව පැමිණිල්ලක්.

දෙරකඩ බැඳලා හිටිය තම්පත්ගෙ වහු පැටියාගෙ බෙල්ල කඩා දැමුවා කියලා වස්සා අයිතිකාරයාගෙන් තව පැමිණිල්ලක්.

තමන්ට හිරිහැර කරලා අල්ලා බැඳලා ගහක එල්ලුවා කියලා යකා අල්ලන්ට ආ මිනිහාගෙන් තවත් පැමිණිල්ලක්.

මේ ඔක්කොම පැමිණිලිත් එක්ක නගුල් මුන්නා ඇරගෙන ගියා රටේ රජ්ජුරුවන් ළඟට. රජ්ජුරුවො නගුල් මුන්නාගෙන් ඇහුවා ''ඈ නගුල් මුන්නා මේ ඔක්කොම පැමිණිලි ඇත්ත ද'' කියා.

එතකොට නගුල් මුන්නා රජ්ජුරුවන්ට වැඳ වැටිලා ඔක්කොම වෙච්ච සිද්ධිය විස්තර කළා. විස්තර කරලා කීවා ''දේවයන් වහන්ස, මේ ඔක්කොම චෝදනා ඇත්ත තමා.



ඒත් මේ එකක් වත් මගෙ වරදකින් සිද්ද වෙච්ච දේවල් නොවෙයි. නිකං ගෙදර හිටිය මට ඉන්න හැටියට ඉන්ට නොදී ගේන් කොටන්ට පිටත් කරපු අපේ ගෙදර ඇත්තන්ගෙ වැරැද්දෙන් මේ ඔක්කොම සිද්ද වුණේ. ඒක හන්ද දේවයන් වහන්ස, කරන දඬුවමක් අපේ ගෙදර ඇත්තන්ට කරන්ට'' කියලා.

ඉතින් රජ්ජුරුවොත් මේ ඔක්කොම සිද්ධිය අහලා මේක අත් වැරැද්දකින් සිද්ද වෙච්ච දෙයක් හැටියට සලකලා නගුල් මුන්නාට සමාව දුන්නා. ඒත් නගුල් මුන්නා ඊට පස්සෙ ගමට නම් ගියෙ නැ.

# සිගිරිස් සිංඤෝ

එකමත් එක රටක ලොකු මිනිහෙක් හිටියා සිගිරිස් කියලා. මේ මිනිහා ඇකි පැකි මිනිහෙක්. මිනිහා යටමත් වැඩ කරන මිනිස්සු දහදෙනෙක් හිටියා.

ඉතින් මේ සිගිරිස් බොහොම ජයට වැඩ කරගෙන ඕහොම ඉන්න අතරෙ එක දවසක් හිතුණා අරක්කු ටිකක් බොන්ට. ඕහොම ටික ටික අරක්කු බීලා මිනිහ පස්සෙ වැඩි වැඩියෙ බොන්ට පටන් ගත්තා. පස්සෙ පස්සෙ මිනිහා බීගෙන ඇවිදින් වැඩකාරයන්ට ගුටි බැට දෙන්ට පටන් ගත්තා. වැඩකාරයන්ට හරියට පඩිනඩි දුන්නෙත් නෑ. සිගිරිස් වැඩකාරයන්ට මෙහෙමට හිරිහැර කරගෙන යන අතරෙ එක දවසක් වැඩකාරයො කතාකර ගත්තා සිගිරිස්ට ගහන්ට. කතාකරගෙන එක දවසක් බිත්තොම ටික චට්ටෙලා සිගිරිස්ට හොඳටම තැළුවා. තළලා තමන්ට එන්ට තියන මුදල්වලටත් එක්ක හරියන්ට ගෙදර තුබුණ දේත් අත පත ගාගෙන යන්ට ගියා.

ඉතින් ඊට පස්සෙ සිගිරිස්ට අරක්කු බොන්ට සල්ලි නැතුව ගෙදර තියන සිඩුමුට්ටුයි, ඉඩකඩමුයි විකුණ විකුණ අරක්කු බොන්ට පටන් ගත්තා. කලක් තිස්සේ ඕහොමට කරගෙන යනකොට සිගිරිස්ගෙ දේපොළත් ගෙදරත් ඔක්කොම රටන්ට අයිති වුණා. සිගිරිස් පිස්සකු වගේ අතන මෙතන ඇවිදින්ට උණා.



එක දවසක් සිගිරිස් කන්ට මොකුත් ම හොයා ගන්ට බැරුව සුදුහගින්දරේ පාරක යන කොට හම්බ උණා කුරුම්බා ගෙඩියක් අරගෙන මඟ යන මිනිහෙක්. සිගිරිස් ඒ මිනිහට පිං කියලා කුරුම්බා ගෙඩිය ඉල්ලාගෙන ළඟ තුබුණ අම්බලමකට ගිහින් ඉඳ ගෙන අර කුරුම්බා ගෙඩිය බිඳගෙන කන්ට පටන් ගත්තා.

සිගිරිස් වැවර ගෙඩිය කනකොට එතෙන්ට එනවු උණා මැස්සො ගොඩක්. එතකොට සිගිරිස් අතින් ගහලා ගම්මැස්සන් විසි දෙනෙකු පමණ මැරුවා. ඒ ගමන සිගිරිස් ගියා බෙලෙක් වැඩ කරන මිනිහෙකු ළඟට. ගිහින් කීවා.

''අයේ යල්වා මට එක පුංචි උපකාරයක් කරන්ට'' කියලා.

බෙලෙක් වැඩකාරයා ''මොකක් ද?'' කියලා ඇහුවාම සිගිරිස් කීවා.

''මට මේ බෙලෙක් තහඩුවක සිංහල අකුරෙනුයි දෙමළ අකුරෙනුයි කපලා දෙන්ට 'විසිදෙනෙකු මැරූ යෝධයා' කියලා,'' සිගිරිස් කීවා.

ඉතින් බෙලෙක් වැඩ කාරයත් හා හොඳයි කියල තහඩුවක කපලා දුන්නා ''විසිදෙනෙකු මැරූ යෝධයා'' කියලා.

ඊට පස්සෙ සිගිරිස් මේ තහඩුවත් පිටේ එල්ලාගෙන රට රටවල ඇවිදින්ට උණා. ඉතින් ඕහොම ඇවිදගෙන යන කොට එක නුවරකදී දෙමළ මිනිස්සු ටිකයක් මේ තහඩුව පිටේ එල්ලාගෙන යන මිනිහා දුටුවා. මඟ දෙපැත්තෙ මිනිස්සු කවුරුත් මේ මිනිහාට බයේ ඇත් මැත් වුණා.

ඉතින් මේ දෙමළ මිනිස්සු සිගිරිස් ළඟට ඇවිත් කතා කරලා කීවා ''අපේ රටේ රජ්ජුරුවන් ළඟ බොහොම

ලොකු යෝධයෙක් ඉන්නවා. අපේ රටේ රජ්ජුරුවො අණ බෙරයක් ප්‍රසිද්ධ කරලත් තියනවා කවුරු හරි යෝධයෙක් රජ්ජුරුවන්ගෙ යෝධයත් එක්ක සටන් කරලා දිනුවොත් මසුරන් පන්සීයක් දෙනවා කියලා. පුළුවන් නම් ගිහින් ඒ යෝධයත් එක්ක සටන් කරලා පරදවන්ට'' කියලා.

ඒ ගමන සිගිරිස් කල්පනා කළා ''ඕකැ මහගයක් වැදිච්ච දෙතා'' කියලා. හිතලා අර දෙමළ මිනිසුන්ට කිව්වා ''හා හොඳයි යමු අපි ඒ යෝධයත් එක්ක සටන් කරන්ට'' කියලා. ඉතින් දෙමළ මිනිස්සුන් සිගිරිස් එක්ක ගියා ඒ මිනිස්සුන්ගෙ රටේ රජ්ජුරුවන් ළඟට.

ඉතින් ඒ රටේ රජ්ජුරුවො සිගිරිස්ගෙන් ඇහුවා ''ආ යෝධයා, උඹට අපේ මේ දෙමළ යෝධයත් එක්ක සටන් කරන්ට පුළුවන් ද'' කියලා. එතකොට සිගිරිස් කිව්වා;

''මොනවද රජ්ජුරුවන් වහන්ස, විසිදෙනෙකු මරාපු මේ පුතයාට ඕකත් මහ කජ්ජක්ද?'' කියලා.

ඉතින් ඒ රජ්ජුරුවො දෙමළ යෝධයාගෙන් ඇහුවා ''කොයි විදියට ද මේ යෝධයත් එක්ක සටන් කරන්නෙ?'' කියලා.

එතකොට දෙමළ යෝධයා කිව්වා ''රජ්ජුරුවන් වහන්ස ඉස්සර වෙලා මේ යෝධයාගෙ හයිය බලන්ට මාත් එක්ක බට්ටිවට මූදෙ පීනනවා නම් හොඳය'' කියලා.

ඉතින් සිගිරිස් කිව්වා ''හා හොඳයි මං කැමතියි, පීනන්ට ඕනෑ කරන දේවල් රජ්ජුරුවන්ගෙන් ලබාගන්ට'' කියලා.

දෙමළ යෝධයා රජ්ජුරුවන්ගෙන් මසුරන් දහයක් ඉල්ලා ගත්තා වුවමනා කරන දේවල් මිලේට ගන්ට.



ඉල්ලාගෙන සිගිරිසුත් එක්කම සල්පිලට ගිහින් කන බොන දේවල් ඇරගත්තා.

බඩු ඇරගෙන ඉවර උණාම සිගිරිස් ඇහුවා මොකටද මේ බඩු ගත්තෙ කියලා. ඒ පාර දෙමළ යෝධයා කිව්වා;

''අපි පීනන්ට පටන්ගත්තාම අට දවසක් නොනැවතී පීනන්ට ඕනෑ. ඒ නිසා අට දවසකට සෑහෙන්ට බඩුයි මා ගත්තෙ කියලා.

එතකොට සිගිරිස් කිව්වා, ''මේ බඩු ඇමිත්ත මොනවා කරන්ට ද? මට එක වේලකට සෑමට හාල් හුණ්ඩු හයක් ඕනෑ. අරක්කු බෝතල් තුනකුත් ඕනෑ. මං පීනන්ට උණාම මාස අටක් දහයක් දිගටම පීනනවා කියලා''.

එතකොට දෙමළ යෝධය කල්පනා කළා. ''මේ මිනිහත් එක්ක බට්ටුවට පීනන්ට ගියොත් මා පරදින්ට පුළුවනි. මට මේ මිනිහට විතර කන්ටත් බැ. මේ මිනිහට විතර අරක්කු බොන්ටත් බැ; මාස අටක් දහයක් පීනන්ටත් බැ කියලා.'' එහෙම හිතලා ඒ වග රජ්ජුරුවන්ට ගිහින් කිව්වා.

ඉතින් රජ්ජුරුවො කිව්වා ''එහෙම නං උඹ ඒ පීනීමෙන් පරාදවෙයි නේ'' කියලා.

එතකොට දෙමළ යෝධයා කිව්වා ''ඔව් රජ්ජුරුවන් වහන්ස පීනීමෙන් මා පරාදවෙන්ට පුළුවනි. ඒ නිසා අපි දෙන්නා එකට පොර අල්ලන්ට ඕනැ''ය එකියලා.

රජ්ජුරුවොත් එහෙනං ඒක හොඳයි කියලා සිගිරිස්-ගෙන් ඇහුවා ''උඹට බැරිද අපේ යෝධයත් එක්ක බට්ටුවට පොර අල්ලන්ට'' කියලා.

ඉතින් සිගිරිස් කිව්වා ''ආ ඕක මොකක් ද රජ්ජුරුවන් වහන්ස, මං දන්නෙ එක පාරයි නේ'' කියලා.

රජ්ජුරුවො කීවා "හොඳයි එහෙම නම් හෙට මාලිගා-වේදී දෙන්නා එක්ක පොර අල්ලන්ට හොඳයි" කියලා.

එතකොට සිගිරිස් යෝදයා කීවා "හෙට නොවෙයි රජ්ජුරුවන් වහන්ස, අද සිට මාසයක් අපි දෙන්නා එක ගෙයි කාමර දෙකකට දමලා රජ්ජුරුවන් වහන්සෙ අපට හොඳට කෑම බීම දෙන්ට ඕනැ. මාසෙ ඉවර උණාම අපි දෙන්නා හොඳ අපූරු පොරයක් අල්ලලා පෙන්නන්නම්" කියලා.

ඉතින් රජ්ජුරුවොත් මේ යෝජනාවට එකඟ වෙලා යෝදයින් දෙන්නා එක එක යාබද කාමර දෙකකට දමලා හොඳට කන්ට දුන්නා. මේ අතරෙ සිගිරිස් යෝදයා යකඩ ඇණයක් හොයාගෙන කාමර දෙකට අතරෙ තිබුණ බිත්තිය ටිකෙන් ටික හාරන්ට පටන් ගත්තා. මාසෙ ඉවර වෙන්ට කිට්ටු වෙනකොට බිත්තිය අනිත් පැත්තට පසා-වෙන්ට ලං වෙලා තිබුණා. මාසෙ ඉවර වෙන්ට ඔන්න මෙන්න කියා ලං වෙලා තියනකොට දවසක් සිගිරිස් දෙමළ යෝදයාට කතා කරලා කීවා.

"එවේ, යෝදයා, අනේ කියනවා නං මට දුංකොළ ටිකක් දියන්" කියලා.

දෙමළ යෝදයා එතකොට කීවා "ඕං කොහොම ද දුංකොළ ඔහාට දෙන්නෙ" කියලා.

ඉතින් සිගිරිස් කීවා "ඔය බිත්තියට ඇනපන්කො අනිත් පාරක්. එතකොට හිලක් හැදෙන්නෙ නැතැයි" කියලා.

දෙමළ යෝදයා කීවා "ඒක කරන්ට පුළුවන් වැඩක් නෙමෙයි" කියලා.



එතකොට ම සිගිරිස් "එහෙමින් බැරිනම් මොකක්ද අඩෝ උනේ යෝදකම, මෙන්න මෙතනින් දියන් ඔය දුංකොළ ටික" කියලා අර හාරල තිබුණ බිත්තියෙ ඉතුරු ටිකට මිටෙන් එකක් ඇන්නා.

එතකොටමින් බිත්තිය කඩාගෙන සිගිරිස්ගෙ අත බිත්තියෙන් අනිත් පැත්තට ගියා. මේකට දෙමළ යෝදයා හොඳට ම බය වෙලා කල්පනා කළා "මේ මිනිහත් එක්ක පොර අල්ලලා නම් මට ජයග් ගන්ට ලැබෙන්නෙ නෑ" කියලා. එව්වර නෙමෙයි "මේ මිනිහා අල්ලලා මිරිකලා මරයි නේ" කියලත් හිතුණා.

ඔන්න ඊට පසුව ද රජ්ජුරුවො යෝදයන් දෙන්නා ම එළියට අරගෙන පොර පිටිය සූදානම් කළා. යෝද පොරය ආරම්භ උණාම එකත් පිටිය ජනයාවෙන් පිරෙන්ට උණා, දැන් සිගිරිස්ගෙ හිතේ "කොහොමද මේකෙන් බේරිල පැනල යන්නෙ" කියන එකයි, දෙමළ යෝදයා-ගෙත් හිතේ "මේ මිනිහත් එක්ක නම් මට පොර අල්ලන්ට බෑ. අද මගෙ අන්තිම දවස කොහොමද මෙතැ-නින් බේරිලා දුවගන්නෙ" කියන එකයි.

රජ්ජුරුවොත් දෙන්නාටම කතා කරලා "හා ඉතින් පොරේ පටන් ගනිල්ලා" කියලා අණ කළා.

ඒ පාර හා හොඳයි කියලා මේ දෙන්නත් "හා උඹ ගහපන් ඉස්සර වෙලා" කිය කියා පාරම් බෑවා මිසක් එක්කෙනෙක්වත් ගහන්ට ඉස්සරහට ආවෙ නෑ.

එතකොට රජ්ජුරුවො සිගිරිස් යෝදයාට කතා කරලා කීවා "හා, උඹ ගහපන් ඉස්සර වෙලා" කියලා.

ඒ පාර සිගිරිස් යෝදයත් හා "හොඳයි" කියලා එක පාරට ම පැනල දුවන්ට ගිහාගෙන වට වෙලා පිටිය

සේනාව දිහා බලලා හයියෙන් කෑගහලා කිව්වා, "ඔය හිටිය සතුරුත් ඔකතින් ඉවතැරලා දෙපැත්තට වෙලා හිටිනාවා" කියලා. දුවන්ට වට පිට බලන කොටමත් එච්චරවෙලා දුවගන්ට අකස් නැතුව හිටිය දෙමළ යෝදයා මිනිසුනුත් පෙරලාගෙන දුවන්ට පටන් ගත්තා. වටවෙලා හිටිය මිනිස්සුත් දෙමළ යෝදයාට හූ කියන්ට වුණා.

ඊට පස්සෙ රජ්ජුරුවො සීගිරියේ යෝදයා ගැන බොහොම පැහැදිලා පොරොන්දුවට හැටියට මසුරන් පන්සියයේ හැත්ගත් දීලා ඒ රජ්ජුරුවන්ගෙ ඇමති නිලමෙ කමකුත් පවරලා දුන්නා.

නිමි.

PDF document conversion done by
Hasitha Madhawa Gajadeeraarachchi

(webmaster of **http://hasitha.zapto.org**)
Email: **hasithaga@yahoo.com**